
# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

ශ්‍රී බුද්ධ වර්ෂ 2557 58 බක් මස 03 වන සිකු දින

2015 අප්‍රේල් මස 03 වැනි සිකුරාදා



නොමිලේ පිරිනමන දහම් පඬුරකි

විකිණීම සඳහා නොවේ



# අධි පොහොයක් එන්නේ ඇයි?

සාමාන්‍යයෙන් අවුරුදු කිහිපයකට වරක් අධි පොහොය දිනයක් යෙදෙනවා. ඇයි මේ අධි පොහොය කියලා කියන්නේ? සාමාන්‍යයෙන් මෙහිදී "අධි" කියන වචනය භාවිත වන්නේ "වැඩි" කියන අර්ථය සඳහාය. අවුරුද්දකට පවතින මාස දොළහේ පුර පසළොස්වක පොහොය දින දොළහක් යෙදෙනවා. ඇතැම් අවුරුදුවලදී පුර පසළොස්වක පොහොය දහතුනක් පමණ යෙදෙනවා. මේ අයුරින් අවුරුද්දකට පුර පසළොස්වක පොහොය යෙදෙන වර්ෂවලට ඉන් එක පොහොයක් "අධි පොහොය" ලෙසින් වැඩි පොහොය හැටියට සඳහන් කෙරෙනවා.

ඒ පොහොය දිනයට පොහොයේ තියෙන විශේෂ වැදගත්කමක් නැහැ. මේ විදිහට එක පොහොය දිනයක් ඉවත් කරන්නේ දහතුන නපුරු යැයි කියන සංකල්පය අනුව නොවෙයි. අප පුරුදු වෙලා ඉන්නේ අවුරුද්දකට පුර පසළොස්වක පොහොය දොළහකට වීම නිසයි.

සත්‍ය වශයෙන්ම මේ අයුරින් වැඩි පොහොයක් එන්නේ ඇයි කියලා විමසා බැලිය යුතුයි. එසේ පොහොය වැඩිවීමට මූලික වශයෙන්ම බලපෑම ලබන්නේ අප භාවිත කරනු ලබන ලෝකය පිළිගත් දනට පවතින දින දර්ශනය අනුවයි. දින දර්ශනයේ මාස සටහන් වන්නේ එකම ආකාරයකට නොවෙයි. එක එක ආකාරයෙන්. නිදසුනක් ලෙස සැලකුවොත් ජනවාරි මාසය එක් ආකාරයකටත්, පෙබරවාරි මාසය තවත් ආකාරයකටයි. ඇතැම් මාසවලට දින තිස් එකයි. ඇතැම් මාස දින තිහයි. ඇතැම් මාස දින විසිඅටයි.

සමහර අවුරුදුවලට දින විසි අටේ මාසය දින විසිනවය දක්වා වැඩිවෙනවා. ඒ අනුව අපට පෙනෙන්නේ මේ දින දර්ශනයේ මාස ක්‍රමය අපිළිවෙළ වූ පිළිවෙළකට සකස් වී ඇති බවයි. නමුත් ලෝකය පිළිගන්න ක්‍රමය එය නිසා අපට ඉන් බැහැර වෙන්න බැහැ.

දින දර්ශනයේ පිළිවෙළ ඒ ආකාරයට වුණත් ස්වභාවධර්මයේ පිළිවෙළ ඊට වඩා වෙනස්. භාවිතිකව සකස් කළ වර්තමානයේ අප භාවිත කරන දින දර්ශනය සහ ස්වභාවධර්මය අතර පැටලීමක් පවතිනවා. ඒ පැටලීම අප දකින්නේ අවුරුදු ගණනකට වරක් අධි පොහොයක් ලැබීමෙන්.

ස්වභාවධර්ම නීතිය කියලා කිව්වේ විශ්වයේ ග්‍රහ තරුවල පවතින්නා වූ විද්‍යාවයි. හඳ පායන්නේ සහ හඳ බැස යන්නේ ස්වභාවධර්ම විද්‍යාවට අනුවයි. හඳක් පිරෙන්න යන දින ගණන හැමදාම එකයි. දින තිහකට වතාවක් සිංහල ක්‍රමය අනුව පුර පසළොස්වක පොහොය උදාවෙයි. හඳේ රටාව වුණත් පවතින්නේ එක පිළිවෙළකටයි.

අමාවක, පුර අටවක, පසළොස්වක, අව අටවක ආදී වශයෙන්, හැම වර්ෂයකටම සිදුවීම සඳහා යොදවන්නේ දින තිහයි. මේ නියමයන් නැහැ. පායයි ස්වභාව දහමේ විධිය කියලා කිව්වේ. එහෙම උදාවන පසළොස්වක පොහොය දින ගණන නිවැරදි විදිහට අපිළිවෙළ වූ දින දර්ශනයක සටහන් කරන්නේ කොහොමද? හඳ පායන එක කාටවත් වළක්වන්න බැහැ. ඒ ස්වභාවධර්මය අනුව සිදුවන ක්‍රියාවක්. පුර හඳ අහසේ පායන්නේ පොහොයට. හඳ අහසේ පායා වූ දට අද පොහොය නැහැයි කාටවත් කියන්න බැහැ. කිසිවෙක් කවුරුවත් ඒක පිළිගන්නෙත් නැහැ. ඒ නිසාම තමයි මේ අභිරහස සිද්ධ වෙන්නේ. දින තිහකට වරක් උදාවන පොහොය දින තිස් එකේ මාසවලින් ගණන් කරන්න යාමෙන් සිද්ධ වෙන අභිරහස වැඩි පොහොයක් හැටියට පරෙනා දක්වන්නේ ඒ අනුවයි. අවුරුදු ගණනකට වරක් වැඩි පොහොය කියලා කිව්වට එය ස්වභාවධර්මයට අනුව වැඩි පොහොයක් නොවෙයි. නමුත් අපි භාවිත කරන දින දර්ශනයේ තිබෙන ප්‍රශ්නය නිසා දින දර්ශනයට අධි පොහොය.

මේ අනුව අපට පැහැදිලි වෙනවා අධි පොහොය කොහොමද වැඩි පොහොය උදාවන්නේ කොහොමද කියලා. ස්වභාවධර්ම විධිය ගලායන යන්නේ නිවැරදි පිළිවෙළකට. හඳ අහසේ පිරෙන කාලයට මහ මුහුදේ ජලය පවා වෙනස් ස්වභාවයක් ගන්නවා. හඳ බැස යන කාලයට ඒ ජලය නැවත වෙනස් වෙනවා. හඳ පිරෙන කාලයට ඇතැම් මිනිසුන්ගේ මානසික තත්ත්වයේ පවා වෙනස්කම් ඇතිවෙනවා. මානසික රෝගී තත්ත්වය වැඩිවෙන්න පටන් ගන්නවා. ඒ අනුව පැහැදිලි වෙන කාරණයක් තමයි හඳත් සමග පරිසරය තුළ පවතින සියලු සත්ත්වයින්ගේ වෙනස්කම් ඇතිවෙනවා කියන කාරණය. ඒ සිද්ධි දාමය ඒ හා සාපේක්ෂව භාවිත දින දර්ශනය අනුව සිදුවෙන්නේ නැහැ. නමුත් ලොවම එය පිළිගන්න නිසා අපටත් එය බැහැර කර හරින්න බැහැ.

මහාචාර්ය පාතේගම ඤාණිස්සර හිමි

"මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසංසිඳෙත්, අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."

සිතා හිම කළ නොහැකි, සිත ගැන විවිධ විචාරකයෝ නොයෙක් අදහස් සිත ගැන කියා ඇත. ඒවායින් අදහස් කිහිපයක් ඔබට ඉදිරිපත් කරමි.

1. වේගයෙන් ධාවනය වන සිත මෝඩයාගේ සිතය.
2. සන්සුන් සිත සාන්තුවරයාගේ සිතය.
3. නිශ්චල සිත දෙවියන්ගේ සිතය.
4. සියලු ලෙඩවලට මුල සිතය.
5. නිරෝගීව තිබෙන සිත රෝගී වන්නේ බාහිර හේතු නිසාය.
6. ඉක්මනින් පැහැදීමත්, ඉක්මනින් කලකිරීමත් යන මානසික අවස්ථා දෙක එකම දුර්වලතාවක දෙකෙළවරය.
7. 'චිත්තේන නීයති ලෝකෝ' ලෝකය සිත විසින් පාලනය කරනු ලබයි.
8. තම සිත මනාව පිහිටුවා ගත යුතුය.
9. සිත පිරිසිදු නම් චරිතයද ඉබේම පිරිසිදු වේ.
10. මිනිසෙකුට චිත්ත ශක්තියට වඩා වැඩි බලයක් නැත.

මෙම අදහස් කිහිපය ගැනද සිතා ඔබේ සිත ගැනද යම් ප්‍රමාණයක අධ්‍යයනයක් ඔබට ගත හැකි යැයි මම සිතමි.

කිසිදු චින්තකයෙකුට, විද්‍යාඥයෙකුට හසු නොවූ සිත ගැන සිතා එහි ස්වභාවය පිළිබඳව දෙසූ එකම චින්තකයා, විද්‍යාඥයා, ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේය. එතුමා, සිත ගැන සොයා යත් අදහස් කිහිපයක් මෙසේ ඔබට ඉදිරිපත් කරමි.

සිත නිසා අප හැම උපදී. ඉපදුනද සිට මැරෙනතුරු අප කියන, කරන, සිතන හැම දෙයකටම මුල සිතය. සිතෙන් තොරව කිසිදු දෙයක් සිදු නොවේ. ධම්ම පදයේ යමක වර්ගයේ එන,

'මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන - භාසති වා කරොති වා
තතො නං දුක්ඛ මන්වෙති - චක්කංව වහතො පදං'

යන ගාථාවෙන් ප්‍රකාශ වන්නේ සිත හැම දෙයකටම ප්‍රධාන වන, ශ්‍රේෂ්ඨ වන, මුල් වන බවත්, යමෙක් නරක සිතින් යමක් කියයිද, කරයිද, එහි අයහපත් ප්‍රතිඵලය ගොන පසු පස රියසක කැරකෙනවා සේ, මිනිසා පසුපස දුක ලුහුබඳින බවයි.

එහි දෙවන ගාථාව වන,

'මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන - භාසති වා කරොති වා
තතො නං සුඛ මන්වෙති - ඡායාව අන පායිනී'

යන මෙයින් කියැවෙන්නේද සියලු දෙයට මනස මුල්වන බවත්, යමෙක් යහපත් සිතින් කියන ලද, කරන ලද දෙයෙහි යහපත් ප්‍රතිඵලය සෙවණැල්ලක් මෙන් මිනිසා පසු පස සැපය ලුහුබඳින බවයි. එම අදහස් දෙකෙන්ද සිතේ ස්වභාවය ඔබට සිතාගත හැකිය.

එසේම ධම්ම පදයේ චිත්ත වර්ගයේ එන,

'දූරංගමං ඒකචරං - අසරීරං ගුහා සයං
යෙ චිත්තං සංය මෙස්සන්ති - මොක්ඛන්ති මාරබන්ධනා'

යන මෙයින් ප්‍රකාශ වෙන්නේද, කොතරම් දුර ඇත ඇති අරමුණක් කරා වුවත් එකෙනෙහි යන්නා වූ, සටහනකින් හෝ ආකාරයකින් හෝ සිතේ ස්වභාවය මෙසේ යයි පැවසිය නොහැකිය. එහෙත්, රූපය නමැති ගුහාවෙහි පවතින සිත යමෙක් පාලනය කරගනිද, ඔවුහු මාර බන්ධනයෙන් මිදෙත් යනුවෙන්ය. මෙම උදහරණ දෙකෙන්ම පැහැදිලි වන්නේ අප කියන කරන සිතන හැමදෙයකටම සිත ප්‍රධාන වන බවයි. දුක, සැප දෙකටම සිත මුල් වන බවයි.

අප හැමගේ සිත ප්‍රභාස්වරය, දීප්තිමත්ය. පැහැය, ආලෝකය, විහිදෙන සුළුය. මේ අනුව බලන විට අප සතුව ඇති වඩා හොඳම දෙය නම් 'සිත' බවත්, එයට වඩා හොඳ දෙයක් අපට නැති බවත්ය. නමුත් ඒ ප්‍රභාස්වර විහිදෙන සිත බාහිර කිලිටි, අදහස් නිසා අපිරිසිදු වෙයි. ඒ බව 'පභස්සර මිදං භික්ඛවෙ චිත්තං, තංච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං' යන්නෙන් පැහැදිලි වෙයි.

(අං.නි. උපක්කිලිට්ඨ චිත්ත සූත්‍රය)


පෘථග්ජන සහිත නිසා අල්ප ශ්‍රැත පුද්ගලයාට තම සිතෙහි ඇති ප්‍රභාස්වර සහිතය නොවැටහේ. බාහිර කිලිටි අදහස් නිසා, වැරදි මත නිසා, සිත කිලිටි වන බව නොවැටහේ. එම පුද්ගලයාට චිත්ත භාවනාවක්ද කළ නොහැකිය. එම නිසා ඔහුගේ සිතේ දියුණුවක්ද නැත. අප සිතේ ඇති ස්වභාවය, මෙලොව තිබෙන වස්තුවක් නැත. ධර්මය, අධර්මය, සැප, දුක තිබෙන්නේද සිතේමය. දුක, සැප යනුවෙන් අප වෙන් කර දක්වන ස්වභාවය ධර්මයේ හා අධර්මයේ ඡායාවය. අප හැම දෙනාටම හොඳ සිතක්, ප්‍රභාස්වර සිතක් ඇත. එහෙත් එය දූෂිත වන්නේ, වැරදි මානසික ධර්ම හා අයහපත් ගති ගුණ නිසාය. නමුත්, සිත නැති නොවේ. යට වෙනවා පමණි. සූර්යයා වළාකුළුවලට මුවා වූ විට එළිය අඩුවේ. සූර්ය ග්‍රහණයක් ඇති වූ කල එම ප්‍රදේශයම අඳුරුය. නමුත් සූර්යයා නොපෙනේ හෝ පායා ඇත. එමෙන්ම නරක අදහස් නිසා මගේ හොඳ සිත යට වෙනවා මිස සිත නැති වුණා නොවේ යයි සිතන්න. එම නිසා ඔබ පිරිසිදු සිතින් යාම, එම ආදී සියලු ඉරියව් පැවැත්වීමේදී සිහියෙන් සිටින විටදී හොඳ සිතින්ම සිටින්න පුරුදු වන්න.

අතුල මංචනායක

# ඔබේ සිත ප්‍රභාස්වරද ?



"යමකු බැඳීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



# නිවැරදිව සිල් දිනයක් ගත කරන අයුරු

සීලය කියන්නේ පාරමිතාවකි. බුදුරජාණන් වහන්සේ බෝසත් අවධියේ පුරණ ලද දස පාරමිතාවලින් එකක් තමයි සීලය. 'පාරමී ධර්ම' බෝසත්වරුන් විසින් පමණක් සම්පූර්ණ කරන දෙයක් නොවෙයි. බෝසත්වරු මේ පාරමී ධර්ම පෙරරා ගන්නේ මානව සමාජයේ තිබිය යුතු ධර්මතා දහයක් ලෙසයි. ඒ නිසා සීලය ප්‍රධානතම මානව ධර්මයක් වශයෙනුයි සැලකෙන්නේ.

**● උපෝසථ සීල සමාදානය**

අෂ්ටාංග සීලය, නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව සම්පූර්ණ කිරීමක් ලෙසිනුයි හැඳින්වෙන්නේ. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව යනු ජීවිතයේ කිසියම් උසස් අරමුණක් කරා නික්ම යාමයි. අෂ්ටාංග සීලය සමාදන් වීම උපෝසථ සීලය යනුවෙන් හඳුන්වන්නේ එය සුවිශේෂ සීලයක් වන නිසයි. ඒ සීලය සමාදන් වන නිර්මල පුද්ගලයා තුළ සැබැවින්ම රහතන් වහන්සේලාගේ ගුණ තිබිය යුතුයි. බුදුරජාණන් වහන්සේ උපෝසථ සීලය ආරක්ෂා කරන කෙනෙකුගේ ස්වභාවය උපමා කළේ රහතන් වහන්සේ කෙනෙකු ජීවිතය දෙස බලමින්. රහතන් වහන්සේ කෝප වෙන්නේ නැහැ. කිසිම දෙයක ඇලෙන්නේ නැහැ. අනුන්ගේ දේ නොපතන පරමාදර්ශී චරිතයක්. අෂ්ටාංග සීලය යනු සියල්ලෙන් මිදී, සියලු දේට තිබෙන ආශාව අත්හැරලා සමාදන් වන්නක්.

**● අද විහාරස්ථානයට එන උපාසක උපාසිකාවෝ බහුභාණ්ඩික වෙලා**

එහෙත් එවැනි උතුම් ගමනකට සූදානම් වන පුද්ගලයා වර්තමානයේ මල්ලක් පුරවගෙන තමයි විහාරස්ථානයට යන්නේ. අවශ්‍ය වන්නේ උපෝසථ බව, උපාසක භාවය, නැත්නම් තපස් බව සංකේතවත් කරන උතුරු සළුව පමණයි. ඒ වගේම හොඳට මතක තියාගන්න මින සීලය තිබෙන්නේ ඒ උතුරු සළුවේ නොවෙයි. බොහෝ අය සීලය 'උතුරු සළුවේ' තරමේ දෙයක් ලෙස තමයි සලකන්නේ.

අද සිල් සමාදන් වන්නට විහාරස්ථානයට එන බොහෝ උපාසක උපාසිකාවන් බහුභාණ්ඩික වෙලා. එතැනට අනවශ්‍ය බොහෝ දේවල් රැගෙන එනවා. එහම ගෙදර අල්මාරියේ යතුරු කැරැල්ලත් අරගෙන එනවා. ගෙදර තිබෙන කජු පිරප්පු ටිකත් මල්ලක දාගෙන එනවා. බැංකු පොත් ටික අරගෙන එනවා. මේ වගේ අනවශ්‍ය බොහෝ දේවල් රැගෙන ඒම නිසා අෂ්ටාංග සීලයේ පරමාර්ථයක් කිසි ලෙසකින්වත් සාධනය වන්නේ නැහැ. බොහෝ වෙලාවට ගෙදර පාවිච්චි කරන පිඟානම, කෝප්පයම අවශ්‍යයි දානය ගැනීමට. අල්පේච්ඡතාවය කියන එක මැකිලා වෙලා. මේ වගේ අනවශ්‍ය බඩු භාණ්ඩ සිල් ගැනීමට ගෙන යාමෙන් අනිත් අයටත් කරදරයි. ස්වාමීන් වහන්සේ ධර්ම දේශනා කරන විට ගෙන ආපු බඩු භාණ්ඩ සොයනවා. ඒවා අතගානවා. ඒවා නැතිවුණොත් එතැනින් සීලයත් ඉවරයි. හැමෝටමත් බැණ වදිනවා.

සැබැවින්ම උපෝසථ සීලය නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවක්ම විය යුතුයි. සියල්ල අත්හැර දැමීම පුරුදු කරන ගමනක්. පැය අටක් හෝ දොළහක් ඒ පුරුදු කිරීම කරන්න බැරි නම් පසුව ගමන කෙටි කරගන්න ලැබෙන්නේ නැහැ.

**● උපෝසථ සීලය පිළිබඳ අවබෝධයක් නැහැ**

අද බොහෝ වෙලාවට උපෝසථ සීලය සමාදන් වීමට පැමිණෙන පුද්ගලයන් ඒ පිළිබඳ අවබෝධයකින් නොවෙයි විහාරස්ථානයට එන්නේ. ඇතැම් අය එතැනට හාමුදුරුවන් එන තැන සොයනවා. තවත් අයෙක් හොඳට දානය දෙන තැන හොයනවා. තමන්ගේ හොඳම මිතුරියන් එන තැන සොයනවා. ඒ අයත් සමඟ සල්ලාපයේ යෙදෙන්න. ඇතැම් අය හොඳ වැඩසටහන් තිබෙන, සැම තත්පරයක්ම ජීවිතයට යමක් එකතු කරගත හැකි තැන් සොයනවා. එය වැරැද්දක් නොවෙයි. එය හොඳ දෙයක්. ඒත් එවැනි තැන්වලට යන ඇතැමුන් වැඩි කාලයක් ගතකරන්නේ එතැන සිටින තමන්ගේ මිතුරියන් සමඟ අල්ලාප සල්ලාපයේ යෙදෙන්න. එයින් වෙන දිනයේ කරගන්නා පාපයට වඩා වැඩි පාපකර්මයක් සිදුකර ගන්නවා.

**● නිවැරදි උපෝසථය යනු?**

පෝ දිනයක සමාදන් වෙන උපෝසථ සීලය සම්බන්ධයෙන් හොඳ විවරණයක් අංගුත්තර නිකායේ තික නිපාතයෙහි එන ආර්ය උපෝසථ සූත්‍රයේ දක්වෙනවා. සැවැත්නුවර පූර්වාරාමයෙහි බුදුරජුන් වැඩ සිටි පොහොය දිනක විශාඛාව බුදුරජුන් හමුවීමට පැමිණියා. තමන් රකින උපෝසථ සීලයෙහි පිහිටා සිටින බවද ඇය බුදුරජුනට කියාසිටියා. එවිට බුදුරජාණන් වහන්සේ ආර්ය විනයෙහි දක්වෙන නිවැරදි උපෝසථය කුමක්දැයි විශාඛාවට දේශනා කොට වදාළා. ඒ අනුව තත්කාලීනව පැවති උපෝසථ තුනක් බුදුරජාණන් වහන්සේ විශාඛාවට පෙන්වා වදාළා. ඒවා නම්,

1. ගෝපාල උපෝසථය 2. නිගණ්ඨ උපෝසථය 3. ආර්ය උපෝසථය.

ගෝපාල උපෝසථය යනු ගවයන් රැක බලාගන්නා ගොපල්ලන්ගේ දිවියට සමාන ලෙස දිවියක් ගෙවන

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

උපෝසථ සම්ප්‍රදායයි. අනුන්ගේ ගවයන් බලාගන්නා ගොපල්ලන් ගවයන් සමග විවිධ තණ බිම්වල හැසිර සවස් යාමේදී ස්වාමියාට ගවයන් බාර දෙමින් මෙසේ සිතුවා. අද දින මම ගව රංචුව අසවල් තණ භූමියට දක්කාගෙන ගියා. අසවල් තැන්වලින් ජලය පානය කෙරෙව්වා. හෙට ගෙන යන්නේ වෙනත් තණ භූමියකටයි. මෙසේ ගොපල්ලා ගවයන් හොඳින් කෑ බිව් තැනි ස්ථාන සොයා සොයා දිනෙන් දින මඟින් කරනවා. මෙය නිදර්ශනයකට ගත් බුදුරජාණන් වහන්සේ එම ගොපල්ලා මෙන් උපෝසථ සීලය රකින වුන් උසස් සීලය අමතක කොට ඒ ඒ තැන්වලින් ලැබෙන ආහාර පානයන් කෙරෙහි ලොල්ව ඒවායේ ගුණ ගයමින් පොහොයෙන් පොහොයට විවිධ ස්ථානවලට ගමන් කරයි. ඔවුනු සීලයට වඩා ප්‍රමුඛතාව ආහාරයට ලබාදෙයි. එසේ ලැබෙන ආහාර පානවල අඩුපාඩු දුටු විට ඒවා විවේචනය කරන්නටද පෙලඹෙති. එයින් ද්වේෂයක්ද ඇතිකර ගනී. ඔවුන්ට ඒ සමාදන් වූ සීලයෙන් කිසිදු ප්‍රයෝජනයක් නොමැත. අනුන්ගේ ගවයන් බලන්නාට එයින් කිසිදු ප්‍රයෝජනයක් නැත්තා සේ, එසේ සිල් ගන්නන්ගේ සිල් ගෝපාල උපෝසථ සීලය ලෙස බුදු හිමියන් හැඳින්වූවා.

දෙවැනි උපෝසථ සීලය නිගණ්ඨ උපෝසථයයි. නිගණ්ඨ නම් ශ්‍රාවකයන්ට උගන්වන්නේ කිසියම් සීමාවක් දක්වා සිටින සතුනට පමණක් මෛත්‍රිය දක්වන ලෙසයි. එම සීමාවෙන් එපිට සිටින සතුනට කවර උපද්‍රවයක් සිදුවුවද එයින් පාපයක් සිදු නොවන බවද උගන්වයි. එමෙන්ම සියලු වස්තු උනා දමා, නිරුවතින් වසමින් සියලු බැඳීම්වලින් නිදහස්ව වසන ලෙසද ඔවුනු ශ්‍රාවකයන්ගෙන් ඉල්ලා සිටිති. මෙසේ පිරිසකට පමණක් මෙත් සිත පතුරුවමින්, බොරු කියමින් සමාදන් වන සීලය නිගණ්ඨ උපෝසථය ලෙස දක්වෙයි. ඒ අනුවම යමකු උපෝසථ සීලය සමාදන්ව තමන්ගේ ගෙදරටය, පවුලට පමණක් සෙතක් වේවායි පතමින් අනායන් පිළිබඳ කිසිදු කරුණා දයා හැඟීමකින් තොරව කටයුතු කරන්නේ නම් එය නිගණ්ඨ උපෝසථයේ ලක්ෂණයකි. එමෙන්ම සමහරකු අන් අයගේ පළිගැනීම සඳහා නැතහොත් තමන් සත්පුරුෂයකු සේ පෙනී සිටීම සඳහා උපෝසථ සීලය සමාදන්ව කටයුතු කරන්නේ නම් ඔවුහුද නිගණ්ඨ උපෝසථ රකින අය අතරට වැටෙති.

මේ උපෝසථ දෙකම බුදු හිමියන් ප්‍රතික්ෂේප කළහ. උන්වහන්සේ අනුමත කළේ ආර්ය උපෝසථයයි. ආර්ය විනයෙහි නිවැරදි උපෝසථය කුමක්දැයි විශාඛාවට බුදුහිමියෝ පෙන්වා වදාළා. ආර්ය උපෝසථයෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ කිලිටි සිත පිරිසිදු කරලීමයි. ජීවිතය පුරාම කිලිටි කරගත් සිත ආර්ය උපෝසථයෙන් පවිත්‍ර කරගන්නට උත්සාහ කළ යුතුයි. මේ ගැන අනවබෝධයෙන් බොහෝ දෙනා රට පුරා සිල් සමාදන් වීමට හොඳ හොඳ ස්ථාන සොයා යැම වැරැද්දක් බව සිතන්න. එහෙත් මෙතැනදී ධර්ම කරුණු සාකච්ඡා කරන ස්ථානයක් සොයා යාම වැරැද්දක් නොවේ, ඒ කිලිටි සිත පිරිසිදු කරගන්න ධර්මය ගැන අවධානය යොමු කරලීම අවශ්‍ය වන බැවින්.

**● සිතෙහි තිබෙන කිලිටි ඉවත් කරගන්නේ කෙසේද?**

මෙම ආර්ය උපෝසථය සමාදන් වන පුද්ගලයාට සිතෙහි තිබෙන කිලිටි ඉවත් කරගන්නා ආකාර පහක් බුදුහිමියෝ පෙන්වා දුන්නා. ඒවා,

බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, සීලානුස්සතිය, දේවතානුස්සතිය වැඩිය යුතුයි. සිතෙහි පවතින විවිධ කිලිටි පහකර ගැනීම පිණිස මෙම කරුණු පහ මෙනෙහි කළ යුතුයි.

කිලිටි වූ හිස සබන් වර්ග හා විවිධ ඇඹුල් වර්ග හා සෝදා පිරිසිදු කරගන්නා සේ ආර්ය ශ්‍රාවකයා බුද්ධානුස්සතිය වැඩීමෙන් සිත පිරිසිදු කරගන්න. බුදු හිමියන් ගැන සිහිමෙන් සිතෙහි ඇතිවන සතුට, ප්‍රීති ප්‍රමෝදය හේතුවෙන් සිත පවිත්‍ර වෙන්න. අපවිත්‍ර වූ සිරුරක් විවිධ සබන් වර්ග හා ජලයෙන් සෝදා පවිත්‍ර කරගන්නා මෙන් ආර්ය ශ්‍රාවකයා ධම්මානුස්සතිය වැඩීමෙන් සිතේ ඇතිවන කිලිටි ඉවත් කරගන්න. ධර්මය මෙනෙහි කිරීමෙන් සිතට ලැබෙන සුවය ස්නානය කිරීමෙන් ශරීරයට ලැබෙන සුවයටත් වඩා වැඩිය.

අපිරිසිදු වස්ත්‍රයක් සබන් හා ජලයෙන් පිරිසිදු කරගන්නාක් මෙන් සංඝානුස්සතිය වඩන පුද්ගලයාගේ සිත පිරිසිදු වෙයි. සංඝරත්නයේ උතුම් ගුණ සමුදායන් මෙනෙහි කරන ආර්ය ශ්‍රාවකයාට එයින් සිතේ සතුට ඇතිවෙයි. එයින් සිත පිරිසිදු වෙයි. කිලිටි වූ කණ්නාඩියක් ජලය යොදා පිරිසිදු කරගන්නා මෙන් තමන් ආරක්ෂා කරන සීලය මෙනෙහි කරන්නාගේ සිතද පිරිසිදු වෙයි. තමා තුළ ඇති ශික්ෂණය, හැදියාව පිළිබඳව විමසා බැලීමෙන් සිත පිරිසිදු වෙයි. රිදීයෙහි තැවුණු මලකඩක් විවිධ දේ යොදා පිරිසිදු කරගන්නා මෙන්, දෙවියන් පිළිබඳ කල්පනා කිරීමෙන් සිත පිරිසිදු කරගත හැකිය. දෙවියන්ට පුද පූජා තැබීමෙන් නොව තමා තුළ ඇති උසස් ගුණ දේවත්වයට නංවා කල්පනා කිරීමෙන් සිතෙහි මල දුරුකර ගත හැකිවෙයි.

මේ අනුව ආර්ය උපෝසථය ආරක්ෂා කරගන්නට උත්සාහ කරගන්නා උපාසක උපාසිකාවන්ට සිතෙහි හටගන්නා වූ කුණු, කිලිටි සෝදා හැරීමෙන් කෙතරම් ප්‍රසන්න කෙනෙකුන් විය හැකිද? රහතන් වහන්සේගේ චර්යාවට උපෝසථ සීලයෙහි නිරත තැනැත්තා උපමා කොට තිබෙන්නේ වැරදි සිදු නොවන බැවිනි.

**● හොඳ සීල භාවනා වැඩසටහනක් යනු**

උදෙන්ම අෂ්ටාංග සීලය සමාදන් වෙලා, බුද්ධ වන්දනාව සිදුකර, අනුශාසනාවක්, වැඩසටහන ආරම්භ කිරීමෙන් පසුව භාවනා වැඩසටහනක් සහ හොඳ ධර්ම දේශනාවක් තිබීම වැදගත්. දහවල් දානයෙන් පසු ආශිර්වාද සූත්‍ර දේශනාවක් පැවැත්වීම සුදුසුයි. සවස එසේ සිට දෙක දක්වා පැය විට වඩාත් ගැලපෙනවා. දහවල් දානයෙන් පසු සිත්වල ඇතිවන උදාසීන භාවය මඟ හරා සූත්‍ර ගායනා කිරීමෙන් නැතිවී යනවා. ඉන්පසු දෙකේ සිට තුන දක්වා මෙවැනි උගත් ගිහි විද්වතකුගේ දේශනයකට සවන් යොමු කළ හැකි නම් හොඳයි. පසුව ධර්ම දේශනාවකින්, ධර්ම සාකච්ඡාවකින් වැඩසටහන අවසන් කළ හැකියි.


**● ජාතක කතාවක් ශ්‍රවණය කිරීම වැදගත්**

ඒ වගේම ජාතක කතාවක් ශ්‍රවණය කිරීමත් ඉතාම වැදගත්. අතීතය මේ කාර්යය ඉතා හොඳින් සිදුකළා. සිල් ගත් උපාසකයෙක් හෝ උපාසිකාවක් මඟ හරා ජාතක කතාවක් කියවනවා. එසේ කියවන අතරවාරයේ යම් යම් තැන්වල නතර කරමින් අවශ්‍ය පැහැදිලි කිරීම් සිදුකරනවා. එදා ඒ වගේ හොඳ බණ කතා සාහිත්‍යයක් ගොඩනැගී තිබුණා. ඒත් අද එය නැතිවී ගිහින්. බණ කතා සාහිත්‍ය ධර්ම ශාලාවෙන් බැහැරවීම විශාල හානියක්. ඒ නිසා අපගේ පෝ දින වැඩසටහනට ධර්ම කතා සාහිත්‍යයක් ඇතුළත් වෙනවා. එය ඉතා කාලෝචිත දෙයක්.

**● විහාරස්ථානයෙන් පිටව ගිය පසු සීලය අවසානද?**

සිල් සමාදන් කර නිවසට ගිය පමණින් සීලය අවසන් විය යුතු නැහැ. ඒක වචනවලින් තිබා කළත් චර්යාවක්, ඒක චර්යාවකට හුරු කිරීමක්, බෝසත්වරු සීලය පුරුදු පුහුණු කරගන්නා සේ අපිත් ඒ ගුණයට අවනත විය යුතුයි. අනුගත විය යුතුයි. එනිසා සවස නිවසට පැමිණෙන පුද්ගලයා බොහෝයි උතුම්, නිවුණු, තවත් ගුණවලින් යුක්ත විය යුතුයි. ගිහි ජීවිතයක් ගත කරන පුද්ගලයා වඩා උතුම් වන්නේ පළමුවෙන් පන්සිල් ආරක්ෂා කිරීමෙනුත්, දෙවනුව අටසිල් ආරක්ෂා කිරීමෙනුත්ය.

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ අංශාධිපති,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
අගලකඩ සිරිසුමන හිමි



# රහතුන්

## ගිය මග කීමට අපහසුය

සත්වයා සසර සැරි සරන්නේ භවයෙන් භවයටය. එක භවයක් අවසන් කොට අලුත් භවයකට පිවිසෙනු ඇත. එම සැරි සැරීමේදී කාම, රූප, අරූපාදී ලෝක හසුවීමට පුළුවන. බහුල වශයෙන් කාම ලෝකවලට අයත් සතර අපාය, සදිව්‍ය ලෝකය හා මිනිස් ලෝකය තුළ සැරි සරනු ඇත. එයින් බොහෝ පිරිසක් අපායාවස්ථාවල සැරි සරනු අතර ස්වල්ප දෙනෙක් සුගතිවල උපදිනු ඇත.

මෙම සංසාර චක්‍රය තුළ මිනිස් ලෝකය තුළ උපදීමට ලැබීම ඉතා භාග්‍ය සම්පන්න කරුණක් වනු ඇත. මිනිසෙක් වී ඉපදීම දුර්ලභ කරුණක් වශයෙන් බුදු දහම තුළ පෙන්වා දී ඇත. උසස් මිනිසෙක් ලෙසින් ඉපදීම එහි විශේෂත්වයයි. සාමාන්‍ය වශයෙන් අවුරුදු සීයක්, එකසිය විස්සක් මිනිසාට පරමායුෂ තිබුණද වර්තමානය වන විට පරමායුෂ හැටක්, හැත්තෑවක් අනුව ප්‍රමාණයකට සීමා වී ඇත.

එවැනි කෙටි කාලයක් තුළ ජීවත් වන මිනිසා ආයුෂ අවසන් වූ කල මිය යනු ඇත. ආයුෂ විඥානය පහ වූ කල දර කැබැල්ලක් සේ මෙම ශරීරය ඉතිරි වනු ඇත. ඊට පසු ඔහු වෙනත් භවයකට සම්බන්ධකම් කියනු ඇත. ශරීරය පොළවට වැළලූ කල පස් බවට පත් වී පොහොර වනු ඇත. නැවත කුමන තැනකට ගියාද කියන වග නිශ්චිත වශයෙන් කීමට අපහසුය.

වෛද්‍ය විද්‍යාවට අනුව ශරීරයක් පරීක්ෂා කොට ශරීරයට වූ හානියක් පිළිබඳ ඒ ඒ ලක්ෂණවලට අනුව කීමට සමත්කම් දක්වුවද මියගියාට පසු කොහෙනකට ගියාද, කොතැනක ඉපදුණාද කියා කීමට සමත් නොවනු ඇත. ශරීරය විනාශ වීම සිදුවූයේ බාහිර බලපෑමකින් හෝ යම් කෙනෙකුගේ පහර දීමකින්, වෙඩි තැබීමකින් නම් ඒ පිළිබඳ වෛද්‍ය වාර්තාවක් දීමට ප්‍රවීණත්වයක් ඇති නමුත් මියගොස් නැවත උපදින තැන කොතනද කියා සහතිකයක් නොදෙනු ඇත.


සම්බුදු බුදුන් කල සිටි වංගීස නම් භික්ෂුවට මියගොස් ඉපදුණ තැන කීමට තරම් සුවිශේෂී හැකියාවක් තිබූ බව ධම්ම පදය තුළින් කියවේ. බුදුන් කල සිටි වංගීස භික්ෂුව එය සිදු කළේ මියගිය අයගේ හිස්කබල් ගෙන එය නිය පිටින් ගැසීමෙන්ය. එය සුවිශේෂී හැකියාවක් බව අත්දැකීමෙන් කියනු ඇත. ඔහුගේ හැකියාවට අනුව හිස් කබල්වලට තට්ටු කොට,

“මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමාවත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?”

මේ හිස නරයෙහි උපන් කෙනකුගේය
මේ හිස තිරිසන් යෝනියෙහි උපන් කෙනකුගේය
මේ හිස ප්‍රේත ලෝකයෙහි උපන් කෙනකුගේය
මේ හිස මිනිස් ලෝකයෙහි උපන් කෙනකුගේය
මේ හිස දෙව්ලොව උපන් කෙනකුගේය

ආදී වශයෙන් කියනු ඇත. විවිධ මිනිසුන් තම තමන්ගේ ඥාති සමූහයා, පවුලේ අය මියගොස් කොහේ උපන්නේද කියා දැන ගැනීමට වංගීස බමුණා ළඟට හිස් කබලත් රැගෙන ඒම සුලභව සිදුවෙන්නට විය. ඔහුට විශාල වශයෙන් මුදල්ද ඒ සම්බන්ධව ලබා ගැනීමට හැකි විය. නුවර වැසියන් මේ බමුණාගේ දක්ෂතාවය නිසාම බුදුරජාණන් වහන්සේ ළඟට කැඳවාගෙන යන්නට විය. පසුව බුදුහිමි රහතන් වහන්සේ කෙනකුගේ හිස් කබලක් දී බමුණ, මේ කෙනකු මියගිය පසු උපදින තැන කීමට සමර්ථයෙක් බව දැන ගන්නට ලැබුණ බවත්, එසේනම් මේ හිස්කබල පරීක්ෂා කොට ඔහු ගිය මග කියන්න යැයි ප්‍රකාශ කළේය. පසුව බමුණා එම හිස් කබල ගෙන තට්ටු කොට කීමට අපහසුව ලැජ්ජාවෙන් මිරිකි මිරිකී සිටියේය.

පසුව බුදු හිමි මතක් කර සිටින්නේ "බමුණ, ඔහු ගිය මග මා දනිමි" යනුවෙනි. පසුව "එම මන්ත්‍රය කුමක්ද? එය මටත් කියා දෙන්න" යනුවෙන් ඉල්ලා සිටියේය. බුදුහිමි මතක් කර සිටින්නේ බමුණ, එම මන්ත්‍රය දැනගැනීමට නම් පැවිදිව වත් පිළිවෙත් ඉටුකොට, බවුන් වැඩීම කළ යුතු බවය. පසුව වංගීස බමුණා පැවිදිව ප්‍රතිපත්ති පුරමින් විදසුන් වඩා රහත් භාවයද ලැබිය. පසුව වංගීස තෙරුන් යනුවෙන් ප්‍රකට විය.



ඉහත කතාව තුළින් පැහැදිලි වන්නේ රහතුන් ගිය මග බුදු හිමිට හැර කිසිවකුට කීමට අපහසු බවයි. රහතන් වහන්සේ කෙනකු යනු දස සංයෝජන ධර්ම සිඳ බිඳ දා උතුම් නිවන් සුවයට පත්වූ අයය. එවැනි උත්තමයකුගේ හිස් කබලක් හෝ ශරීර ඇට කැබලි සාමාන්‍ය කෙලෙස් බරිත කෙනකුට නිරීක්ෂණය, පරීක්ෂණය කිරීම අපහසු කාර්යයකි. පුහුදුන් බුද්ධියට ඔවුන්ගේ පිරිනිවීමෙන් පසු ගිය මග කීම අපහසුය. එය හරියට කුරුල්ලන් අහසේ යෑමෙන් පසු ගිය මග කීමට අපහසු වූවාක් මෙනි. ඒ බව ධම්ම පදයේ අරහන්ත වග්ගය තුළින් පැහැදිලි වේ.

"යෙසං සන්නිචයෝ නත්ථි
යෙ පරිඤ්ඤාත භෝජනං
සුඤ්ඤතෝ අනිමිත්තෝ ච
විමොක්ඛෝ යස්ස ගොචරෝ
ආකාසේව සකුන්තානං
ගති තෙසං දුරන්නයා"

නිවන අරමුණ කොටගත් රහතුන්ගේ ස්වභාවය දැනගැනීම අපහසුය. අහසේ පක්ෂීන් ගිය මග නොදත හැකිවාක් මෙනි. මේ ආදී වශයෙන් රහතුන් පිළිබඳ ත්‍රිපිටකය තුළ සඳහන් කරුණු කාරණා අනුව රහතුන්ගේ ගති ස්වභාවය, රහතුන්ගේ ඉපදීම කෙනකුට නොදත හැකිය. එය බුදු කෙනකුගේම ඥානයට හසු වන්නකි. අද වුවද සෝවාන්, සකෘදාගාමී, අනාගාමී හෝ රහත් වී ඇති කෙනකු සිටිද්ද, නැද්ද කීම අපහසුය. ඔවුන් කිසි දිනක සෝවාන් වූවා හෝ රහත් වූවා හෝ නොකියනු ඇත. එසේ කියන පිරිසක් භික්ෂු සමාජයේ හා ගිහි සමාජයේ දක්නට ලැබේ. එය දසමාර සෝතාවන්ගෙන් එකක් හැටියටයි දක්වා ඇත්තේ. බොරු සිල් පෙන්වමින්, සතර මග හා ඵලවලට පත්වූ ආකාරයෙන් අනුනගෙන් ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු වීම ඔවුන්ගේ එකම අරමුණ වී ඇත.

ඒ අනුව රහතුන්ගේ ගුණ නොදන රහතුන්ට නින්දා, අපහාස කිරීම හෝ තාඩන, පීඩන කිරීම තුළින් සිදුවන අකුසලය ඉතා බරපතලය. රහතුන් මැරීම ආනන්තරිය පාපකර්මවලින්ද එකක් වන්නේය. මහරහතුන්ගේ චරිත කතා සම්බන්ධ කොටගෙන ප්‍රතිපත්ති පිරීම සිදු කළ යුතුව ඇත. එතුළින් සතර මග, සතර ඵල හා නිවන සාක්ෂාත් කරගැනීමට පුළුවන්කමක් ඇත.

පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි



# නමස්කාර පාඨයේ දැනගත යුතු දේ

කොනෙකුට හිතෙන්න පිළිවන් නමස්කාරේ මොනවද දනගන්න තිබෙන්නේ කියලා. නමුත් බොහෝ දෙනෙක්ගෙන් මේ පිළිබඳව විමසූ විට නිවැරදි පිළිතුරක් ලැබෙන්නේ නැහැ. නමස්කාරය බෞද්ධයෝ නිරන්තර භාවිත කරති. පන්සිල් සමාදන් වීමට පෙරද, පිරිත් දේශනා කිරීමට පෙරද, බෝධිපූජා කිරීමට පෙරද, ධර්ම දේශනා කිරීමට පෙරද ආදී නොයෙක් තැන්හිදී මෙය භාවිතයට ගනු ඇත. එසේම ශාන්තිකර්ම කරන අවස්ථාවන්හිදීද, මන්ත්‍ර ගුරුකම් කරන අවස්ථාවලදීද, යකැදුරෝ මෙය සජ්ඣායනය කරති. ඒ ආකාරයෙන් නමස්කාරය නිරන්තර භාවිත කිරීම තුළින් පන්සිල් සමාදන් වීමට පෙර නමස්කාරය කියන්නැයි කී විට කියෙන් කීදෙනාද මෙය ශබ්ද නගා කියන්නේ? බොහෝවිට බොහෝ දෙනෙක් ඇලිමැලි දක්වන බවක් පෙනෙනවා. එවැනි තත්ත්වයක් ඇතිවන්නේ එම අවස්ථාවේ ඔවුන්ගේ මානසිකත්වය අනුවදැයි සිතිය යුතු තත්ත්වයකි. එහෙත් බොහෝ අවස්ථාවලදී මානසිකත්වය පහළ බැසීමට හේතුවක් නැත. එසේනම් එයට වෙනත් හේතුවක් තිබිය යුතුයි. එය නම් නමස්කාරයෙන් කියැවෙන අර්ථය නිවැරදිව නොදන්නා බව හා එයින් වන යහපත ගැන අවබෝධයක් නොමැති නිසාත්ය.

බුදුරජාණන් වහන්සේට සම කළ හැකි වෙනත් කිසිවකු නැත. ඇත්නම් ඒ තවත් බුදුරජාණන් වහන්සේ නමක් පමණි. උන්වහන්සේ ලෝකයේ මිනිසුන්ට දකින්නට ලැබෙන දුර්ලභ දසුනකි. ඒ බුදුරජාණන් වහන්සේගේ බුදු ගුණ සිහි කරමින් උන්වහන්සේ කෙරෙහි සිත පහදවා ගැනීම වුවද සත්වයන්ට වාසනාවන්ත උපතක් සඳහා හේතු වේ. මට්ටකුණ්ඩලී සිටු පුතුයා බුදුරජාණන් වහන්සේ ගැන සිත පහදවා යහපත් උපතක් ලබා ගත්තේය. ආනන්තරීය පාප කර්ම සිදුකරගත් දේවදත්ත හිමියන් පවා අන්තිම මොහොතේ බුදුරජාණන් වහන්සේ පිළිබඳව ප්‍රසාද සිත ඇතිවීම නිසා අනාගතයේදී අට්ඨිස්සර නමින් පසේබුදුවරයෙක් වන බව සඳහන් වේ. එක්තරා ගෙම්බෙක් බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කරන ස්ථානයක සිට උන්වහන්සේගේ සුමිහිරි දහම් හඬට සවන් දුන්නේය. එම අවස්ථාවේ එක්තරා පුද්ගලයෙක් බුදු ගුණ අසමින් සිටියා. ඔහුගේ සැරයටිය ගෙම්බාගේ ඇඟ උඩය. මේ පුද්ගලයා ඒ බවක් දන සිටියේ නැත. එක්වරම සැරයටිය යටට තද විය. ඒ සමගම ගෙම්බා මරණයට පත්වී දිව්‍ය ලෝකයේ මණ්ඩුක දිව්‍ය පුත්‍රව උපන්නේය. මේ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ ගැන අල්ප මාත්‍රයක් වුවද සිත පැහැදීමෙන් ජීවිත වාසනාවන්ත භාවයට පත්කර ගත හැක.

"තිට්ඨන්තෙ නිබ්බුතේචාපි
සමේ චිත්තේ සමේ ඵලං
චේතෝ පසාද හේතුම්හි
සත්තා ගච්ඡන්ති සුග්ගතිං"

බුදුරජාණන් වහන්සේට සැදැහැයෙන් වඳින පුදන අයට උන්වහන්සේ ජීවමානව වැඩ සිටියත්, පිරිනිවියත් එක හා සමානව විපාක ලැබෙන බව ඉන් ප්‍රකාශිතය.

ඒ නිසා නමස්කාරය පිළිබඳව නිවැරදිව අවබෝධ කරගෙන මෙය ඕනෑම අවස්ථාවක ශබ්ද නගලා කියන්න පුරුදු වෙන්න ඕන. නමෝ යනු නමස්කාර වේවා යන අර්ථයයි. මම නමස්කාර කරන්නේ කුමන කෙනෙකුටද යන්න ඊළඟට තිබෙන වචනවලින් පැහැදිලි වේ. තස්ස භගවතෝ. ඒ භාග්‍යවතුන් වහන්සේට. මෙහි භගවා යනු 'භග්ගරාගෝ භග්ග දෝසෝ, භග්ග මෝහෝ, බුදුරජාණන් වහන්සේ රාගය දුරු කළ සේක, ද්වේශය දුරු කළ සේක, මෝහය දුරු කළ සේක යන අර්ථයයි. 'අරහතෝ' යනු ආරකත්තා හතත්තාව කිලේසාරින."

"සෝමුනි හත සංසාර චක්කාරෝ
පච්චයාදීන වාරහෝ"

එනම් සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ සේක. සසර ගමන දිගින් දිගටම යන හේතුකාරණා සිඳලූ සේක. දිගින් ආමිස ප්‍රතිපත්ති පූජාවනට සුදුසු සේක. රහසින්වත් පව් නොකළ සේක යනුය. සම්මා සම්බුද්ධස්ස යනු තමන් වහන්සේ විසින්ම ඒ උතුම් වූ සද්ධර්මය අවබෝධ කරගත්තා යන්නයි. ලෝකයේ මෙතෙක් කිසිවකුට සොයාගත නොහැකි වූ චතුරාර්ය සත්‍යය හා හේතුඵල ධර්මය වැනි අති ශ්‍රේෂ්ඨ වූ දහම උන්වහන්සේගේ අතීන්ද්‍රිය ඥාන ශක්තියෙන් අවබෝධ කරගත්ත.

මේ අනුව නමස්කාරයේ ඉතා ගුණ සම්පන්න වූ බුදුරජාණන් වහන්සේගේ උතුම් බුදු ගුණ තුනක් සඳහන් වෙනවා. ඒ පිළිබඳව මනා සිහියෙන් ශබ්ද කර කියවීමෙන්, සිතීමෙන්, භාවනා කිරීමෙන් මහත් වූ සැනසීමක්, රැකවරණයක් තමන්ට ලබාගත හැකිය. ඒ නිසා මින්පසු කම්මැලි නැතිව ශ්‍රද්ධාවෙන් හා ගෞරවයෙන් යුක්තව නමස්කාරය කියන්න. ඒ සමගම අද දවසේදී ඉතා ආරක්ෂක ගාථාවක් පිළිබඳව හඳුන්වා දෙන්නට කැමැතිය. මේ ගාථාව සකස් වෙලා තිබෙන්නෙත් අප භාවිත කරන නමස්කාර පාඨය මුල්කරගෙනය. ඔක්කෝටම ඉස්සරින් මෙහි අතීත ගාථාව සඳහන් කළ යුතුය.


මෙම ගාථාව භාවිත කර තිබෙන්නේ පැරණි බුරුම ස්වාමීන් වහන්සේලාය. බුරුමයේ එක්තරා ස්ථානයක ගින්නකින් සෑම දෙයක්ම විනාශ විය. පසුව සෑම දෙනාටම දැකගත හැකිවූයේ අපූරු සිදුවීමකි. එනම් එම ස්ථානයේ එක් තැනක් පමණක් ගින්නෙන් දැවී නොතිබීමයි. මේ පිළිබඳව පරීක්ෂා කරගෙන යාමේදී දැකගන්නට ලැබුණේ බුදු පිළිමයකි. එම පිළිමය යට මේ නමස්කාර ගාථාව රන් පටක ලියා තැන්පත් කර තිබී ඇත.

මෙම ගාථාව සැකසී ඇත්තේ අකුරු හතෙන් හතට තේරුම් එන ආකාරයෙනි. අප දනට භාවිත කරන නමස්කාර පාඨය ප්‍රස්තාර ක්‍රමයකට සකසා ඇත. මෙම ගාථාව තමින් වැඩි වාර ගණනක් සජ්ඣායනය කිරීමෙන් තමන් බලාපොරොත්තු වන යහපත, දියුණුව, රැකවරණය සලසා ගත හැකි බව සඳහන් වෙනවා. එම නමස්කාර ගාථාව මෙසේය.


"නමෝතස්ස භගවතෝ
අරහතෝ සම්මා සම්බුද්ධස්ස.
වම්මා තරද්ධ ගසමෝ
අම්බුහතෝ නතෝ සස්ස
හස්ස සතෝ තම්බුහග
නම්මා අප්සද්ධතෝ වමෝ
පරහස්ස නමෝතස්ස භගවතෝ
අරහතෝ සම්මා සම්බුද්ධස්ස."

තමන්ගේ සිත සංවර කරගැනීම සඳහාත්, පිනට දහමට නව නවත් සිත යොමුකර ගැනීම සඳහාත්, අධ්‍යාපන කටයුතු හා රැකිරක්ෂා කටයුතුවල දියුණුව සඳහාත්, මෙම ගාථාව විශේෂයෙන් ඉවහල් වේ. මේ ගාථාව සජ්ඣායනා කරන්නට පෙර පන්සිල් සමාදන් වී තෙරුවන් වන්දනා කළ හැකි නම් ඉතා යහපත්ය. එසේනම් මේ උතුම් ගුණධර්ම තව තවත් වැඩි දියුණු කරගන්න. නමස්කාර ගාථාව නිවැරදිව භාවිත කර ජීවිතයට සැනසීම එක්කර ගන්න.

පූජ්‍ය ගෝණදෙණියේ සීවලී හිමි




ධර්ම දේශනය



# පෙහෙවස් සමාදන් වන ඔබ

## තෙරුවන් ගුණ හා සීල ගුණය සිහිපත් කිරීමෙන් සිතේ කෙලෙස් පහව යයි



දේශකයාණෝ - මහනුවර අස්ගිරිය ඓතිහාසික ගෙඩිගේ රාජමහා විහාරාධිපති, ඓතිහාසික පොළොන්නරුවේ [illegible] මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාරීය ව්‍යවස්ථාපිත කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික, ගරුතර

**පූජ්‍ය වේඩරුවේ ශ්‍රී උපාලි**

ශ්‍රී දළදා මාළිගාවේ [illegible] නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"කථඤ්ච, විසාඛෙ, අරියූපොසථො හොති? උපක්කිලිට්ඨස්ස, විසාඛෙ, චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති. කථඤ්ච, විසාඛෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති? ඉධ, විසාඛෙ, අරියසාවකො තථාගතං අනුස්සරති - 'ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තස්ස තථාගතං අනුස්සරතො චිත්තං පසීදති, පාමොජ්ජං උප්පජ්ජති, යෙ චිත්තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති, සෙය්‍යථාපි, විසාඛෙ, උපක්කිලිට්ඨස්ස සීසස්ස උපක්කමෙන පරියොදපනා හොති."

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

අද බක් පුර පසළොස්වක පොහෝ දිනයයි. ශාසනික වශයෙන් වැදගත් සිදුවීම් කිහිපයක් මේ උතුම් පොහෝ දිනයේ දී සිදුවී ඇත. ඒ අතර අපගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ දෙවන වර ලංකා ගමනත්, චූලෝදර - මහෝදර යුද්ධය සංසිඳවීමත්, දෙවියන් විසින් රැගෙන ආ කිරිපලු වෘක්ෂය රෝපණය කිරීමත් වැදගත් වෙයි. මේ උතුම් පොහෝ දිනයේ අපගේ පින්වත් ශ්‍රාවක ඔබට දේශනා කිරීමට බලාපොරොත්තුවන්නේ නිවැරදිව පෙහෙවස් සමාදන් වන අයුරු ඇතුළත් ධර්ම දේශනාවක් වන අංගුත්තර නිකායට අයත් විසාඛෝපෝසථ සූත්‍රය විමසා බැලීමටයි.

පොහෝ දිනයන්හි පෙහෙවස් සමාදන් වීම බුදුරදුන් අනුමත කරන ලද්දේ විශාඛා මහෝපාසිකාවගේ ඉල්ලීමකට අනුවය. පෙහෙවස් සමාදන් වීම හෙවත් පොහෝ දිනයන්හි සිල් සමාදන් වීම බුදු සමයට ඇතුළත් කරගන්නා ලද්දේ ජෛන සමයෙහි එන පිළිවෙතක් මුල්කොට ගෙනය. ජෛන දහම තුළ එය එතරම් සදාචාරාත්මකව ක්‍රියාත්මක නොවූ අතර, බුදු සමය තුළ එය සදාචාරාත්මක හර පද්ධතියක් බවට පත්කරන ලදී. ජෛනයින් පෙහෙවස් සමාදන් වීම සිදුකළේ ව්‍රතයක් වශයෙනි. එනම් සඳේ අවපක්ෂය හා පූර්වපක්ෂය මුල් කරගෙනය. පූර්වපක්ෂය ආරම්භ වන දවසේ සිට ව්‍රතය ආරම්භ කරන ඔවුහු පිඩින් පිඩ ආහාර ගෙන සඳ පිරෙන දිනට හෙවත් පසළොස්වක දාට උපරිම ලෙස ආහාර ගනිති. ඊට පසු අවපක්ෂයේ සඳ බසින පිළිවෙළ අනුව පිඩින් පිඩ ආහාර අඩු කොට සඳ නොපෙනෙන දිනට හෙවත් අමාවක දිනට ආහාරයෙන් වැළකී සිටිති. මෙය චන්ද්‍රායන ව්‍රතය ලෙස ජෛන සමයෙහි උගන්වයි.

බුදුරජාණන් වහන්සේ විශාඛා මහෝපාසිකාවට දේශනා කළ උපෝසථ වර්ගීකරණයක් සඳහන් වන මෙම දේශනාව නම් කොට ඇත්තේ 'විසාඛූපොසථ සූත්‍රය' ලෙසය. එම සූත්‍රයෙහි සඳහන් අයුරින් එම උපෝසථ වර්ගීකරණයක් විමසා බලමු.

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර මිගාරමාතු ප්‍රාසාද නම්වූ පූර්වාරාමයෙහි වැඩ වසන කල, මිගාර මාතා වූ විශාඛාව එක් පොහෝ දිනයක බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ තමා පෙහෙවස් සමාදන්ව සිටින බව සැලකර සිටියාය. එවිට බුදුරජාණන් වහන්සේ ඇයට උපෝසථ තුනක් පිළිබඳව දේශනා කළහ. එම උපෝසථ තුන නම්,

1. ගෝපාලක උපෝසථය
2. නිගණ්ඨ උපෝසථය
3. අරිය උපෝසථය යන මේ තුනය.

**1. ගෝපාලක උපෝසථය**

විශාඛාවෙනි, ගෝපාලක උපෝසථය කෙසේද. යම් සේ අනායකයන්ගේ ගවයන් බලන ගොපල්ලා සවස් කාලයෙහි ගවයන් ඔවුන් අයිති ස්වාමියාට භාර දී මෙසේ සිතන්නේය. කෙසේද යත්, 'අද ගවයෝ අසවල් අසවල් තැන්හි හැසිරුණහ. අසවල් අසවල් තැන්හි පැන් බීවාහ. හෙට ගවයෝ අසවල් අසවල් තැන්හි හැසිරෙන්නාහ. අසවල් අසවල් තැන්හි පැන් බොන්නාහ' යනුවෙන් සිතයි. විශාඛාවෙනි, එපරිද්දෙන් ලෝකයෙහි පෙහෙවස් සමාදන් වූ ඇතැමෙක් මෙසේ සිතයි. එනම්, 'අද මම මේ මේ කෑ යුතු දෙය කෑවෙමි. මේ මේ පානය කළ යුතු දේ පානය කළෙමි. මම හෙට මේ මේ කෑ යුතු දේ කන්නෙමි. මේ මේ පානය කළ යුතු දේ බොන්නෙමි' සිතයි. ඔහුගේ ඒ ලෝභයෙන් අභිධ්‍යා සහගත (දැඩිසේ ඇල්මා ගැනීමෙන්) සිතින් දවස ඉක්මවයි. විශාඛාවෙනි, මේ ගෝපාලක උපෝසථයයි.

විශාඛාවෙනි, මෙසේ වසන ලද ගෝපාලක උපෝසථය මහත් ඵල ඇත්තේ නොවෙයි. මහානිසංස ඇත්තේ නොවෙයි. මහත් වූ විපාක ඇත්තේ නොවෙයි.

**2. නිගණ්ඨ උපෝසථය**

විශාඛාවෙනි, නිගණ්ඨ උපෝසථය කෙසේද. නිගණ්ඨ නම් ශ්‍රමණ වර්ගයක් ඇත. ඔවුහු ඔවුන්ගේ ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත්. කෙසේද යත්, 'පින්වත, මෙහි එව. පූර්ව දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. පශ්චිම දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. උතුරු දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. දකුණු දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම් ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව' යනුවෙන් සමාදන් කරවයි.

මෙසේ සමහර සතුන් කෙරෙහි කරුණාව පිණිස, අනුකම්පාව පිණිස සමාදන් කරවත්, සමහර සත්වයන් කෙරෙහි අකරුණාව පිණිස, අනනුකම්පාව පිණිස සමාදන් කරවත්. ඔවුහු පොහෝ දිනයෙහි ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත්. එනම්, 'පින්වත් පුරුෂය, මෙහි එව,

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

සියලු වස්තු බහා තබා, මම කිසි තැනක කිසිවෙකුට (බැඳීම් ඇත්තෙක්) පලිබෝධ නොවෙමි. මට කිසි තැනෙක්හි, කිසිවම් දෙයෙක්හි පලිබෝධයක් නැතැයි කියා' යනුවෙනි. එහෙත් ඔහුගේ මවුපියෝ මේ අපගේ පුතුයා යැයි දනිත්. ඔහු ද මේ මගේ මවුපියෝ යැයි දනිත්. ඔහුගේ අඹු දරුවෝ ද මේ අපගේ පෝෂා කරන්නා යැයි දනිත්. ඔහු ද මේ මගේ අඹුදරුවෝ යැයි දනිත්. ඔහුගේ දැසි දස් කම්කරුවෝ ද මේ අපගේ ස්වාමියා යැයි දනිත්. ඔහු ද මේ මගේ දැසි දස් කම්කරුවෝ යැයි දනිත්. මෙසේ යම් කලෙක සත්‍යයෙහි සමාදන් කරවිය යුත්තාහු ද එකල බොරුවෙහි සමාදන් කරවත්. මේ ඔහුගේ අදින්නාදානය (සොරකම) යයි කියත්. විශාඛාවෙනි, මේ නිගණ්ඨ උපෝසථය වෙයි.

විශාඛාවෙනි, මෙසේ වසන ලද නිගණ්ඨ උපෝසථය මහත් ඵල ඇත්තේ නොවෙයි. මහත් ආනිසංස ඇත්තේ නොවෙයි. මහත් බැබළීම් ඇත්තේ නොවෙයි. පැතිරුණු විපාක ඇත්තේ නොවෙයි.

**3. අරිය උපෝසථය (මෙහි ප්‍රභේද කිහිපයක් ඇත.)**

**බුදුගුණ සිහි කිරීම**

විශාඛාවෙනි, ආර්ය උපෝසථය මෙසේය. එනම්, කෙලෙසුන්ගෙන් කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. කිලිටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කරන්නේ මෙසේය. මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකයා බුදුගුණ සිහිකරන්නේය. එනම්, 'ඒ භාගවතුන් වහන්සේ අර්හත්ය, සම්‍යක් සම්බුද්ධය, විද්‍යාචරණසම්පන්නය, සුගතය, ලෝකවිදූය, අනුත්තරය, පුරිසදම්මසාරථීය, දෙව්මිනිසුන්ට ශාස්තෘය, බුද්ධය, භාගවත්ය' යනුවෙන් තථාගතයන් වහන්සේ සිහි කරයි ද, තථාගතයන් වහන්සේ සිහිකරන්නා වූ ඔහුගේ සිත පහදියි. සතුට උපදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් ද ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, කිලුටු වූ හිස, තෙල්පිටි කල්කය නිසාත්, මැටි නිසාත්, ජලය නිසාත්, ඊට සුදුසු වූ පුරුෂයාගේ උත්සාහය නිසාත් උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. (මෙය එකල හිසෙහි වූ අපවිත්‍ර දෑ පහකිරීම හෙවත් හිස පිරිසිදු කිරීම සඳහා භාවිතා කළ උපක්‍රමයකි) මෙසේ කිලුටු වූ හිස උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. එපරිද්දෙන්ම කිලුටු වූ සිත බුදුගුණ සිහිපත් කිරීම තුළින් පිරිසිදු වෙයි. තථාගතයන් සිහිකරන්නා වූ ඔහුගේ සිත පහදියි. සතුට උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් ද ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, මේ ආර්ය ශ්‍රාවකයා බ්‍රහ්ම උපෝසථය වසන්නේ වෙයි. තථාගතයන් නමැති බ්‍රහ්මයා හා සමග වසන්නේ වෙයි. තථාගතයන් නමැති බ්‍රහ්මයා උදෙසා සිත පහදවයි. ප්‍රීතිය උපදවයි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්.

**ධර්මය සිහිකිරීම**

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකයා, 'භාගවතුන් වහන්සේ විසින් ධර්මය මනාව දේශනා කරන ලදී, මේ ආත්මයේම ලබන ලද ඵල ඇත්තේය, අකාලිකය, ඒහිපස්සිකය, ඕපනයිකය, නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුතු යැයි' ධර්මය සිහි කරයි ද, මෙසේ ධර්මය සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. සතුට උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, කිලුටු වූ ශරීරය, කුරුවින්ද ගල් සුණුවලින් සාදන ලද ඇඟ උලන ගල නිසාත්, ඇඟ ගාන සුණු නිසාත්, ජලය නිසාත්, ඊට සුදුසු වූ පුරුෂයාගේ උත්සාහය නිසාත් උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයිද, (මෙය ද එකල ශරීරය පිරිසිදු කිරීම සඳහා භාවිතා කළ උපක්‍රමයකි) මෙසේ කිලුටු වූ කය උපක්‍රමයෙන් පිරිසිදු කරන්නේ යම් සේද, එපරිද්දෙන්ම කිලුටු වූ සිත ධර්මයේ ගුණ සිහිපත් කිරීම තුළින් පිරිසිදු කළ යුතුය. ධර්මය සිහිකරන්නා වූ ඔහුගේ සිත පහදියි. සතුට උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් ද ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, මේ ආර්ය ශ්‍රාවකයා ධර්ම උපෝසථයෙහි වසයි. ධර්මය හා සමග වසය කරයි. ධර්මය අරභයා ඔහුගේ සිත පහදියි, ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහ වෙත්. මෙසේ වනාහි කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

**සංඝරත්නය සිහිපත් කිරීම**

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකයා, 'භාගවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම සුපටිපන්නය. භාගවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම උජුපටිපන්නය. භාගවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම ඤායපටිපන්නය. භාගවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම සාමීචිපටිපන්නය. යම් ඒ පුරිසයුග සතරක් ද, පුරුෂ පුද්ගලයෝ අටදෙනෙක් ඇත්තාහු ද, භාගවත්හුගේ ඒ ශ්‍රාවක සංඝ තෙම ආහුණෙය්‍යය වෙයි ද, පාහුණෙය්‍යය වෙයි. දක්ඛිණෙය්‍යය වෙයි. අඤ්ජලිකරණීය වෙයි. ලෝකයාගේ අනුත්තර පුණ්‍යක්ෂේත්‍රය වෙයි' යනුවෙන් සංඝරත්නය සිහි කරයි ද, එසේ සංඝරත්නය සිහිකරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, යම්සේ අපිරිසිදු වස්ත්‍රය, උණුසුම නිසා ද, අළුසාරම් නිසා ද, ගොම නිසා ද, ජලය නිසා ද, පුරුෂයාගේ ඊට සුදුසු වෑයම නිසා ද උපක්‍රමයෙන් පිරිසිදු වේ ද (මෙය ද එකල වස්ත්‍ර පිරිසිදු කිරීම සඳහා භාවිතා කළ උපක්‍රමයකි) එපරිද්දෙන්ම කිලුටු වූ සිත සංඝරත්නයේ ගුණ සිහිපත් කිරීම තුළින් පිරිසිදු කළ යුතුය. මෙසේ සඟගුණ සිහිපත් කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, ඒ ආර්ය ශ්‍රාවකයා සංඝ උපෝසථයෙහි වාසය කරයි. සංඝයා හා සමග වාසය කරයි. සංඝයා අරභයා ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්. මෙසේ වනාහි කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි.

**පිරිසිදු සීලය සිහි කිරීම**

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකයා කඩ නොවූ සිදුරු නොවූ කැළැල් නොවූ තෘෂ්ණාවට යටත් නොවූ, නුවණැතියන් විසින් ප්‍රශංසා කරන ලද, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අල්වා නොගන්නා ලද, සමාධිය පිණිස පවත්නා තමාගේ සීලය සිහි කරයි ද, සීලය සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, කිලුටු වූ කැඩපත තෙල් නිසාත්, අළු නිසාත්, බුරුසුව නිසාත්, පුරුෂයාගේ ඊට සුදුසු වූ උත්සාහය නිසාත් යම්සේ උපක්‍රමයෙන් පිරිසිදු වන්නේ ද (මෙය ද එකල කැඩපත පිරිසිදු කිරීම සඳහා භාවිත කළ උපක්‍රමයකි) එමෙන්ම කිලුටු වූ සිත කඩ නොවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළැල් නොවූ, තෘෂ්ණාවට යටත් නොවූ, නුවණැතියන් විසින් ප්‍රශංසා කරන ලද, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අල්වා නොගන්නා ලද සමාධිය පිණිස පවත්නා තමාගේ සීලය සිහි කිරීම තුළින් සිත පිරිසිදු වෙයි. සීලය සිහිකරන ඔහුගේ සිත පහදියි, ප්‍රීතිය උපදියි, ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්.

මෙසේද ආර්ය උපෝසථය සමාදන්ව වාසය කරන ආර්ය ශ්‍රාවකයා පොහෝ දිනය අර්ථවත් කරගන්නේය. සඵල කරගන්නේය. උභයාර්ථසිද්ධිය ලඟා කරගන්නේය. නිර්වාණගාමී ප්‍රතිපදාව පිළිපන්නේ වන්නේය. මෙසේ වදාළ බුදුරජාණන් වහන්සේ එම දම් දෙසුම නිමකළ සේක. විශාඛා මහෝපාසිකාව එය සතුටින් පිළිගත්තාය.

1. ගොපාලෝපෝසථය - කෑ බී දේ ගැන සිතමින් ලෝභීව දවස ගෙවීමය (මෙය අනුන්ගේ හරක් බැලීම වැනිය)
2. නිගණ්ඨෝපෝසථය - අන් අයට පෙන්වීම පිණිස රැවටීමෙන් දවස ගෙවීමය
3. අරියෝපෝසථය - තෙරුවන් ගුණ හා තමාගේ සිල්ගුණාදිය ගැන සිතමින් දවස අර්ථවත්ව ගතකිරීම වන්නේය.

යමෙක් අඩාලවම් පංචසීලය ආරක්ෂා කරන්නේ නම්, ඔහු සිල්වතෙකි. ඔහු ගතකරන සිහි ජීවිතය සාර්ථක මෙන්ම ධර්මානුකූල ජීවිතයකි. පොහෝ දිනයන්හි, පෙහෙවස් සමාදන් වීම හෙවත් සිල් සමාදන් වීම තුළින් එය ආර්ය උපෝසථය දක්වා දියුණු කරගත හැකිය. ආගමික චාරිත්‍රයක් වශයෙන් බොහෝ දෙනෙක් සිදු කරන මෙම කටයුත්ත අර්ථවත්ව ගතකරන්නේ කීදෙනෙක් ද යන්න සිතා බැලිය යුතුව පවතී. සිල් සමාදන් වීමෙන් අර්ථවත් කරන්නේ බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ ප්‍රතිපත්ති පූරණයෙහි යෙදෙනවා මෙන්ම නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව ද සම්පූර්ණ කිරීමයි. අප සමාජයෙහි බොහෝ දෙනෙක් සිල් සමාදන් වීම වයසට ගිය අයගේ කටයුත්තක් ලෙස සලකති. වයසට ගිය විට යමක් කමක් කිරීමට නොහැකි ලෙස අසහය වැඩුනු කොටුණු කළ, සිහිය සිහි අඳුරින් නොපිහිටන කළ සිල් සමාදානයෙන් ඇති ඵලය කුමක් ද, එය අවබෝධයෙන් කරන්නක් ද, එසේ නැතිනම් සමාජාපවාදයෙන් මිදීමට හෝ මරණබියෙන් කරන ලද්දක් දැයි සිතා බැලිය යුතුය.

බුදු දහම අගය කරනුයේ අවබෝධයෙන් කරන සිල් සමාදානයයි. ඒ සඳහා වයස් භේදයක් නොවන අතර අවශ්‍ය වන්නේ අවබෝධය හා උත්සාහයයි. ජීවිතයේ නිසරු බව මෙන්ම සසරෙහි ඇති හෝර බව දකින ආර්ය ශ්‍රාවකයා නැම් කල්හිම ශාසන බ්‍රහ්මචර්යාවෙහි යෙදෙමින් ආර්ය සීලය තම දිවි දෙවෙනි කොට ආරක්ෂා කර ගනිමින් අප්‍රමාදව කටයුතු කරයි. එය ඔහුගේ සසර කෙළවර වීමට හෙවත් සත්‍යාවබෝධය ලැබීම සඳහා හේතු වේ. එමැවින් අවබෝධයෙන් සිල් සමාදන් වන ඔබ කළ යුත්තේ ගොපාල හා නිගණ්ඨ චර්යාවන්ගෙන් වෙන්ව, තෙරුවන් ගුණ මෙන්ම තම සීලය පිළිබඳව සිහිපත් කිරීමය. සියලු සතුන් කෙරෙහි මෙත් වැඩීමය. එසේ සිහි කිරීම තුළින් පුහුදුන් සිත්තුළ තැන්පත්ව තිබෙන ලාමක අකුසල පහව ගොස් කුසල ධර්මයන් වර්ධනය වෙයි. මෙය බුද්ධදහමේ උගන්වන ආර්ය උපෝසථයයි. එමැවින් සිල් සමාදන් වන ඔබ අනුගමනය කළ යුත්තේ මේ ආර්ය උපෝසථයයි. එමැවින් නිවැරදි සිල සමාදානය තුළින් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගනිමින්, මෙලොව - පරලොව උභයාර්ථ සිද්ධියම් ඇතිකර ගැනීමට ශ්‍රීමත් දළදා වහන්සේගේ ආශිර්වාදයෙන් ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමු.



## අසූ සය වන වියට එළඹි
# සසුන'ඹර දිදුලන
# අස්ගිරි
# මහානාහිමිපාණන් වහන්සේ

වර්ෂ 2015 වැන්නේ මාර්තු මස 17 වන දින අසූ සය වන වියට එළඹි මහා විහාරවංශික ශ්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ අග්ගමහා පණ්ඩිත, මහෝපාධ්‍යාය, අතිගෞරවාර්හ උඩුගම සද්ධර්මකීර්ති ශ්‍රී ධම්මදස්සි රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේට, කොළඹ ශ්‍රී සම්බෝධි විහාරයේදී එහි ගරු විහාරාධිපති හා බෞද්ධයා රූපවාහිනී නාලිකාවේ සභාපති ගෞරව ශාස්ත්‍රවේදී දරණාගම කුසලධම්ම හිමියන්ගේ මෙහෙයවීමෙන් නිදුක් නිරෝගී සුවපත් භාවය හා චිරජීවනය ප්‍රාර්ථනා කොට පරිත්‍රාණ ධර්ම දේශනාවක් හා සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමේ පුණ්‍ය මහෝත්සවයක් විශාල ජන සහභාගිත්වයක් ඇතිව එදින මහත් උත්කර්ෂවත් ලෙස පැවැත්විණ.

අතිපූජනීය අප නාහිමිපාණන් වහන්සේ ඓතිහාසික රාජධානියක් මෙන්ම, අතිඋත්තම ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටීමෙන් ශ්‍රේෂ්ඨත්වයට පත් වූ ඇතුගල්පුර, වාරියපොල, කළුගමුව ජනපදයේ උඩුගම ග්‍රාමයේ ගුණවත්, කුලවත්, දයාබර දම්පතීන් යුවලකගේ අභිජාත පුත්‍ර රත්නයක් ලෙස ව්‍යවහාර වර්ෂ 1930 මාර්තු මස 17 වන දින ජන්ම ලාභය ලැබූහ. අනතුරුව දෙගුරුන්ගේ සෙනෙහස නොඅඩුව ලබමින් ගුණ නුවණින් වැඩෙමින් සසුන් ලැදිව, සත්සිය වසරකටත් වැඩි ඉතිහාසයක් ඇති අස්ගිරි මහාවිහාර පාර්ශවයේ පැවිද්ද ලබා බණ දහම් මැනවින් හදාරා, සංඝ ශෝභන ගුණයන්ගෙන් පෝෂිතව පියවරෙන් පියවර ශාසනික පදවිවලින් පිදුම් ලැබූහ. වර්තමානය වන විට අස්ගිරි මහා විහාරයේ මහපදවිය වූ අතිගෞරවාර්හ මහානායක පදවිය හොබවමින්, සසුන'ඹර දිදුලවමින්, ආදර්ශවත් ශාසනික ජීවිතයක් ගත කරන මහා සංඝ පීතෘවරයාණන් වහන්සේ නමකි.

ශ්‍රී දළදා වහන්සේ විෂයෙහි ඉෂ්ට සිද්ධ කෙරෙන දළදා සේවා කටයුතු ඉටු කිරීමට වර්ෂ 1969 සිට භාග්‍ය ලත් අප මහ නාහිමිපාණන් වහන්සේ මහත් ශ්‍රද්ධා භක්තියෙන් දළදා මාලිගාවේ පූජා චාරිත්‍රයන්හි යෙදෙන අතර, එහි ආරක්ෂාව, ගෞරවය, සංවර්ධනය සම්බන්ධයෙන් දක්වන්නේ මහත් සිතැගමකි. ඇපකැප වීමකි.

තමන් වහන්සේ කරා එන කවරෙකුගේ වුවද, තරාතිරම ගැන නොසලකා, උණුවන හදින් යුතුව ඉතා කාරුණිකව ආගිය කරුණු විමසා බලා සරණක් අවැසි කෙනෙකුට සරණ වීම උන්වහන්සේ තුළ පවත්නා සත්පුරුෂ ගුණයකි. වයෝවෘද්ධ, තපෝවෘද්ධ, ඥානෝවෘද්ධ, ගුණෝවෘද්ධ අස්ගිරි මහ නාහිමිපාණන් වහන්සේ කිව යුත්ත කාට වුවද නොබියව ප්‍රකාශ කරන, කවර ප්‍රශ්නයකදී වුව ලාභාපේක්ෂාවෙන් තොරව සෘජු ප්‍රතිපත්තියෙහි පිහිටා කටයුතු කරන මහා යතිවරයාණන් වහන්සේ නමකි.

තම උතුම් පැවිදි දිවිය ශාසනික, ජාතික, සාමාජික සත්කාර්යයන්ට කැපකොට ඇති මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශවයේ අග්ගමහා පණ්ඩිත මහෝපාධ්‍යාය අතිගෞරවාර්හ උඩුගම සද්ධර්මකීර්ති ශ්‍රී ධම්මදස්සි රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වනාහි සසුන'ඹර දිදුලන පහන් තරුවක් සේ අස්ගිරි මහා විහාරයට පමණක් නොව සමස්ත සංඝ සමාජයේම ගෞරවයට හා සම්භාවනාවට පාත්‍රව වැඩ සිටින්නාහ. අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේට තවදුරටත් ලෝක ශාසනික සේවය හා දළදා සේවා පූජෝපහාරය අඛණ්ඩව ඉෂ්ට සිද්ධ කිරීමට හැකිවන සේ ආයුරාරෝග්‍ය සම්පත්තිය ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශිර්වාදයෙන් නොමඳව හිමිවේවායි 'දළදා වරුණ' ආශිංසනය කරයි.

**කේ. මීගහකුඹුර**

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් මිදුණු සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

# බොදු ජනයාට නැතිවම බැරි බුලත



නාග ලොවේ නාග වල්ලි නමින් සිහි වූ බුලත චූලෝදර මහෝදර යුද්ධය පැවැති සමයේ නාග ලොවින් මෙලොවට පැමිණි නාගයන් අතර සිටි නාග කන්‍යාවියක් බුලත මනුෂ්‍ය ලෝකයට ගෙනා බව ජනප්‍රවාදයේ කියැවේ. නාග කන්‍යාවිය බුලත ගෙදට නමා කටේ තබාගෙන ඒම නිසා ඇගේ විෂ බුලත් කොළයේ තැවරී ඇතැයි සිතා අදත් බුලත් විට කන ඇතැම් අය බුලත් කොළයේ අගත්, බුලත් නඩා දමා කෑමට ගනී.

බුලතේ උපත පිළිබඳ ජනශ්‍රැතියේ මෙසේ සඳහන් වන්නේ බුලත ශ්‍රේෂ්ඨ වස්තුවක් බව කියා පෑමට විය යුතුය. අප බෝසතාණන් වහන්සේ බුද්ධත්වය පතා පෙරුම් පුරමින් සසර සැරිසරන කාලයේ නාගයකුව ඉපිද සිල් රකිමින් භාවනාවේ යෙදෙමින් සිටියේය. මෙම නාගයාගේ සිල්වත්කම කොපමණදැයි පරීක්ෂා කිරීමට සිතූ සක් දෙවියන් මිනිස් වෙස් ගෙන නාගයා ළඟට පැමිණියේය. තමාට කුසගිනි බවත්, කෑමට යමක් දෙන ලෙසත් මිනිස් වෙස් ගත් සක් දෙවියන් නාගයාගෙන් ඉල්ලුවේය. තමාට දීමට දෙයක් නැති නිසා තමා මරා මස් කන්න යැයි නාගයා මිනිසාට කීවේය. මිනිසා ගින්නක් දල්වා නාගයාට එයට පනින ලෙස කීවේය. නාගයා ගින්නට පනින්නට සූදානම් වෙන විටම මිනිස් වෙස අතහැර නියම වේශයෙන් පෙනී සිටි සක් දෙවියන් නාගයාගේ සීලය පරීක්ෂා කිරීමට ආ බව කියා නාගයාගේ සිල්වත් බවට උපහාරයක් ලෙස ලොවටම පෙනෙන ආකාරයට උගේ රූපය හඳේ සිත්තම් කළේය. එසේ සිත්තම් කර ඉවත දැමූ තෙලිතුඩ කැරකී ගොස් නාග ලෝකයට විසි වී ගොස් නාග රාජිනියගේ මුඛයේ ඇනී ඇය මරණයට පත් වූවාය. එසේ මියගිය ඇය මිහිදන් කළ තැන දෙපසින් කොළත්, කඳින් වැලක්, හිසින් දල්ලත් සහළ වූ බව දඹුර උපත කවියෙන් වැඩිදුරටත් විස්තර කරයි.

බුලත මිනිසා අතට පත්වූයේ කවදාද, කෙසේද යන්න නිශ්චය වශයෙන්ම කීමට අපහසු වූවත් ගිලිමලෙන් ඇත දත සුද්දෝ යන වැකියෙන් බුලතේ උපත අතීතය කරා ගෙන යන අතර ගිලිමලේ ප්‍රදේශයේ බුලත වගා කළ බවට ඉඟියක් දෙන්නේය.

පුරාණයේ නිවසක දරුවකු උපන්න වහාම බුලත් අතක් (කොළ 20) ගෙන නැකැත් රාළ හමුවීමට යන්නේය. ඒ අප ජීවිතයේ පළමු වරට බුලතේ අවශ්‍යතාවයි. ඉඳුල් කටගෑම, ගුරු ගෙදරට යෑම, ගැහැනු ළමයකු නම් වැඩිවියට පත් වූ විට බුලතට විශේෂ තැනක් හිමිවේ. ඊට පසු විවාහ මංගල කටයුත්තේදී බුලතට හිමිවන්නේ උසස්ම ගෞරවයයි. ඥාති පිරිස මනාලියගේ නිවසට පැමිණීමට පෙර පැමිණෙන පිරිසට සමගාමී බුලත් කොළ ප්‍රමාණයක් මනාලියගේ නිවසට දිය යුතුය. ඒ පැමිණෙන පිරිස කොපමණදැයි දැනුම් දීම පිණිසය. ඊට පසු නිවසට පැමිණි ඥාතීන්ට බුලත් හෙප්පුව පිළිගන්වන්නේ බුලත් හපමින් සතුටු සාමීචියේ යෙදීමටය.

මනාල යුවළ පෝරුවේ නැගීමෙන් පසු බුලත් කොළ හතක් පෝරුවට දැමීමට සිදුවේ. ඒ වගේම පෝරුවේ උඩු වියනේ බුලත් අතු එල්ලා තැබිය යුතුවා මෙන්ම මනාලයා විසින් බුලත් කොළයක දවටා කුටු පඩුරක් පෝරුවට දැමිය යුතුය. පසුව ඥාතීන්ටද බුලත් දීමට සිදුවේ. මෙසේ අද අප ජීවිතයේදී සෑම වැදගත් අවස්ථාවකදීම බුලත අවශ්‍ය දෙයකි. සෞභාග්‍යය, ආලෝකය සහ ආශිර්වාදය බුලතේ ගැබ් වී ඇතැයි අපේ පැරැන්නෝ විශ්වාස කළෝය.

ආගමික චාරිත්‍ර කිරීමේදී බුලත නැතුවම බැරි උතුම් වස්තුවකි. බණට, පිරිතට,



දානයට ආරාධනය කිරීමට සංඝරත්නයට බුලත් අතක් පිළිගැන්විය යුතුය. එසේම වස් විසීමට සංඝරත්නයට ආරාධනා කරන්නේද බුලත් අතක් පිළිගන්වමිනි. මියගිය අයකුට අවසන් ගෞරව දක්වීමට මළ ගෙදරකට ගොඩවන ගැමියා බුලත් හුරුල්ලක් ගෙන යෑමට අමතක නොකළේය. ඒ එදා තිබූ සංස්කෘතික ලක්ෂණයකි. මෙම සිරිත අද අභාවයට යමින් පවතී. සිංහල අලුත් අවුරුදු දා වැඩිහිටියන් බැහැ දැකීමට යන්නේද බුලත් හුරුල්ලක් අතැතිවය. පෙරදා වූ තරහ මරහ අමතක කරලන්නේ බුලත් හුරුල්ලක් දී සමාව ගැනීමෙනි. අද ලියුම් කවරයක දමා මුදල් ගනුදෙනු කළත් එදා මුදල් ගනුදෙනු කෙරුණේ බුලත් කොළයක තබමින්ය. අද ආරාධනා පත්‍රයකින් මංගල කටයුතු ගැන මතක් කිරීම කළද එදා මඟුල් උත්සවයට ආරාධනා කළේ බුලත් කොළයක් සුදු පිරුවටයකින් ඔතා තබා අවශ්‍ය තැනැත්තාට පිළිගන්වමිනි. මෙසේ බුලත ශුද්ධ වස්තුවක් ලෙස සැලකූ එදා ජනයා සෑම සාමාජික මෙන්ම ආගමික උත්සවවලදී බුලතට මුල් තැන දුන්හ.


රෝග නිවාරණ ඖෂධයක් ලෙසටද බුලත ප්‍රයෝජනයට ගනී. වමනය නිවාරණ ගුණයක් බුලත් සැපීමෙන් ලබාගත හැකිය. නිදිමත ගතිය දුරු කිරීමේ බලයක් බුලතට ඇති බැවින් පිරිත් දේශනාවලදී සංඝයා වහන්සේලා බුලත් විට වළඳන්නේ එබැවිනි. ඒ වගේම රාත්‍රී කාලයේදී රිය පදවන රියැදුරු මහතුන් බුලත් විට හපන්නේ නිදිමත අහෝසි කරගැනීම පිණිසය. දේශීය වෛද්‍යවරු මහේ අක්ෂිවලට බුලත් ඉස්මෙන් කල්ක බීමට දෙනවා මෙන්ම සෙම රෝගීන්ට බුලත් ඉස්මෙන් නස්‍ය කරන අවස්ථාද තිබේ. මෙසේ රෝග නාශක ගුණයක් ඇති බැවින් වෛද්‍ය ග්‍රන්ථවල බුලත හඳුන්වනු ලබන්නේ "මුඛ රෝග හරණ" යන නාමයෙනි. බුලත් හැපීමෙන් විඩාව සංසිඳවන බැවින් ශ්‍රමභංජන යනුවෙන් හඳුන්වන බුලතේ රේඛා හතක් ඇතැයි යන අර්ථ දෙන "සප්ත සිරා" යන පර්යාය නාමයෙන්ද හඳුන්වනු ලබයි.

මෙසේ උපන් දා සිට මැරෙන තුරු කරන කටයුතු වන ආගමික සංස්කෘතික මෙන්ම සමාජයේ සෑම කටයුත්තකදීම සහ මියගිය පසු කරන ආගමික චාරිත්‍රවලදීද අපට අවශ්‍ය වන බුලත අපට නැතුවම බැරි උසස්, උතුම් ශුද්ධ වස්තුවක් ලෙස සැලකිය හැකිය.

**සෝමපාල මෙනේරිපිටිය**



"සුචරිතයෙහි හැසිරිය යුතුය, දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය, ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



# අලුත් අවුරුදු සිරිත් විරිත් නිසා පෝෂණය වන බෞද්ධ ශිෂ්ටාචාරය

සිරිලක සැම දෙන සතුටු වන ප්‍රධාන උත්සවය සිංහල අලුත් අවුරුදු උත්සවය බව අවිවාදයෙන් සම්මත වන්නේ එය වටා ඇති පොදු ලක්ෂණ නිසාය. සිංහල, හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් යන සැම පුරවැසියාටම තම අනන්‍යතාවට හානි නොවන අයුරින් විවෘත හදවතින් මෙයට සම්බන්ධ වන්නට හැකි වන්නේය. එහෙත් මෙහි ක්‍රියාත්මක වන සිරිත් විරිත් වසර දහස් ගණනක් තුළ දේශීයත්වයෙන් පුරුදු පුහුණු ඒවා නිසා සිංහල ජාතියට ආවේණික ජීවන රටාවට සුවිශේෂ සම්බන්ධයක් විදහාපාන වන්නේය.

ඉර හඳ, අහස පොළොව කේන්ද්‍ර කරගෙන තම තමන්ගේ ජීවන රටාව සකස් කරගැනීම ලොව සැම ජාතීන්ගේම පොදු ප්‍රවණතාව වන අතර රටින් රටට, ජාතියෙන් ජාතියට පරිසරය අනුගතව එය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වන්නේය.

සිංහල ජාතියත්, බුද්ධාගමත් එකිනෙකට සම්බන්ධව පවතින අයුරු මෙම අලුත් අවුරුදු සමයේ ක්‍රියාත්මක වන සිරිත් විරිත්වලින් ප්‍රකාශ වන්නේය. ලංකාවේ දේශගුණය, කාලගුණය අනුව ගොඩමඩ ගොවිතැන් සරුසාරව අස්වනු නෙළාගෙන, අටුකොටු පුරවා මසකට අඩු කාලයක විවේකයක් කල් යවන වසන්ත සමයේ බක්මහ උළෙල සැපත් වන්නේය. සූර්ය මණ්ඩලය වසරක් ගමන් කොට මීන රාශියෙන් මේෂ රාශියට සම්ප්‍රාප්ත වීමෙන් අලුත් අවුරුදු සුබ කාලය පැමිණෙන්නේය.

කාලය තත්පරයක් පාසා අයින් වන අතර පැමිණෙන මොහොත සුබ හෝ අසුබ වශයෙන් නිර්ණය වන්නේ එම මොහොතේ පවත්නා ග්‍රහචාරය අනුවය. එහෙත් එය ප්‍රත්‍යක්ෂයෙන් දැනගන්නා යාන්ත්‍රණයක් තවම බිහිවී නොමැති නිසා ඇතැම් අයගේ අනුමානික නිගමන වැරදි වන්නට පුළුවන. පොදු සම්මතය අනුව පිහිටා ක්‍රියා කිරීම අලුත් අවුරුදු සමය තුළ ඥානාන්විත වන්නේය.

අලුත් අවුරුදු සමයේ අලුත් සඳ බැලීමේ පටන් අනුපිළිවෙළට ස්නානය කිරීම, සංක්‍රාන්තිය, අලුත් වස්ත්‍ර ඇඳීම, නොනගතයට පන්සල් වෙහෙර විහාර, දේවාලවලට ගොස් ආගමික කටයුතු කිරීම, ගිනි මෙලවීම, ආහාර පිසීම, ආහාර අනුභවය හා ගනුදෙනු කිරීම, වැඩ ඇල්ලීම, හිස තෙල් ගෑම, රැකියා සඳහා ගෙයින් පිටවීම.

මෙවන් ක්‍රියාවලියක් සහිත උත්සව සමයක් වෙනත් ජාතියක, ආගමක නැති නිසාම සිංහල ජාතියේ අනන්‍යතාව මූර්තිමත් කරන අනගි කාලපරිච්ඡේදයක් අලුත් අවුරුදු සමයේ පැමිණීම

විශේෂයෙන් සිංහල ජාතියට මෙන්ම පොදුවේ ලාංකිකයන්ට වාසනා බලමහිමයකි.

සිංහල අලුත් අවුරුද්ද තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන කාර්යයන්.

1. **ගෙවල් දොරවල් පවිත්‍ර කිරීම**
2. **පාරම්පරික රසකැවිලි උයාපිහා ගැනීම**
3. **නෑගමන් යාම**
4. **කෙළි සෙල්ලම් කිරීම**
5. **ආගමික වතාවත් සිදුකිරීම**
6. **ඉස තෙල් ගෑම.**

මෙසේ සුලුමනත් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන අපමණය. ලෝකයේ පවත්නා සෑම උත්සවයක්ම පරපුරෙන් පරපුරට ගෙනයන්නේ ආගමික හෝ ජාතික නිමිත්තක් පෙරදැරි කරගෙනය. කාලාන්තරයක් මුළුල්ලේ කරගෙන යනවිට පශ්චාත් ජනතාව නිරායාසයෙන් එයට මැදිහත් වන්නේය. එයින් ලබන ආශ්වාදය මනෝභාවයන් තුළින් ප්‍රකාශ වෙන විට නිතැතින් රතිඤ්ඤා පත්තු කිරීම, රබන් ගැසීම, ඔන්චිලි පැදීම ආදී ක්‍රියාවන්ට සාමූහිකව සහභාගී වන්නේය.

මිනිසාගේ මනුෂ්‍ය ගති මූර්තිමත් වන්නේ සාමූහිකත්වය තුළිනි. ආගම් දහම් එයට ප්‍රධාන නිමිත්ත වනවිට ආධ්‍යාත්මික ගුණයක් වහනය වන්නේය. අලුත් අවුරුදු උත්සව කාලය තුළ විශ්වයේ පොබාදහම් පිළිබඳ බලශක්තියක්, ආගම් දහමෙන් ලබන ශාන්ත ගුණයක් එකට සම්මිශ්‍රණය වන විට ලාංකිකයන්ගේ උදාර ගතියක් ප්‍රකට වන්නේය.

සමගිය සම්පන්න ගෙදරක්, ගමක්, පළාතක්, රටක් එක්වන්ට, එකම වේලාවකට ආහාරපාන සකස් කිරීමේදී පෞද්ගලික කාර්යයන් මෙන්ම ආගම් දහම් පිළිපිරීම, නෑ ගමන් යාමේදී පොදු කාර්යයන්ද සිදුකිරීමෙන් ලාංකික ජනතාව ලොවට පෙන්වන පරමාදර්ශය මෙම අලුත් අවුරුද්දෙන් ලබන ප්‍රධානතම ප්‍රයෝජනයයි. කෙනකුගේ චිත්ත සන්තානයෙන් ප්‍රසාරණය වන මානසික තරංග ප්‍රසන්නව, විවෘතව තමා ඉදිරියේ සිටින්නාගේ මනසට ඇතුල් කරන්නට හැකිනම් එය උතුම් මිනිස් දහමකි. "සුබ අලුත් අවුරුද්දක් වේවා" යන වචන හතරේ ඉතා පුළුල් අදහසක් ඇතුළත්ව ඇති අතර එයින් ලබන වසර පුරාවට සුදුමනත් ක්‍රියාවන්ටම සම්බන්ධව වන්නේය.


පැවිදි උතුමන්ගෙන් දායකයන්ට, දෙමව්පියන්ගෙන් දූ දරුවන්ට, ගුරුන්ගෙන් ශිෂ්‍යයන්ට, වැඩිහිටියන්ගෙන් බාලයන්ට, ස්වාමියාගෙන් සේවකයන්ට, යාළු මිතුරු මිතුරියන්ට ඉතා සිහින් සිතින, පතන ප්‍රාර්ථනාවන් ගෙනවන්නට මානව පරපුර තවත් මතු පරපුරක් අතර සීමාවන් නැති මහා අගාධයක් ඇතිවන්නේය. මෙය ලංකාවේ සිදුවන්නේ අලුත් අවුරුදු උත්සව කාලපරිච්ඡේදයේ බව ප්‍රත්‍යක්ෂ වන්නේය.

බුදු පසේබුදු මහරහතන් වහන්සේලා පවා තමන් වහන්සේලාගේ එම ලොවුතුරු පදවි තනතුරු ලබාගත්තේ ප්‍රසන්න, විවෘත හදවත් තුළින් ලබාගත් ප්‍රාර්ථනා බලමහිමයෙනි. විශ්වයේ පවත්නා නිරසර ප්‍රාර්ථනය "බව මතු බුදුවේවා" යන උත්තමතම වාක්‍යයයි. මෙසේ මිනිස් චින්තනාවේ අති ශ්‍රේෂ්ඨතම ප්‍රාර්ථනය පාලි භාෂාවෙන් ප්‍රකාශ වූ අතර විවිධ භාෂාවෙන්, විවිධ ජාතීන් අතර ප්‍රාර්ථනාවන් ව්‍යාප්ත විය.

සිංහල අලුත් අවුරුදු ප්‍රාර්ථනාවන් තරම් අවංක, ප්‍රසන්න ප්‍රාර්ථනා වෙනත් කාලවල ප්‍රකාශ වන්නේ නැත. ආගම්, ජාතිය, කාර්යය, ලාභය, වංචාව ආදියෙන් සංවෘත වූ සිතින් පතන පැතුම් ඉෂ්ට සිද්ධ වන්නේ නැත.

ප්‍රකෘතිකම් හා අයිතිවාසිකම් පිළිබඳ අනොන්‍යන අවබෝධය මෙන්ම ක්‍රියාකාරීත්වයද වෙනත් කාලවලට වඩා ඉතා උනන්දුවෙන් සිදුවන්නේ ආගම්, නක්ෂත්‍ර විද්‍යාව යන විෂය දෙකින්ම මනස ආවරණය වන බැවිනි. ලාංකික ජනතාවගේ පාරම්පරික කෙළි සෙල්ලම් පිළිබඳ උනන්දුව තුළින්ද දේව භක්තිය ප්‍රකට වන්නේය.

කතුරු ඔන්චිල්ලාව, අං ඇදීම, පොරපොල් ගැසීම, ඔළිඳ කෙළිය යන ක්‍රීඩාවන් "පත්තිනි දෙවගන හා සම්බන්ධව වන බැවින් භක්තිය හා ආශ්වාදය එක්වන්ව ප්‍රකාශ වන්නේය. ගැමි සමාජයේ අහිංසක දූ දරුවන්ගේ සමගිය, අවංක විනෝදය ප්‍රකට වන මෙම කෙළි සෙල්ලම් නිසා දෙවි දේවතාවන්ගෙන් මෙන්ම ගුරු දෙගුරු,



වැඩිහිටි සමාජයෙන්ද ලබන ආශීර්වාදය හා අත්දැකීම වසර පුරාවට ජීවනාධාරයට මහත් අනුබලයක් වන්නේය.

ගැමි සුවඳ විහිදෙන්නේ කෙතේ කමතේ, ඇළේ දොළේ, මහගෙට නැසිරෙන, ක්‍රීඩා කරන, කතාබහ කරන, දුව පැන ඇවිදින බාල, තරුණ, වැඩිහිටි අය අලුත් අවුරුදු සමය තුළ නිදහස් සරල චින්තනයෙන් හිසවත් වූ විටය.

ආර්ථික සම්පත් පිරි ඉතිරි යන නිදහස් විවේක බුද්ධියෙන් ආගම්, දහම් සිහිපත් කොට වැඳුම් පිදුම් කරන, කාමය, සමගිය තහවුරු කරන අලුත් අවුරුදු උත්සව මිලාව සොබාදහමින් ලාංකික ජනතාවට දුන් මහඟු දායාදයකි.

**පූජ්‍ය අම්බුණුපුර පියරතන හිමි**



# ඔබේ
## දහම් දැනුම සඳහා

1. බෝසතුන්ගේ පියා - සුද්ධෝදන රජතුමා.
2. බෝසතුන්ගේ මව්තුමිය - මහාමායා දේවිය.
3. සුද්ධෝදන රජුගේ රාජධානිය පිහිටියේ කොහිද? - කපිලවස්තුපුර (කිඹුල්වත්පුර)
4. පස්මහබැලුම් මොනවාද? - කාලය, දිවීපය, දේශය, කුලය, මව.
5. සිදුහත් කුමරුගේ සුළු මව - මහා ප්‍රජාපතී ගෝතමීය.
6. මහා ප්‍රජාපතී දේවියගේ පුතා - නන්ද කුමරු.
7. සිදුහත් කුමරු සඳහා ඉදිකළ මාලිගා තුන - රම්‍ය, සුරම්‍ය, සුභ.
8. සිදුහත් කුමරු විවාහ වූයේ කා සමගද? - යශෝධරා හෙවත් භද්දකච්චානා කුමරිය.
9. යශෝධරා දේවියගේ පියා කවරෙක්ද? - සුප්‍රබුද්ධ රජතුමා.
10. යශෝධරා දේවියගේ සොහොයුරා - දේවදත්ත කුමරු.
11. සිදුහත් කුමරුගේ පුත්‍රයාගේ නම - රාහුල කුමරු.
12. සිදුහත් කුමරුන්ට නිබ්බුත පද කීවේ කවුරුන්ද? - කිසාගෝතමිය.
13. සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්මෙන විට වයස කීයද? - අවුරුදු 29 යි.
14. බුදු බණ අසා මුලින්ම සෝවාන් වූයේ කවුද? - කොණ්ඩඤ්ඤ තවුසා.
15. තුන්බෑ ජටිලයන්ට දේශනා කළ සූත්‍රය කුමක්ද? - ආදිත්ත පරියාය සූත්‍රය.
16. බුදුන්ට ප්‍රථමයෙන්ම ආරාමයක් පූජා කළේ කවිද? - බිම්බිසාර රජතුමා (වේළුවනාරාමය)
17. අටපිරිකරට අයත් දේ මොනවාද? - තනිපට සිවුර, දෙපට සිවුර, අඳනකඩය, පාත්‍රය, දලි පිහිය, ඉඳිකටුව, පටිය, පෙරහන්කඩය.
18. පස්වග මහණුන් කවුරුන්ද? - කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි.
19. බුදුවීමට පෙර සිදුහත් තවුසාට කිරිපිඬු දානය පූජා කළේ කවුද? - සුජාතා සිටු දුව.
20. සිදුහත් තවුසා බුද්ධත්වයට පත්වූයේ කොහිද? - බුද්ධගයාවේ ඇසතු රුකක් යටදී.
21. බුදුන් වහන්සේ පළමු ධර්ම දේශනය කළේ කව්රුන් හටද? - පස්වග තවුසන්ට.
22. චතුරාර්ය සත්‍යය නම් කරන්න - දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මඟ.
23. තුන්බෑ ජටිලයන් කවුරුන්ද? - උරුවෙල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප.
24. ආනන්ද බෝධිය රෝපණය කළේ කොහිද? - සැවැත්නුවර ජේතවනාරාමයේ.
25. බුදුන් අවසන් වරට වස් විසුවේ කොහිද? - බේලුව නම් ග්‍රාමයේ.

නිව්ටන් ගුණසේකර

# පින් - පව්

පින හා කුසල යනු දෙකක්ද, එසේත් නැතිනම් ඇතැම් අය තුළ ප්‍රශ්නයක් පවතින බව පෙනෙයි. ත්‍රිපිටක ධර්මය හෙවත් බුද්ධ වචනය කියවා ලැබූ දැනුමෙන් යුතුව ඒ දෙස බලන විට කෙටියෙන් දිය යුතු පිළිතුර වනුයේ පින හා කුසලය යනු දෙකක් බවයි.

සිද්ධාර්ථ බෝධිසත්ත්වයන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණ කිරීමට සූදානම් වූ විට ලෝකයේ පැවැත්මට එනම් මිනිසුන්, සතුන් ඉපදෙමින්, මැරෙමින් පවතින ක්‍රියාවලියට පක්ෂපාතී වූ මාරයා හෙවත් මාර බලය ඉදිරිපත්ව එතුමන්ගේ ගමන වැළැක්වීමට උත්සාහ කළා. එහිදී කීවේ උතුමාණෙනි යන්න එපා, යන්න එපා. අදින් හත්වැනි දිනයෙහි ඔබතුමන්ට සක්විති රජකම ලැබෙනවා. එවිට බොහෝ පින් කළ හැකියි යනුවෙනි. බෝසතාණන් වහන්සේගේ පිළිතුර වූයේ මට මහ පින්කම් නොව කුඩාම පිනකින් වුවද වැඩක් නැත. (අනුමත්තෙනාපි පුඤ්ඤෙන අත්ථො මය්හං න විජ්ජති) යනුයි.

එයින් ප්‍රකාශිත අර්ථය වනුයේ, ලොව තුළ සිටින අයට පින්වලින් පලක් ඇති නමුත් ලොවින් බැහැර වන අයට නිවනට යන අයට පිනෙන් පලක් නැති බවයි.

රහතන් වහන්සේ ගැන සඳහන් කරද්දී පුඤ්ඤපාප පහීණයා යනුවෙන් උන්වහන්සේ පින්-පව් දෙකම ප්‍රහීණ කළ බව දේශනාවෙහි සඳහන් වෙයි. එසේ දෙවතාවෙක් බුදුරදුන් වෙත පැමිණ ජීවිතය ටික ටික මරණයට ළංවෙනවා. මිනිසාගේ ආයුෂද ඉතාම අඩුයි. ජරාවට පත්වූ අයට පිහිටක් නැත. මේ බිය හා මරණය ගැන සලකා සැප ගෙන දෙන පින්කම් කළ යුතු යැයි පැවසුවා. මුලින් කී කාරණය එලෙසම කියූ බුදුරජාණන් වහන්සේ,

"පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි" යන්න වෙනුවට "ලෝකාමිසං පජහෙ සන්තිපෙක්ඛො" යනුවෙන් සැප ගෙන දෙන පින්කම් කරනු වෙනුවට ශාන්තිය (නිවන) අපේක්ෂාවෙන් ලෝකාමිසය අත් හළ යුතු බව අවධාරණය කළහ.

පුඤ්ඤංචෙ පුරිසො කයිරා
කයිරාථේනං පුනප්පුනං
තම්හිච්ඡන්දං කයිරාථ
සුඛෝ පුඤ්ඤස්ස උච්චයො

යන දේශනාවෙන් පැහැදිලි කරනුයේ ඉදින් මිනිසෙක් පින් කරන්නේ නම් නැවත නැවත කළ යුතුයි. කුමක් හෙයින්ද යත් පින් වැඩීම නිසා සැප ගෙන දෙන බැවින් පවකින්. මේ අනෙක් පැත්තද දේශනා කර ඇත. එනම් පව් කරන්නේ නම් නැවත නැවත නොකළ යුතුයි. කුමක් හෙයින්ද පව් වැඩීම දුකට හේතුවන නිසයි. පව් නොකිරීම ගෙනෙන පින නිවීමද නැතැයි බුදුන් වහන්සේගේ

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අසිගතු යමෙක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

# ප්‍රහීණ කරන්නේ කුසලය වැඩූ රහතන් වහන්සේයි

දේශනාවෙහි අවධාරණය වෙයි.

යමෙක් පිනක් කළොත් එය අනුන්වද අනුමෝදන් කළ හැකිය. පින් දීම දස පින් කිරිය වත්වලින් එකක් ලෙසද දක්වෙයි. ලෝකය තුළ හැසිරෙන අයට පින අවශ්‍යයි. ඒ නිසා තමන් කරගත් පිනක් අනෙක් අයටද බෙදාදීම යනු ලෝකයක චාරිත්‍රයකි. ගිහියන්ට පමණක් නොව පැවිද්දන්ටද පින උපකාර වෙයි. ඒ බව ගිහි භූතස්සපි උපකාරානි පුඤ්ඤානි පබ්බජිතස්සපි උපකාරානි පුඤ්ඤානි යනුවෙන් දේශනාවෙහි සඳහන් වෙයි. මොන තරම් සීලවන්තව සිටියද පින් නොවැඩුවේ නම් පින අවසන් වූයේ නම් භික්ෂුවට සිවුර දරා සිටීම අපහසු බවත්, ඒ නිසා බොහෝවිටම සිවුරු හැර යන්නේ පින ඉවර වූ නිසා බවත් එබඳු අය පිළිබඳ පරීක්ෂා කර බලා අප වටහාගෙන ඇත.

දෙවියන්ව උපදින්නේද සැප විඳීමට කරුණු යෙදෙන්නේද පෙර කළ පින් නිසයි. එනිසා පින ලෝක සත්වයාට අවශ්‍යයි. ඒ නිසා පින් කළ යුතුයි. පව් නොකළ යුතුයි. සිද්ධාර්ථ බෝධි සත්වයන් වහන්සේ පින් කිරීම අත්හැර පැවිදිව කළේ කිං කුසල ගවේසීව හැසිරීමයි. එය "කිං කුසල ගවේසී" නමින්ද හැඳින්වෙයි. කුසලය කුමක්දැයි සොයමින් කුසල් දහම්හි හැසිරීමේ ප්‍රතිඵලය වූයේ බුද්ධත්වය ලබාගැනීමයි. එනම් සසරින් ලෝකයෙන් මිදී නිවන ලැබීමයි. ඒ සඳහා පවින් මෙන්ම පින් කිරීමෙන්ද බැහැර වූ බෝධිසත්වයන් වහන්සේට කුසල් වැඩීම උපකාර විය. එහිදී කුසල් වැඩීම යනු විදසුන් වැඩීම බව පැහැදිලි වෙයි.

සියලු බුදුවරුන්ගේ අනුශාසනාව ලෙස සැලකෙන සබ්බ පාපස්ස අකරණං යන ගාථාවෙහි සඳහන් වනුයේද සියලු පව් නොකිරීම, කුසල් රැස්කිරීම හා තම සිත දමනය කරගැනීම බුදුවරුන්ගේ අනුශාසනය බවයි. පව්වලින් බැහැර වී කුසල් වැඩීමෙන් සිත දමනය කරගෙන නිවන අවබෝධ කළ හැකියි. පින් කිරීමෙන් සැප ලැබෙන මිස දුක් නැති නොවෙයි. පින්වල විපාකය සැප ලැබීමයි. ලැබෙන සැපම සමහර විට දුකට හේතුවිය හැකිය. කුසල් කිරීමේ විපාකය සැප ලැබීම පමණක් නොව දුක් නැතිවීමයි. ඒ නිසා බුදු වදනට අනුව දුක් නැති කරලීමට නම් කළ යුත්තේ කුසලය.

කුසල් බලයෙන් පව්කම්වල විපාක පවා මැඩලිය හැකිවෙයි.

"යමෙක් කළ පව්කම් කුසල් බලයෙන් මැඩලයිද එද වලාකුළින් මිදුණු හඳක් මෙන් ලෝකය ආලෝකවත් කරයි" යනුවෙන් දේශනාවෙහි එන සඳහන් අප හොඳින් වටහාගෙන ලෝකාමිස අත්හැර කුසල්ම වැඩිය යුතුයි.


ඕනෑම හොඳ වැඩක් තෘෂ්ණා සහගතව කරන විට පින් සිදුවෙයි. ඒ පින්වල විපාක වශයෙන් සැප ලැබෙයි.

ඕනෑම හොඳ වැඩක් තෘෂ්ණාශ්‍රිත නොවී සිදුකළොත් එය කුසලයක් වෙයි. එහි විපාක වශයෙන් දුක් නැතිවෙයි. දානාදිය නිවන් පිණිස හේතුවන පාරමිතා වනුයේ කෙසේද යන්න මෙයින් වටහා ගත යුතුයි.

පින ප්‍රහාණය කළයුතු දෙයක් ලෙස සැලකෙතත්, දේශනාවේ කිසිදු තැනක කුසලය ප්‍රහාණය කළ යුතු දෙයක් ලෙස සඳහන් නොවෙයි.

පව් පින මෙන්ම කුසලයද වටහාගෙන පව් නොකර පින්ද කරමින් කුසල් වැඩීම පින් පව් දෙකම ප්‍රහීණ කර නිවන් දැකීමට උපකාර වෙයි.

**පූජ්‍ය බෙංගමුවේ නාලක හිමි**



"යකඩයෙන් හැදුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව විසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට පවයි."

# දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## නව වසරේ පැතුම

මෙ ඇතිවූ නව දේශපාලන යුග පෙරළියත් සමග යහ පාලනය යන වචනය සම්භාවිත වූයේ බොහෝ දෙනාගේ සිත් සතන් තුළ යහපත් අපේක්ෂා ඇතිවමිනි. යහ පාලනයෙන් යුතු ධර්මිෂ්ඨ සමාජ සංදර්ශනයක් ලෙහෙසියෙන් පිහිටුවිය නොහැකි බවද මෙහිදී අපගේ අවධානයට යොමුවිය යුතු වැදගත් කාරණයකි. ඊට සමත් එක්විය යුතු සාධනීය අංග රැසක්ම පවතින බවද අප මෙහිදී අමතක කළයුතු නැත. ඒ අනුසාංගික අතුරින් බෞද්ධ සාරධර්මවලට හිමිවන්නේ සුවිශේෂී තත්ත්වයකි.

"සාරධර්ම" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව සමාජ විද්‍යාව තුළ දීර්ඝ වශයෙන් කරුණු දක්වා තිබේ. මූලිකව සලකනොත් සාරධර්ම යනුවෙන් අර්ථ නිරූපණය වන්නේ පුරුෂාර්ථ හා ධර්මතා යන මූලිකාංගයන් දෙකෙහි සංකලනයක් ලෙසට විග්‍රහ කළ හැකිය. පුරුෂාර්ථ යනු යම් යම් කරුණු සංකල්ප හා බැඳීම් විවරණය කොට ජීවයෙහි හරි වැරදි, ධාර්මිකකම් හා හරවත්කම් අගය කරන්නට ගනු ලබන ව්‍යායාමයේ ප්‍රතිඵලයකි. ධර්මතා යනුවෙන් සඳහන් වන්නේ ඉහත සඳහන් කළ පුරුෂාර්ථයන් ක්‍රියාවේ නංවන්නා වූ චර්යාවයි. මෙය උදාහරණයකින් දක්වනොත් අප පන්සලට යන එන විට අප සිතිහි තුනුරුවන් කෙරෙහි උපදින ගෞරවය හා ප්‍රසන්න බව එක්තරා විදියක පුරුෂාර්ථයකි. එම පුරුෂාර්ථය, චර්යාවකට හරවමින් අප පන්සලට ඇතුළු වන විටද පාවහන් හා හිස්වැසුම් ගලවමු, එය ධර්මතාවකි.

යහපාලනයෙන් යුතු දැහැමි සමාජයක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය කරන වැදගත් මූලධර්ම කීපයක් ඇත්තේය. ඒ අතරින් මූලටම එන්නේ පංචශීල ප්‍රතිපත්තිවලින් ගොඩනගා ගන්නා සාරධර්ම වේ. ඊට අමතරව සතර සංග්‍රහ වස්තූන් හා කෙලෙස් අත්හැරීම ආදී ගුණාංග ශක්තිමත් කරගත් ධර්මතාද වැදගත් වේ.

දානය, ප්‍රිය වචනය, සමානාත්මතාව හා අර්ථචර්යාව වැනි ධර්මතා සාරධර්ම අප සිත් සතන් තුළ පෝෂණය කරගන්ට අප සමත් වුවහොත් රාජ්‍ය පාලනයට රට තුළ යහ පාලනයක් ස්ථාපිත කරන්නට අපහසුතාවක් නැත.

අද රටට අවශ්‍ය කරන්නේ එබඳු යහපත් වාතාවරණයකින් යුතු දැහැමි සමාජයකි. දේශපාලනික වශයෙන්ද යහපත් හා සාමකාමී පසුබිමක් රට තුළ නිර්මාණය කරගන්නට සෑම දේශපාලන පක්ෂයක්ම පියවර ගතහොත් එය සමස්ත ජනතාවගේම සහජීවනයටත්, ආධ්‍යාත්මික ප්‍රබෝධයටත් හේතුවනු නියතය. ඒ සඳහා පන්සලටත්, භික්ෂූන් වහන්සේලාටත් කළ හැකි කාර්යභාරය අති විශාලය. අප සැමගේ අපේක්ෂාව යහ පාලනය රජ කරන දැහැමි රටක් ලෙසට ශ්‍රී ලංකාව ලෝකය තුළ විරාජමාන වෙනු දැකීමටය. ■

මිනිස් සම්භවය ගත්කල ලොව ඇති උතුම්ම සැපත වන්නේ සක්විති රජ සම්පත්තියයි. මුළු ලෝකයටම අධිපති වීම සක්විති රජ සම්පත්තියේ ස්වභාවයයි. සුද්ධෝදන රජතුමාගේ අරමුණ වූයේද තම එකම පුත්‍ර වූ සිද්ධාර්ථ කුමාරයා සක්විති රජෙකු ලෙස දැකීමය. නමුදු සිද්ධාර්ථ කුමරු එම සැපත පුළුන් කෙළ කෙළ පිඩක් සේ සිතා ඉවත් කොට බුදු බව පතා පැවිදි වීම උදෙසා රජ ගෙදරින් පිටත් වූ ආකාරය බුද්ධ චරිතය තුළ ඉතා ප්‍රකටය.


දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රය තුළින් සක්විති රජ සම්පත්තියෙහි ස්වභාවය පැහැදිලි කොට ඇත. එහි සඳහන් පරිදි සෙසු දැහැමින් රාජ්‍ය කරවන මුළු ලොවටම අධිපති සියලු සතුන් විසූ සත් රුවනින් යුත් දුර්ලභතම නම් සක්විති රජෙක් පිළිබඳ කරුණු අනාවරණය වේ. සක්විති රජවරුනට චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණි රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය හා පරිණායක රත්නය නම් වූ සප්ත රත්නයක් භුක්ති විඳීමට ලැබෙනු ඇත. එය සාමාන්‍ය සැප සම්පතක් නොවේ.

එම සූත්‍රයේ සඳහන් පරිදි එම සක්විති සැපත අංග සම්පූර්ණ කර ගැනීමට නම් දස සක්විති වත් පිරීම අනිවාර්ය වේ. එසේ නොවන්නේ නම් සප්ත රත්නය අතුරුදන් වනු ඇත. එම දස සක්විති වත් නම්,

1. දස කුසල ධර්මයෙහි පිහිටා එය ගරු කරමින් අඹු දරුවන්ද සීලයෙහි යොදවා ඔවුන් රැකගැනීම.
2. බල සෙනගද බලයෙහි පිහිටුවා සංග්‍රහ කොට රැකගැනීම.
3. ක්ෂත්‍රියයන්ද සීලයෙහි පිහිටුවා රැකගැනීම.
4. බ්‍රාහ්මණ ගෘහපතියන්ද එසේම රැක ගැනීම.
5. නියම්ගම් ජනපදවාසීන්ද සීලයෙහි පිහිටුවා රැකගැනීම.
6. මහණ බමුණන්ද කළ යුතු සංග්‍රහ කොට රැක ගැනීම.
7. සිවුපාවුන්ද පක්ෂීන්ද රැකගැනීම.
8. ස්වකීය රටෙහි අධාර්මික ක්‍රියාවන් ඇති නොවන ලෙස කටයුතු කිරීම.
9. දුප්පතුන්ට දන් දීම.
10. ගුණවත් මහණ බමුණන් කරා පැමිණ කරුණු විමසා ඔවුන්ගේ අවවාද අනුව දැහැමි යෙදී වාසය කිරීම.

සියලුම රජවරුනට අධිපති වූ සක්විති රාජ සම්පත්තිය ලැබීම පහසු කාර්යයක් නොවේ. එයට බොහෝ පින් කොට තිබිය යුතුය. සක්විති විතර සූත්‍රය පිළිබඳ විස්තර වන හැන්ති නායක හිමි පවසා සිටින්නේ,





''ආරපාතේ [illegible] - චක්කවත්ති සිරිංහලහෙ
අසීතිංච [illegible] - චක්කවත්ති
අහොසනං''

''එක [illegible] නරක් පාසා සක්විති රජ වන්නට හේතු සම්පත් පිරුණු පසර එපමණ බොහෝ කලක් නොසිටි හෙයින් [illegible] වාරයක් චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ලැබීමි.''

ඒ අනුව [illegible] බැලිමේදී චක්‍රවර්ති රාජ සම්පත්තිය සඳහා [illegible] පින්කම් කරගත යුතු බව පැහැදිලි වේ.

එසේ වුවද බුදු හිමි දේශනා කොට ඇත්තේ එම කුමන [illegible] ඉසුරින් පිරි සක්විති රාජ සම්පත්තියටත් වඩා සෝවාන් ඵලය උතුම් බවය. ඒ බව ධම්මපදයේ ලෝක වග්ගයට අයත් 12 වෙනි ගාථාව තුළින් පැහැදිලි වේ.

''පඨව්‍යා ඒකරජ්ජේන - සගසස සමනෙන වා
සබ්බ ලෝකාධිපච්චේන - සොතාපත්ති ඵලං වරං''

සක්විති රජයට වඩා දෙව් ලෝ යාමට වඩා සියලු ලොවැ අධිපතිකමට වඩා සෝවාන් ඵලයම උතුම් වේ.

එයට හේතුව මිනිස් දිවියේ උසස්ම සැපත වූ සක්විති රාජ සම්පත්තිය වුවද වෙනස් වීමය. එයින් නැවත දුක හටගැනීමය. නමුදු ආධ්‍යාත්මික ගුණ වගාවන් එසේ වෙනස් නොවනු ඇත. සෝවාන් වූ අයෙකු කිසි කලෙක අපාගත නොවනු ඇත. සුගතියකම පමණක්ම ඉපදේ. එසේ ඉපදුණත් වැඩිම ආත්ම හතක් පමණි. සෝවාන් පුද්ගලයන් වශයෙන් තිදෙනෙක් ඇති බව පැහැදිලි වේ. එනම්,

1. ඒක බීජ (දෙවන භයයේදීම රහත් වන පුද්ගලයා)

2. කෝලං කොල (2-7 අතර ආත්මයක්දී රහත් වන පුද්ගලයා)

3. සත්තක්ඛත්තුපරම (සත්වන භවයේදී රහත් වන පුද්ගලයා)

සෝවාන් වීම යනු සසරින් එතෙර වීමේ පළමු පියවරයි. පඩිපෙළවල් 4 ක් අවසානයේදී නිමාව නැත්නම් ඉලක්කය ඇත්නම් එහි පළමු පඩිය වන්නේ සෝවාන් මාර්ගයයි. එතුළින් සෝවාන් ඵලය සිදුවේ. එය නිවන් මගේ පළමු පියවරයි. එය අසීරු කටයුත්තකි. නමුදු කෙසේ හෝ පළමු පියවර තැබිය හැකි නම් එහි අවසානය දක්වා ගමන් කිරීම අසීරු කර්තව්‍යයක් නොවේ.

සෝවාන් වීම පිළිබඳ කතා කිරීමේදී සෝතාපත්ති සිත යනුවෙන් නම් කළ හැකිය. සෝත යනු දිය පහරයි. නිවන් නමැති මහ සයුරට නැඹුරුව ගමන් කරන දිය පහරක් හෙයින් එයට බැස ගැනීමේ (සොත + ආපත්ති) අර්ථයෙන් එහි මුල්ම සිත ඒ නමින් හැඳින්වේ. එම මඟට බැස ගැනීමේදී බැහැර කෙරෙන කෙලෙස් මල කීපයක් ඇත. ඒවා දස සංයෝජන නමින් හැඳින්වේ. සංයෝජන නමින් හැඳින්වෙන්නේ සසර බැඳ තබන හෙයිනි.

1. සක්කාය දිට්ඨි (ආත්ම දෘෂ්ටිය විනාශ නොවන (සත්) භවගාමී ආත්මයක් ඇත යන මිත්‍යා දෘෂ්ටියයි. මගේ අපේ යනුවෙන් අල්ලා ගැනීමද ඉන් ගම්‍ය මාන වේ.

2. විචිකිච්ඡා - (සැකය - එනම් බුද්ධාදී අට තැන සැකයයි. බුද්ධ, ධම්ම, සංඝ, ශික්ෂා, පූර්වාන්තය, අපරාන්තය, පූර්වාන්ත අපරාන්තය, පටිච්ච සමුප්පාදය යනාදි අට ගැන සැකයයි.)

3. සීලබ්බත පරාමාස - (සසිරින් මිදීම උදෙසා අනවබෝධයෙන් අත්ථකිලමතානු යෝගය වැනි ඒ ඒ සිල් හා ව්‍රත අනුගමනය කිරීමෙන් ඇති කර ගන්නා චංචල ස්වභාවයයි.


සක්විති සැපයටත් වඩා සෝවාන් ඵලය උතුම් වන්නේ නිවන් මගෙහි පළමු පියවර එය බැවිනි. සක්විති රජුත් මියගොස් අපාගත වීමට පුළුවන. එම සැපත විඳින කාලය තුළම නැවත නොයෙක් තාඩන පීඩන දුක් කරදරවලට පැමිණීමට පුළුවන. එම සැපත අහෝසි වීමට පුළුවන. නමුදු සෝවාන් වූ උත්තමයා නැවත කිසිදු ආත්මයක නරක, තිරිසන්, ප්‍රේත, අසුර යන සතර අපායොත්පත්තියකට පත් නොවනු ඇත. අටවැනි ආත්මයක් ඔහුට උරුම නැත. සක්විති සැපත හෝ වෙනත් කුමන සැපතක් ලබන කෙනෙකු වුවද සසර තව බොහෝ කල් ගමන් කිරීමේ ප්‍රවණතාවය සුලබය.

බුදුන් දවස සත් හැවිරිදි වයසේදීම විශාකා සිටු දියණිය සෝවාන් වීම, ඊට අමතරව ඒ ඒ අවස්ථාවලදී සෝවාන් වූ අය ලෙස සේ ජත්ක මානවක ඇතුළු පිරිස ගැරඬියකු පෙලූ ළමුන් පිරිස, සැවැත්නුවර වෑද්ධ බමුණා ප්‍රමුඛ දරුවන් පිරිස, රජ්ජුමාලා, අනේපිඬු සිටුගේ පුත් කාල සිටු, මිගාර සිටුතුමා ආදීන් දක්විමට පුළුවන. ප්‍රඥාව මුහුකුරා යෑමත්, පෙර පින් බලයත් ආදී හේතුන් මත නිවන් මගෙහි පළමු පියවරට ඔවුන් පත් වූහ.

අද ලෝකය තුළ සෝවාන් වීම ඉතා දුෂ්කර කාර්යයක් වී ඇත්තේ ඇලීම්, බැඳීම්, ගැටීම්, අන්ත ලෙස පවත්වාගෙන යෑම හේතුවෙනි. කාම ලෝකයේ අන්ධ වී සිටින සත්වයාට සසර දුක නොතේරේ. ලෝකය හා සත්වයා දෙස ප්‍රඥාවෙන් දක දන බෞද්ධ ප්‍රතිපදා ඔස්සේ ගමන් කොට සෝවාන් වීම කළ යුතුව ඇත. ඒ සඳහා බුදුන් දෙසූ උතුම් දහම් මග පහුරක් කර ගත යුතුව ඇත.

පූජ්‍ය ගලගෙදර
රතනවංශ හිමි





## මහාකණ්හ ජාතකයෙන් හෙළිවන

## දස අකුසලයෙන් මිදී

# ලෝකාර්ථචර්යාවේ හැසිරීමේ අනුහස්

සියල් ලෝ සතුන් කෙරෙහි මහා කාරුණික වූ අප තිලෝගුරු සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන කල්හි පරෝපකාරී ලෝකාර්ථචර්යාව අරභයා මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක. දම්සභා මණ්ඩපයට රැස්වූ භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරෝපකාර ගුණය ගැන සාකච්ඡා කරමින්, පස්වග මහණුන් නිසා අප බුදුරජාණන් වහන්සේ අටසැළිස් යොදුනක් වැඩම කොට ඔවුනු මහණ කරවූ සේක. මහාකප්පින රජතුමා උදෙසා එකසිය විසි යොදුනක් දුරැකතර ගෙවා වැඩි සේක. ආලවක යක්ෂයා දමනය කිරීම සඳහා එපමණම දුරක් තමන් වහන්සේම පාසිවුරු රැගෙන එකලාව වැඩම කොට බණ කියා ඔවුනු මහණ කළ සේක. මෙවෙනෙය ජන කෙනෙකුන් නිසා ගොස් බණ දෙසා මහණ කරවාගෙන වැඩිසේක.

එහෙයින් තථාගතයන් වහන්සේගේ පරෝපකාරය යහපත් යැයි කියා කතිකා කරමින් සිටියහ. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේ සිටි තැනට වැඩම කොට මහණෙනි, මා පැමිණීමට පෙර කවර කතාවකින් යුක්තව වූවෙදැයි විචාළ, දැන් පමණක් නොව මින් පෙර උපන්නමුත් පවා තමන්ගේ උත්සාහයෙන් අපායට යන්නවුන් බොහෝ දෙනා සසර සයුරෙන් ගොඩ කළානු යැයි වදාළ සේක. ඒ කෙසේදැයි ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ එම අතීත කතාව මෙසේ ගෙනහැර දක්වා වදාළ සේක.

පැරණි දවස බරණැස් නුවර උසීනර නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන සමයෙහි කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනය බොහෝ කලක් පැවත පසු පිරිහෙන්ට පටන් ගත්තේය. බුදුරජාණන් වහන්සේ නොකරන්නැයි කියා දුන් අවවාද 21 ක් පමණ ගිහිපැවිදි මනුෂ්‍යයන් විසින් කඩකරන ලදී. ඇතැම් භික්ෂූහු මෙහෙණියන් හා එක්ව පම්පෝෂයෙහි යෙදීමෙන් දරුවන් වදා, ගිහියන් හා සමගව වාසය කොට මහණ දම් අත්හලහ. ඇතැම් භික්ෂුණීන් වහන්සේ තමන්ගේ භික්ෂුණී භාවය අත්හලහ. උපාසකවරු තම උපාසක ධර්ම අත්හලහ. උපාසිකාවන් තමන්ගේ උපාසිකා ධර්ම අත්හරින ලදී. බ්‍රාහ්මණයෝත් තමන්ගේ බ්‍රාහ්මණ ධර්මය අත්හලහ. සියලු මනුෂ්‍යයෝ දස කුසල ධර්මයන් අත්හැර දස අකුසල ධර්මයන්හි යෙදුණාහ. එසේ එක කල සත්වයන් මළ පසු නරකයෙහි ඉපදුණා මිසා දිව්‍ය ලෝකයෙහි උපත නොලැබූහ.

ශක්‍ර දේවේන්ද්‍රයෝ මේ තත්ත්වය දිවැසින් දැක කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ ශාසනය පිරිහෙයි. මනුෂ්‍යයන් භය ගන්වා හික්මවමියි සිතා මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවා ඒ බව පවසා, මිනු ඇඹුල් කෙසෙල් ගෙඩි පමණ දළ ඇති අශ්වාජනීයෙකු පමණ බලු වෙසක් මවාගෙන, බල්ලා පස් තැනකින් බැඳගෙන ශක්‍රයා වැද්දෙකුගේ වේශයක් මවාගෙන, දළ ඇති බල්ලා අතින් රැගෙන බරණැස් නුවරට පැමිණියහ. මෙනුවරට ළඟා වූ බල්ලා මහත් ශබ්දයෙන් කෑගැසූහ. එය ඇසූ බොහෝ මනුෂ්‍යයෝ ඇතුල් නුවරට වැද රජතුමන්ට එපවත් දැන්වූහ. රජතුමාවූ එපවත් අසා එසේ වී නම් වාසල් දොර අගුල් ලව්වන්නැයි පවසා අණ කළහ. සියලු පුරවැසියෝ ඇතුළු නුවරට වී දොරගුළුලාගෙන සිටියහ. එවිට ශක්‍රයා තමන්ගේ ශක්‍රානු භාවයෙන් අටළොස් රියන් පමණ උස ඒ නුවර වටා බැඳි පවුරෙන් පැන වීදියට වන්න. මනුෂ්‍යයෝ භයින් තැතිගෙන දොරවල් අගුල් ලා ගත්හ. බල්ලා රජතුමාවන් ළඟ සිට දසදෙසත් ගෙයදන් දක්වමින් ඇසෙන පස් මහත් හඬින් හඬ නැලීය. මේ හඬ ඇසූ රජු ඇතුළු බොහෝ මනුෂ්‍යයෝ භයින් තුස්ත වූහ.

රජු රජ ඓශ්චර්යය උපදවා වැද්දාගෙන්, මේ තර ඇසුලි මහත් දළ ඇති බල්ලා කෙසේ තුඹගේ නිසා මෙහි ගෙනාවේදැයි විචාළේය. එවිට වැදි වෙසින් සිටි ශක්‍රයා රජතුමනි, මේ බල්ලා තමාගේ බඩගින්න නිසා මෙසේ කෑගසන්නේ යැයි පැවසීය. එවිට රජතුමාගේ අණින් සියලු නිවෙස්වලින් පිසූ බත් ගෙනවුත් දුන් විට බල්ලා එක කටින් කා නිම කළේය. නැවතත් කෑ ගැසීමට පටන් ගත් විට මූ තවම කෑගසන්නේ ඇයිදැයි විමසූ විට මූ බඩගින්න නිසා හඬන්නේ යැයි වැද්දා යළිත් කීවේය. එවිට ඇතුන්ට, අශ්වයන්ට පිසූ බත් ගෙනැවිත් දුන් විට ඒවාද බල්ලා එක කටින් කා යළිත් හඬන්නට පටන් ගත්තේය. එවිට රජතුමා, එසේ බල්ලා යළිත් මුරගාන්නේ ඇයිදැයි විමසීය. එවිටත් වැද්දා කියූයේ, බඩගින්න නිසා බව ය. එවිට රජතුමා, මේ බල්ලා බල්ලෙක් නොවේ. මෙවැනි බත් කෑ පමණින් තෘප්තියට නොපැමිණියේය, මූ මහත් පෙරේත ඇති යක්ෂයෙකැයි සිතීය. එම්බල වැද්දාණෙනි, තොපගේ බල්ලා බත් කා තෘප්තියට නොපැමිණියේය. මූ හඬන්නේ උරන්, මුවන්, ගෝනුන් මස් කන්නද, නැත්නම් මිනී මස් කන්නදැයි විචාළේය. එවිට වැද්දා, මූ මුරගාන්නේ උරන්, මුවන් කන්ට නොව මනුෂ්‍යයන් කන්ට යැයි කීවේය. එවිට රජු, තොපට කැමති අවශ්‍ය වන්නේ වෛරී මනුෂ්‍යයන්ද, අවෛරී මනුෂ්‍යයන්දැයි විමසීය.


එවිට වැද්දා වෛරී මනුෂ්‍යයෝ යැයි පැවසීය. එකල්හි මටත් වෛරී මනුෂ්‍යයන් කවුරුදැයි රජු විචාළහ. එවිට යම් කෙනෙක් දුශ්ශීල නම් ඒ මනුෂ්‍යයෝ වෛරී වෙති. එවිට රජතුමා එය මට නොතේරෙයි, විස්තර ඇසීම කියන්නැයි ඉල්ලීය.

එකල්හි ශක්‍රයා එසේ නම් මෙසේ අසාවයි කියා, යම් භික්ෂු කෙනෙක් පසළ සිවුරු හැඳ, පාත්‍රය අතින් ගෙන, භික්ෂාටනය කෙරෙත්ද, එසේ වූ භික්ෂූන් වහන්සේලා සීසෑම, වැපිරීම් ආදී වූ දෙය කොට, ගිහියන් සේ වාසය කෙරෙත් නම් ඒ අලජ්ජී භික්ෂූන් කෙරෙහි වෛර ඇත්තෙමි. ඔවුන් මේ බල්ලා ලවා කවා මරවමියි කීහ. එසේම යම් භික්ෂුණී කෙනෙක් පසළ සිවුරු පොරවා, පටිය බඳින්ද, පාත්‍රය අතින් ගෙන භික්ෂාටනය කෙරෙත්ද, එවැනි භික්ෂුණීන් වහන්සේලා ලෝකාශ්වාදයෙහි යෙදී දරුවන් වදා වාසය කෙරෙත් නම් එබඳු අලජ්ජී භික්ෂුණීන් මේ බල්ලා ලවා කවා මරවමියි කීය. එසේම යම් තාපස කෙනෙක් බැලියම් බැඳුණු දතින්, රජස් වැකුණු ශරීරයෙන්, අඳුන් වූ පටයෙන් පසය රකින්නා වූ තාපසයෙක් ගිහියන්ට කෙයකුරුත් දී, ගිහියන් හා සමගව වාසය කෙරෙත් නම් එබඳු තාපසයන් කෙරෙහි වෛර ඇත්තෙමි, ඔවුන්ද මේ බල්ලා ලවා කවා මරවමි. එසේම යම් බ්‍රාහ්මණ කෙනෙකුන් තමන්ගේ ත්‍රිවේදය හා යාගහෝම ආදී වූ දෙය ඉගැන්වීමට දෙන නොබලා, ඉඩම් සම්පත් බලා මෙබඳු යාගහෝමයන් කරමිහයි මනුෂ්‍යයන්ට නොකියාම නොව ඔවුන්ගේ සම්පත් ඉගෙනගත් නම්, තමන් යාගහෝම, බ්‍රාහ්මණ ධර්මයෙහි නොපිහිටා කටයුතු කරන බ්‍රාහ්මණයාතුන් බල්ලා ලවා කවා මරවමි. එසේම යම් ගෘහියයෝ තමන්ගේ දෙමව්පියන් පෝෂණය නොකෙරෙත් නම්, එසේ වූ අය මේ බල්ලා ලවා මරවමියි කීය. යම් සත්වයෙක් දෙමව්පියන්ට ආගෞරව පරිභව කෙරෙත් නම් එබඳු අයත් මේ බල්ලා ලවා මරවමි. තවද යම් සත්ව කෙනෙකුන් තමන්ගේ ගුරුවරු ඔවුන් කෙරෙහිද, ආචාර්යන්ගේ බිරිඳ කෙරෙහිද, තමන්ගේ බිරිඳගේ මෑණියන් කෙරෙහිද, ගුරුවරුන්ගේ බිරිඳ කෙරෙහිද දෝෂ කෙරෙත් නම් එසේ වූ මනුෂ්‍යයන්ත් මේ බල්ලා ලවා මරවමියි කීහ. එසේම යම් බ්‍රාහ්මණ කෙනෙක් කඩු, පලිහ ආදී ආයුධ ගෙන මංමාවත්වල සිට මිනී මරා වස්තු උදුරාගනිද්ද, පේවා නම් කොට නොකරන දෙය කරන බ්‍රාහ්මණයාතුන් මේ බල්ලා ලවා මරවමි. එසේම යම් ස්ත්‍රියක් පරදාර නොකටයුත්තෙහි යෙදේ නම් ඇයද මරවමි. එසේම එක් පුරුෂයකු දුන් සම්පත් ඒ පුරුෂයා සමග සිට කොට පුරුෂයකුට දෙන් නම් එවැනි ස්ත්‍රීහුද බල්ලා ලවා මරවමි. එමෙන්ම යම් පුරුෂයෙක් පස් පව් පුරා දස අකුසල් කරත් නම් එබ පාපිෂ්ඨයාන් මේ බල්ලා ලවා මරවමි.

මෙසේ වූ පුරුෂයන් කරා ගොස් කන්නාන් මෙන් මිනිසුන් භයගන්වා, ශක්‍රයා තමන්ගේ වැදි වේශය අත්හැර, ශක්‍ර ස්වරූපයෙන් අහසේ සිට රජුට අවවාද කොට රජතුමනි, බුද්ධ ශාසනය පසුබසින්නා දුක සෙමෙන් ශාසනය අභිවෘද්ධිය කරනු පිණිස ආගමිමියි කියා අවවාද කොට ශක්‍රයා දෙව් භවනයටම ගියේය. එතැන් පටන් මනුෂ්‍යයෝ තමන් කරන්නා වූ දස අකුසල ධර්මයන් අත්හැර දස කුසල ධර්මයෙහි හැසිරුණාහ. සර්වඥයන් වහන්සේ වදාළ ආකාරයෙන් ප්‍රතිපත්තිවල පිහිටා සීලය රැක්කාහ. මෙසේ විදාරා අවවාදයෙන් ශාසනය දහසක් අවුරුදු තිස්කලෙකට පැවති බව වදාළ සේක. එසමයෙහි ශක්‍රයෝ නම් අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේය.

මෙම මහාකණ්හ ජාතකයෙන් හෙළිවන පරිදි දස අකුසලයෙන් මිදී, දස කුසලයෙහි යෙදී බුදුන් වදාළ ධර්මානුගතව, සීලසම්පන්නව හැසිරෙන්නා මෙලොව මෙන්ම පරලොවද ජයගනී. අපිද පවින් මිදී කුසල් දහම් රැස් කොට නිවන් සුව අත්කර ගැනීමට අදින් උතුම් වෙනත් දිනයක් ඉවාගත යුතුය.

**ජේ. මිගහකුඹුර**



# සසර ගමනේ ස්වභාවය තේරුම් ගනිමු

සම්මා සම්බුදු උපත ලෝකයට ලැබුණේ අසරණ ලෝකයාගේ සිත නිසයි. ලෝකයේ පුණ්‍යවන්තයන් වැඩිවන කාලයට මහා බෝසත්වරු බුදුවීම පිණිස මනු ලෝ තලයට වැඩම කරති. කාලවිපත්ති බහුල ලෝකයක අපි ජීවත් වුවත් බුද්ධ ශාසනය පවතින නිසා අපි වාසනාවන්ත පිරිසක් බවට පත්ව ඇත. අප මේ තත්ත්වය අවබෝධ කරගෙන සමාජයේ ජීවත් විය යුතුය.

සංසාර ගමන බොහෝ සේ දීර්ඝය. මේ දීර්ඝ සංසාර ගමනේ ප්‍රාථමික තාවකාලික නවාතැනක් විතරයි මේ මනුෂ්‍ය ආත්මය. මැරෙන බව දනගත්තද මරණයේ ස්වභාවය නිවැරදිව හඳුනාගත නොහැකි අපි සංසාර ගමන කෙසේ හඳුනා ගන්නද? මරණය හඳුනා ගන්නා තැනැත්තාට සසර ස්වභාවය හඳුනා ගැනීම එතරම් අපහසු නැත. අප කරන අකුසල් තමයි මතු භවයකදී විඳවන්නේ. යමෙකුට හිතෙන්න පුළුවන් මම මැරෙනවා, මගේ මරණින් පස්සේ උපදින්නේ මම නොවෙයි වෙන කෙනෙක්. ඒ නිසා කර්මය පලදීමක් සිදුවෙන්නේ නැහැ කියලා.

එත් ඒ පිළිබඳ බුද්ධ වචනය මෙසේයි. "න ච සෝ න ච අඤ්ඤෝ" තමාද නොව අන් අයකුද නොව යන්නයි. තමාගේ රූපකාය මතු භවයේ නොමැති නිසා තමන් නොවේ. එහෙත් නාමධර්මයන් හෙවත් සිතුවිලි පරම්පරාව එලෙසම පවතින නිසා තමන්ම වේ. ඒ නිසා අකුසලයේ විපාක තමන්ට නොවේ යැයි සිතා කෙනෙකුට ඉන් කෙසේවත් මිදිය නොහැක.

බුදුරජාණන් වහන්සේ ඉතා වටිනා ධර්ම කාරණා දෙකක් සංයුක්ත නිකායේදී දේශනා කළා. මහණෙනි, මහා කාරුණික බුදුරජාණන් වහන්සේ නමකගේ පහළවීම නිසා බොහෝ පිරිසක් පිං කරගන්නේය. එවැනිම තවත් පිරිසක් පව් පුරවා ගන්නේය.

සම්මා සම්බුදු කෙනෙකුගේ පහළවීම නිසා බොහෝ දෙනෙක් භව ගමනින් එතෙරව සැනසිල්ල සහනය ලබනවා සේම සම්මා සම්බුදු නමකගේ පහළවීම නිසා අපායගාමී පිරිසකුත් සිටින බව බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ සඳහන් වේ. එනම් සත්පුරුෂ ක්‍රියාවක යෙදෙන විට තමා ගෙන ආ කර්ම ශක්තිය අනුව අපායගාමී පිරිස් සිටීම නොවැළැක්විය හැකිය. සංසාර ගමනේ පින් පුරවාගෙන පැමිණි පිරිස් බුදු පාමුල අරහත් මගඵල ලබා සසර ගමනින් එතෙර වනවා සේම බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට අවමන් කරමින් අකුල් හෙළමින් සිටි අය අපායේ වැටෙති.

බුදුරජාණන් වහන්සේ ඒ ගැන නැවෙන්නට, කම්පා වන්නට නොගියේය. අපායගාමී වන්නන් සැමදෙනා බේරාගන්න උන්වහන්සේ වැඩම නොකළහ. අංගුලිමාල බේරාගත්තද දෙව්දත් බේරාගැනීමට උන්වහන්සේ ඉදිරිපත් නොවූ සේක. මේ තත්ත්වය තමයි ලෝකයාට උරුම ලෝක ස්වභාවය. ලෝක ස්වභාවය වෙනස් කරන්නට බුදුන් වහන්සේ ඉදිරිපත් නොවූ සේක.

"මේ ලෝකයම අපට හොඳ කරන්න බෑ". සසර ගමනේ අප කළ, කී දේ අනුවයි සෑම දෙයක්ම සිද්ධ වෙන්නේ. පින් පුරපු පිරිස් හොඳ වන්නා සේම පව් පුරවා ගත් පව්කාර පිරිස් අගතිය කරා යන්නේය.

කෙනෙකුට හිතෙන්න පුළුවන් මම හොඳයි, ඇයි මගේ ගෙදර අයට හොඳ වෙන්න බැරි? ඇයි මගේ අසල්වැසියන්ට හොඳ වෙන්න බැරි? අපේ පවුලේ පිරිස හොඳයි, එහෙම නම් ඇයි ගමේ පිරිසට හොඳ වෙන්න බැරි කියලා. මනුෂ්‍ය ශරීරයක් අරගෙන මනුෂ්‍ය වර්ගයා අතර ඉපදුණත් එක් එක් පුද්ගලයා තුළ තිබෙන පින් දහම් විවිධාකාරයි. සියලු මනුෂ්‍යයෝ ශරීර හැඩයෙන්, රූප ස්වභාවයෙන් එක වගේ වෙන්න පුළුවන්. බාහිර ගමනින් එක වගේ වෙන්න පුළුවන්. ඒත් ගති පැවතුම්වලින් එක වගේ වෙන්නේ නෑ කවදාවත්. ඒ ඒ පුද්ගලයා සසර ගමනේදී රැස්කර ගත් කුසල අකුසල අනුවයි ඒ ඒ පුද්ගලයාගේ ජීවිත සකස් වෙන්නේ. බුදුරජාණන් වහන්සේ අපිට ඉගැන්නුවේ අපි ලෝකයාට කල්‍යාණ මිත්‍රයෝ වුණත් ලෝකයේ සිටින තාක් තමාගේ ගුණධර්ම රැකගෙන ජීවත් විය යුතුයි කියලා.

අපිට පුළුවන් පහසුවෙන්ම ලෝකයාට අසත්පුරුෂයන් වෙන්න. එවිට ලෝකයේ සිටින සත්පුරුෂයාටත්, අසත්පුරුෂයාටත් අපි පතුරු වන්නේ අසත්පුරුෂකම. එහෙම නොවී අසත්පුරුෂ ජන සමාජ මැදදීත් සත්පුරුෂ ගුණ වර්ධනය කරගන්න පුළුවන් නම් එය අප ලබන නියම ධර්මානුකූල ජයග්‍රහණයයි. එනිසා අපි ධර්මයට අනුව නැවත නැවතත් මෙසේ මෙනෙහි කරමු. "මම ගුණවන්ත වෙනවා. මගේ ගුණවත් ජීවිතයෙන් ගුණවතුන් හට යහපතක් සිද්ධ වෙනවා වගේම අගුණවන්තයන්ටත් යම් යහපතක් සිදුවේවි. කිසිම ආකාරයකින් මම මගේ ගුණවත්කම නැතිකර ගන්නේ නෑ." එහෙමයි සත්පුරුෂ පිරිසක් විදියට අප ලෝකයේ ජීවත් විය යුතු වන්නේ. එසේ නොවුණහොත් මාරයාගේ පිරිස වැඩි වෙනවා සේම සසර ගමන නිමකරන පිරිස හීන වෙනවා.

වනාන්තරයක වන සිවුපාවුන් මැද කොටුවී ජීවිත බේරාගත නොහැකිව සිටින පිරිසක් ගැන හිතමු. ඒ පිරිස මහා දුකින් මරණ බියෙන් පීඩිතව මග සොයා ගැනීමට නොහැකිවයි මෙලෙස

අතරමංව සිටින්නේ. ගෙවෙන තත්පරයක් තත්පරයක් පාසා මේ පිරිසේ ඉන්න බුද්ධිමත් කෙනෙක් හිතනවා මේ වනයේ වන සිව්පාවුන් බහුලයි, ඉක්මනින් මෙයින් මිදීමේ මගක් සොයාගත යුතුයි කියලා. මෙහෙම හිතලා බේරිලා යන්න පුළුවන් මාර්ගයක් සොයා ගන්නවා. මේ සංසිද්ධිය අතරමං වූ පිරිසේ හැමෝම පිළිගනීවිද? සමහරු අධෛර්යමත්ව මේ පුවත ඉවත දමාවී. තව කෙනෙක් වනය ගම්මානයට වඩා හොඳ යැයි පවසාවී. ඉතා සුළු පිරිසක් ගම්මානය සොයා යන දුෂ්කර ගමනට එක්වේවි. එයිනුදු සමහරකු අධෛර්යමත්ව ගමන හමාර වීමට ප්‍රථම ගමනෙන් ඉවත් වේවි. අවසානයේ ඉතා ස්වල්ප දෙනකු මහ වනයෙන් මිදී ගම්මානයට පැමිණ නැවත ඒ රුදුරු වනය දෙසට නොයන ලෙසට අන් අයට පවසාවී.

අපිදු එසේමය. මහා විසකුරු සර්පයන් බඳු දුක් ගොඩක් මැද ඒ දුක නොදැන මේ භවය ගෙවන්නෙමු. බුදුරජාණන් වහන්සේ මේ සසර බිය දැන එයින් මිදී අවුත් අපටද සසර බියෙන් මිදෙන ලෙස ධර්මය දේශනා කළ සේක.

මහණෙනි, මම සසර ගමන හඳුනාගෙන එයින් මිදුණෙමි. නුඹලාද සසර ගමනින් මුදවා ගනු පිණිස අනුශාසනා කරන්නෙමි. බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලා මේ ස්වභාවය හැඳින ගන්නද එයින් මිදීම පිණිස අනුශාසනා කළද එය වටහා ගන්නා පිරිස ඉතාම අල්පය. වනයෙන් මිදී ගම්මානයට පිවිසෙන්නේ ස්වල්ප දෙනෙක් සේම අනන්ත සසර සැරිසරන සත්වයා අතරින් සසර ගමන නිමා කරන්නෝ අල්ප වෙති.


සසර ගමනේ ස්වභාවය යම් තරමකට හෝ අවබෝධ කරගැනීම පිණිස අප නිතර නිතර වෙහෙස විය යුතුය. මහා සර්ප වල්ලකට කොටු වී ප්‍රාණ ඉවසාගෙන ඉන්න වෙලාවක යන්තම් හරි ගල් කැටයක් විසි වුණොත් මේ සර්පයෝ විෂ පුප්පාගෙන අප දෙසට එවී. ඒ අවස්ථාවේ අපට දැනෙන බියත් එක්ක පිපාසය දැනුණොත් දිය පොදක් බොන්නේ කෙසේද? වෙනත් අවශ්‍යතාවක් සපුරා ගන්නේ කෙසේද? සසරත් මේ වගේමය. මේ සසරේ විෂඝෝර සර්ප විමානයක් මැදයි අපි ජීවත් වෙන්නේ. ඒ බව දැන දැන අපි ගෙවල් දොරවල් හදනවා, ආහාර ඇඳුම් සොයනවා. ඒකේ වරදක් තියෙනවද? එහෙත් නාග විමානේ මැද ඉන්න අපි දිය පොදට රණ්ඩු සරුවල් වුණොත් මොකද වෙන්නේ? ඒ වගේ නොවේද වර්තමාන සමාජය?

ජාති, ජරා, ව්‍යාධි, මරණ නමැති මහා නාගයෝ සතර දෙනෙක් මැදයි අපි හැමෝම ජීවත් වෙන්නේ. මේ මහා විසකුරු නාගයෝ සතර දෙනා සතර දිසාවේ තබාගෙන අපි රණ්ඩු නොකර ගන්නේද? බැණ නොගන්නේද? වෛර නොකරන්නේද? ඊර්ෂ්‍යා නොකරන්නේද? මේ සියල්ල අපි කරන්නෙමු. මේ තත්ත්වය නිවැරදිව හඳුනාගෙන නාගයෝ සතර දෙනෙක් මැද කෙසේනම් බුද්ධිමත්වද අප සමාජයේ ජීවත් විය යුතු වන්නේ. එක් නාගයෙක් දෂ්ට කළ විට විෂ දැනෙනවා. එහෙත් ඉක්මනින් ඒ බව අමතක වෙනවා. මුළු සංසාර ගමනම මේ දේ තමයි අපි කරමින් ආවේ. මේ බව බුද්ධියෙන් යුතුව තේරුම් ගන්නේ නම් ලොව්තුරා බුදු කෙනකුන් ලෝකයේ පහළවීම නිසා බොහෝ දෙනෙක් කුසල් රැස්කර ගනිති.

එහෙම නම් ඇයි තව පිරිසක් පව් පුරවා ගන්නේ? මේ විෂඝෝර නාගයෝ සතර දෙනා සතර පැත්තේ තබාලවා ගන්නා පමණක් නොව ඒ බව කියා දෙන උත්තමයාටත් දොස් පවරමින්, උරණ වෙමින් බොහෝ අකුසල් රැස්කර ගන්නේය. බුදු කෙනෙකුන් ලෝකය තුළ පහළ වූ විට සසර බිය දැන එය තේරුම් ගෙන සසරින් මිදීමට කුසල් දහම් රැස් කරන පුද්ගලයන්ද එයින් මුදා නැවත අකුසලයට ලං කිරීම පිණිස වෙහෙස ගනිමින් සසර ගමන දිගු කරන්නෝද වෙති.


සමස්ත සමාජයම යහමග යැවීම බොහෝ අපහසු කාර්යයකි. බුදුරජාණන් වහන්සේද ඒ බව වදාළහ. ඒ නිසා ඔබ සමාජයේ සිටි කෙනෙකුගෙන් සිදුවන වරද හමුවේ කලකිරීම් ඇති කර ගත යුතු නැත. එය සමාජයේ ස්වභාවයයි. මේ ස්වභාවය වෙනස් කිරීම බුදුරජාණන් වහන්සේට පවා කළ නොහැකි බව උන්වහන්සේම දේශනා කළ සේක. මන්ද ලෝකය තනුවී තිබෙන්නේ බුද්ධ ගුණයට නොව මාර බලයටය. ලෝකයේ හිමිකරු මාරයාය. මාරයාට අයත් ලෝකයෙන් සීමිත පිරිස් එතෙර කරවීම පිණිස බුදුරජාණන් වහන්සේ මනුලොවට වැඩම කරන්නේය. අප කළ යුත්තේ මාරයාට අයත් ලොව තුළ ජීවත් වන ගමන් බුදුරජාණන් වහන්සේගේ අනුග මනය කිරීමය. එහිදී පැන නගින ඉන්න හමුවේ ප්‍රඥාවන්ත වී මාර ග්‍රහණයෙන් මිදීම පිණිස කටයුතු කළ යුතුය. ඒ සඳහා සසර ගමන පුරා ප්‍රඥා ශක්තිය රැගෙන ආ යුතුය. එවිට මාර බලය පරදා බුද්ධ ගුණය දිනවිය හැකි වන්නේ.

**පූජ්‍ය සිරි සුමංගල අනුනාහිමි**



"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"

# මානසික රෝගවලට බුදු දහමින් ප්‍රතිකාර





නූතන බටහිර මනෝ විද්‍යාව මනස හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ යම් තරමකට අවබෝධ කරගෙන සිටිනැයි ප්‍රකාශ කළද එහෙත් එම අවබෝධය මනසෙහි ක්‍රියාකාරීත්වය මුළුමනින්ම නිරවුල් ලෙස හෙළිදරව් කළ හැකිද යන්න අපට ගැටලුවක් වන්නේ බෞද්ධ මනෝවිද්‍යාව මගින් හෙළිදරව් කළ බොහෝ දේ බටහිර මනෝවිද්‍යාව තවමත් අනවබෝධයෙන් සිටින බව පෙනෙන නිසාය. එසේම නූතන වෛද්‍ය විද්‍යාවද තවමත් සිටින්නේ ප්‍රාථමික අවධියක බව බුදු දහම තුළ ඇති වෛද්‍යමය කරුණු දෙස විමසා බලන විට පැහැදිලි කරගත හැකිය. කායික මානසික රෝග කෙරෙහි මෙන්ම, මිනිසා පසුපස හඹා එන මානසික ගැටලු කෙරෙහි බුදු දහම පෙන්වා දෙන මග පෙන්වීම තුළින් ගම්‍ය වන්නේ බුදු දහම තුළ වන චිකිත්සක නැඹුරුවයි.

විශේෂයෙන් මුල් බුදු සමයේ සඳහන් වන කරුණු පිරික්සීමෙන් බුදු දහමේ චිකිත්සක නැඹුරුව මනාව පැහැදිලි වන බව "Buddhism and Christiannit World of Buddhism" කෘතිය තුළින් කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ මනෝ විද්‍යාඥ Robert H. Thoules හෙළි කළේය.

බුදු දහමේ ඇති චිකිත්සක නැඹුරුව පිළිබඳ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයෙහි රෝග සූත්‍රයෙහි මෙසේ දක්වේ.

"දිස්සන්ති භික්ඛවේ සත්තා කායිකේන රෝගේන ඒකම්පි වස්සං ආරෝග්‍යං පටිජානමානා ද්වේපි වස්සානි ආරෝග්‍යං පටිජානමානා භික්ඛවේ සත්තා දුල්ලභා ලෝකස්මිං යෙ චෙතසිකේන රෝගේන මුහුත්තම්පි ආරෝග්‍යං පටිජානන්ති අඤ්ඤත්‍ර ඛීණාසවේහි."

මිනිසුන්ගේ මනස රෝගී වීම හා කය රෝගී වීම යන ආකාර දෙකක රෝග වැළඳිය හැකි බව පෙන්වා දෙන බුදුන් වහන්සේ එසේත් කායික රෝගයක් නොවැළඳී පුහුදුන් පුද්ගලයකුට සැලකිය යුතු කාලයක් සෞඛ්‍ය ඇති වුවත් මානසික රෝගයකට හසු නොවී මොහොතක්වත් ජීවත් විය නොහැක. (රෝගසුත්ත)

මේ ආකාරයට මනස තුළ ඇතිවන නානාකාර මානසික තත්ත්වයන් විග්‍රහ කර පෙන්වන බුදුන් වහන්සේ, එම තත්ත්වයන් පහකර ගැනීමට අවශ්‍ය වන ක්‍රියාමාර්ගද සඳහන් කර තිබෙන්නේ ද්‍රව්‍යමය ඖෂධ යොදා ගැනීමෙන්ම නොව මනස ක්‍රමවත්ව සකස් කරගැනීමට උපදෙස් දීම මගිනි.

ලෝවැඩ සඟරා කතුවරයා "සත්හට වන බව දුකට වෙදාණන්" යනුවෙන් සඳහන් කරන්නේ බුදුන් වහන්සේ වෛද්‍යවරයකු වන බවය. උත්තමයන්ගේ සේල සූත්‍රයේදී සේල බ්‍රාහ්මණයාට තමන් වහන්සේද වෛද්‍යවරයා යන නම සුදුසු බව කීහ. "භිසක්ක" නොහොත් "භෙසජ්ජ ගුරු" යනුවෙන් හඳුන්වනු ලබන බව සඳහන් වේ.

බුදු දහමෙහි චිකිත්සක නැඹුරුව ගැඹුරු ඇති සූත්‍ර ලෙස සබ්බාසව සූත්‍රය, සතිපට්ඨාන සූත්‍රය, වත්ථූපම සූත්‍රය, අනුමාන සූත්‍රය, නීවරණ සූත්‍රය, සල්ලේඛ සූත්‍රය, ආනාපානසති සූත්‍රය, විතක්ක සණ්ඨාන සූත්‍රය හා මහාසකුළුදායි සූත්‍රය ආදිය දක්විය හැකිය. විශේෂයෙන්ම සතිපට්ඨාන සූත්‍රයෙහි අන්තර්ගත කරුණු මනෝචිකිත්සාවක් ලෙසින් මෙන්ම මනෝ උපදේශන ක්‍රමයක් වශයෙන්ද ප්‍රායෝගිකව යොදාගත හැකි බව බොහෝ දෙනාගේ මතයයි. එසේම ආර්ය සත්‍ය සතර, අපි අටඟි මග වැනි කරුණු තුළින් පැහැදිලි වන්නේද මෙම චිකිත්සක නැඹුරුවයි.

අංගුත්තර නිකායේ දසම සූත්‍රයෙහි සද්ධා වර්ගයට අනුව "භිසී වජ්ජා භික්ඛවේ විමනං දෙන්ති" ලෙසින් බුදුන් වහන්සේ විසින්ම තමන්ව හඳුන්වා ඇත්තේ කාමා වෛද්‍යවරයකු සේම අරිය විමනය හා අරිය විරේචනය කරන බවය.

එසේම පන්සාලිස් වසක් පුරා දේශිත මධුර ධර්මය වූ කලී අප දෙයක් හොඳ මිනිසා විසින් දුක ඇතිකර ගන්නා ආකාරය සහ ඉන් මිදීමේ මගයි. සමාජයේ ලොකු කුඩා සෑම පුද්ගලයකුටම පොදු එම දුකින් ගලවා ගැනීමට උපදේශනය මෙන්ම මනෝ ප්‍රතිකාර කළ බවට දහස් ගණන් බෞද්ධ පොතපත සාක්ෂි දරයි. චුල්ලපන්ථක තෙරුන් හට සුදු රෙදිකඩක් පිරිමැදීමට දීමත් උපතිස්ස, කෝලිත දෙදෙනාට ධර්මය දෙසීමත් අතර ඇති විවිධත්වය කුමක්ද? ඒ පුද්ගල පෞරුෂත්වය අනුව කළ ප්‍රතිකර්මයන්ය.

**බුදු දහම උපදේශන ක්‍රියාවලියක් වශයෙන්**


බුදු දහමේ පදනම ආර්ය සත්‍ය සතර වන අතර ඒ තුළ සියලුම මනෝ විද්‍යාත්මක කරුණු අන්තර්ගත වේ. බුදු දහම පුරාම ඇත්තේ මනෝවිද්‍යාත්මක කරුණුය. බුදු දහම පුරාම ඇත්තේ මනෝවිද්‍යාත්මක නැඹුරුවකැයි, චිකිත්සක නැඹුරුවකැයි පිළිගන්නේ එබැවිනි.

උපදේශනයේදී සිදුකරන්නේ පුද්ගලයාගේ දුක හඳුනාගෙන එයට හේතු සොයා ඒවා පුද්ගලයාටම පෙන්වා දී ඉන් මිදීමට මග හෙළිකර දීමයි. උපදේශකවරයා මග පෙන්වනවා මිස අවසාන විසඳුම ලබාදෙන්නේ නැත. එය ලබාගත යුත්තේ සේවාලාභියා (Client) මය. තමා මග පෙන්වන්නකු පමණක් බවත්, නිවන, සැනසුම උදාකර ගත යුත්තේ තමන් විසින්ම වෙහෙස මහන්සි වී බවත් බුදුන් අවධාරණය කළේය. "තුම්හේහි කිච්චං ආතප්පං - අක්ඛාතාරෝ තථාගතා" යනුවෙනි නිදසුන් බොහෝ උපුටා ගත හැකිය. "අත්ත දීපා විහරථ - අත්ත සරණා අනඤ්ඤ සරණා" තමා තමාට පමණක් තොට වසන්න ආදී වශයෙන් තමා තුළින්ම සිය ජීවන විමුක්තිය උදාකර ගත යුතු බව පෙන්වන අතර උපදේශනයේ පදනමද එයයි. උපදේශක කරනුයේ පුද්ගලයාට මට උදව් කිරීම පමණකි.

විශාඛා මුණසිංහ

"අධික ලෝභයෙන් යුතුව යුක්තියට විරුද්ධ වූ ජය විනාසයයි - සේරිවාණිජ ජාතකය"





# බුදුන් වැඩි සොළොස්මස්ථානයන්

බුදුන් වහන්සේ ප්‍රථම වරට බුද්ධත්වයෙන් නව වන මස දුරුතු පුන් පොහෝදා උරුවෙල් දනව්වේ සිට ලංකාවේ මීනිපේ මහවැලි ගඟ අසබඩ මහියංගනයට වැඩි සේක. දෙවන වර බුදුන් වහන්සේ බුද්ධත්වයෙන් පස් වැනි වර්ෂයේදී බක්මස, අමාවක් පොහොය දා නාගදීපයට වැඩි සේක. තුන්වැනි වරට බුද්ධත්වයෙන් අටවැනි වර්ෂයේදී වෙසක් පුන් පොහෝදා පන්සියයක් රහතන් වහන්සේලා සමග කැලණියට වැඩි සේක.

තුන්වන වරට පැමිණි ගමනේදී සුමන සමන් දෙවි ඇරයුමෙන් සමනල පව්වේ බුදුසිරි පා සටහන් තැබූ සේක. වර්තමානයේදී සොළොස්මස්ථාන නමින් හඳුන්වන්නේ සිදා කැලණියට පැමිණි අවස්ථාවේදී ලංකාවේ විවිධ ප්‍රදේශවලට වැඩම කරමින් සම්බුදු පහසින් පිවිතුරු වූ ස්ථානයන්ය. එම සොළොස්මස්ථාන මෙසේය.

**1. මහියංගනය**

බදුල්ල දිස්ත්‍රික්කයට අයත් මහියංගනය මුල් යුගයේ බින්තැන්න නමින් හැඳින්විය. පාලි භාෂාවෙන් බින් යනු මහී කියාද, තැන්න යනු අංගන ලෙසද අර්ථ ගැන්වේ. ඒ අනුව බින්තැන්න (මහී + අංගන) මහියංගන විය.

බින්තැන්න යනු සිංහල වචනය පාලියට පරිවර්තනය වීමේදී මහියංගනය විය. බුදුන් වහන්සේ දනට මහියංගනය චෛත්‍ය පිහිටි ස්ථානයේදී යකුන් දමනය කළ සේක. එසේම මෙහිදී සමනල පව්වැසි සුමන සමන් දෙවි රදුන් ප්‍රධාන සත්වයාට දහම් දෙසූ සේක. දහම් අසා සුමන සමන් දෙවියන් සෝවාන් ඵලයට පිවිසියේය.

එමෙන්ම බුදුන් වහන්සේ විසින් පිළිගැන්වූ කේශ ධාතු රන් කරඬුවකින් පිළිගත් සුමන සමන් දෙවියන් කේශ ධාතු තැන්පත් කර සත් රියනක් ලෙසට චෛත්‍යයක් බඳවන ලදී.

පසුව සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍යයකු වූ සර භූ මහරහතන් වහන්සේ විසින් සර්වඥ ග්‍රීවා ධාතුව නිදන් කර එම සෑය වසා දොළොස් රියනක් උසට චෛත්‍යයක් කරවන ලදී. තෙවන වරට දෙවන පැතිස් රජුගේ සොයුරු උද්ධ චූලාභය කුමරා විසින් එම සෑය වසා තිස් රියනක් උස සෑයක් බඳවන ලදී.

සිව් වැනි වරට දුටුගැමුණු රජු විසින් එම සෑය වසා අසූ රියනක් උස මහා සෑයක් කරවන ලදී.

එමෙන්ම මහානාග, වොහොරිකතිස්ස, ධාතුසේන, පළමුවන සේන, පස්වන කාශ්‍යප, මහා විජයබාහු, මහා පරාක්‍රමබාහු, හතරවන පරාක්‍රමබාහු, විමලධර්මසූරිය, ශ්‍රී විජය රාජසිංහ, ශ්‍රී රාජාධිරාජසිංහ නමැති රජවරු මෙම චෛත්‍යය ප්‍රතිසංස්කරණය කරන ලදී.

මෙම සියවසෙහි මැද භාගයේදී පමණ ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මහතා විසින් මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අරඹන ලදී. පසුව සියලු ප්‍රතිසංස්කරණ කටයුතු නිමා කරමින් අගමැති ඩඩ්ලි සේනානායක මැතිතුමා විසින් මහියංගන චෛත්‍ය වෙත කොත් පළඳවන ලදී.

දනට විද්‍යමාන වන්නේ දුටුගැමුණු මහ රජතුමා විසින් කරවන ලද චෛත්‍යයේ ආකෘතියට නිම කරන ලද චෛත්‍ය රාජයාණන් වහන්සේයි.

ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ ජීවමාන බුදුන්ගේ ශාරීරික ධාතු නිදන් කර

සාදන ලද මහියංගන චෛත්‍යය සිංහල ජාතියේ සහ ලංකා බුද්ධ ශාසනයේ ඉතිහාසයටත් වඩා පැරණි වේ.

**2. නාගදීපය**

නාගයන් විසූ ස්ථානය නාගදීපය නම් වේ. බුදුන් වහන්සේ නාගදීපයට පැමිණියේ චූලෝදර, මහෝදර යන නාග රජවරු දෙදෙනාතු අතර මිණි පළඟක් නිසා සිදුවූ සටනක් සංසිඳවීම සඳහාය.

මෙහිදී බුදුන් සමඟ පැමිණි සමිද්ධි නම් දිව්‍ය රාජයා බුදුන්ට සෙවන පිණිස රාජායතන නම් කිරිපලු වෘක්ෂයක්ද ගෙන එන ලදී.

මේ අවස්ථාවේදී බුදුන් වහන්සේ යම මහ පෙළහැර පා යකුන් දමනය කළහ. එහිදී යකුන් මිණි පළඟ බුදුන්ට පිදූහ. පසුව නැවත මිණි පළඟ නා රජුන් වෙතම පවරන ලදී. අවසානයේ මොවුන් විසින් මෙම මිණි පළඟ නිදන් කර චෛත්‍යයක් ඉදිකරන ලදී.

රාජායතන වෘක්ෂයද මෙම තිඹෙම රෝපණය කරන ලදී. මෙහි චෛත්‍ය රාජායතන චෛත්‍යය නමින් හැඳින්වේ.

නමුත් අද මෙහි ඇත්තේ පෞරාණික දාගැබ නොවේ. නව චෛත්‍යයකි. අද රාජායතනය චෛත්‍යය වැඳ පුදා ගැනීමට දස දහස් ගණන් බැතිමත්හු නාගදීපයට පැමිණෙති.

**3. කැලණිය**

බුදුන් වහන්සේ බුද්ධත්වයෙන් අටවන වර්ෂයේදී මණි අක්ඛිත නා රජුගේ ආරාධනයෙන් කැලණියට වැඩිය සේක. මෙහිදී බුදුන් ධර්ම දේශනා කිරීම සඳහා වැඩ සිටි මැණික් පුටුව නිදන් කරවා මණි අක්ඛිත නා රජු විසින් මී ගොඩක ආකාරයෙන් (ධාන්‍යාගාර) චෛත්‍යයක් කරවිය. පසුව යටාලතිස්ස රජතුමන් විසින් මෙම චෛත්‍ය සැට රියනක් උස් කර බඳවන ලදී.

විහාර මහා දේවියගේ ජන්ම භූමිය වන්නේද කැලණිය පුරවරයයි. තවද දුටුගැමුණු, විජයබාහු, නිශ්ශංකමල්ල, හතරවන පැරකුම් යන රජවරුන්ගේ අනුග්‍රහය කැලණි විහාරයට නොඅඩුව ලැබුණි.

විශේෂයෙන් කැලණි විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා උනන්දුවෙන් කරවන ලදී.

මෙහි වර්තමානයේ ඇති දර්ශනීය විහාර මන්දිරය කැලණියේ හිටපු දායකතිනියක් වන හෙලේනා විජයවර්ධන මැතිනිය විසින් කරවන ලදී. කැලණි විහාරයේ චිත්‍ර සුප්‍රකට චිත්‍ර ශිල්පියකු වූ සොලියස් මැන්ඩිස් මහතා විසින් අඳින ලදී.

**4. ශ්‍රී පාදය**

සුමන සමන් දෙවියන්ගේ ආරාධනාවෙන් සමනල පර්වතයට වැඩම කරන ලද බුදුන් වහන්සේ ශ්‍රී පාද ලාංඡනය පිහිටුවූ සේක.

සිරි රාහුල හිමියන් ලියූ "සැලලිහිණි සංදේශ" කාව්‍ය සංග්‍රහයේ සමනල පව්ව වර්ණනා කර ඇත්තේ මෙසේය.

"සුර රද සමන් සමගින් සුරගන　　　　　　　　　　　එවර
පැහැසද මදාරා පරසතු මල්　　　　　　　　　　　　　පතර
කර පුද වලින් රැඳි මුණි සිරිපා　　　　　　　　　　　　සතර
සකි සඳ පෙනේ සමනොළ ගල　　　　　　　　　　　　නැගෙනහිර"

ශ්‍රී පාදය පිළිබඳව ජනශ්‍රැති රාශියක් ජනවහරේ භාවිත වේ.

උදාහරණ වශයෙන් ශ්‍රී පාදය භාතිකාභය රජුගේ උයනේ







සොරෙන් මල් නෙළීමට පැමිණ දෙවියකුගේ මඟ පෙන්වීමෙන් සොයාගත් බව කියවේ.

තවද නිශ්ශංකමල්ල රජු සිරිපා සවනත කැබූ මාණික්‍යමය පාසාණයේ ආරක්ෂාව පිණිස අවලොස් රියන් ගලකින් වසා ඒ මත ශ්‍රී පාද ලාංඡනය කෙටූ බවත් සඳහන් වේ. මහා පැරකුම් රජු සමන් දේවාලය ඉදිකර ඇති බව කියවේ.

අඩි 7000 ක් පමණ උස සමනල කන්ද බෞද්ධ, මුස්ලිම්, හින්දු, ඉංග්‍රීසි ආදි විවිධ සමයවාදීන්ගේ වන්දනාවට පාත්‍ර වූ අති උතුම් ස්ථානයකි.

**5. දිවා ගුහාව**

බුදුන් වහන්සේ සමනල පව්වේ සිරිපා සටහන තබා දිවා කාලයේ ගත කරන ලද ගුහාව දිවා ගුහා නම් වේ. සිරිපාද මාර්ගයේ මහගිරිදඹ අසල පිහිටි භගවා ලෙන, දිවා ගුහාව බවට විද්වතුන් විශ්වාස කරයි.

සමන් ගිරට පැමිණි බුදුන් වහන්සේ පන්සියයක් රහතුන් වහන්සේලා සමඟ දිවා විවේකය කළ දිවා ගුහාව ආශ්‍රිත පරිසරය අති පූජනීය වේ.

**6. දීඝවාපි චෛත්‍යය**

බුදුන් වහන්සේ මෙම ස්ථානයේ පන්සියයක් මහ රහතන් වහන්සේලා සමඟ සමවත් සුවයෙන් වැඩ විසූ බව සඳහන් වේ. මෙම ස්ථානයේ සද්ධාතිස්ස රජු විසින් සර්වඥ ධාතූන් තැන්පත් කර චෛත්‍යයක් කරවන ලදී. තවද මෙම චෛත්‍යය අවට යොදුනෙන් යොදුන පරිවාර චෛත්‍ය සොළසක්ද කරවන ලදී.

මෙම රජතුමා මෙහි දීඝවාපි (දික් වූ වැව) නමින් වැවක් කරවන ලදී. එම නිසා මේ ප්‍රදේශය දීඝවාපි නමින් හැඳින්වූයෙන් මෙම චෛත්‍යයද දීඝවාපි චෛත්‍යය නමින් ව්‍යවහාර විය.

එසේම පෙර පඬුවස් දෙව් රාජ්‍ය සමයේදී මෙහි පැමිණි දීඝායු නම් ශාක්‍ය කුමාරයෙක් මේ ප්‍රදේශය සංවර්ධනය කළ බැවින් දීඝාමඩුල්ල ලෙසද මෙම ප්‍රදේශය හඳුන්වයි.

**7. මුතියංගනය**

බුදුන් වහන්සේ පරිභෝග කළ තවත් ඓතිහාසික ස්ථානයකි මුතියංගනය. බුදුන්ගේ [illegible] සිහි කිරීම සඳහා මෙම ස්ථානයේ දෙවන පැතිස් රජතුමා [illegible] සර්වඥ ධාතූන් නිධන් කර චෛත්‍යයක් ඉදිකර [illegible] රුහ බෝධීන් වහන්සේ නමක් රෝපණය කරන ලදී. ශ්‍රී [illegible] බෝධීන් වහන්සේගෙන් හටගත් ඇටවලින් බෝ පැළ [illegible] ගැනිණි. ඒවා දෙතිස් ඵල රුහ බෝධි යනුවෙන් [illegible] පසු කාලයේදී සද්ධාතිස්ස රජු සහ පළවැනි ලෙදුටිස්ස [illegible] චෛත්‍යය සහ විහාරාරාමය ප්‍රතිසංස්කරණය කළහ.


**8. තිස්සමහාරාම චෛත්‍යය**

බුදුන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිටි ස්ථානයකි. මෙම ස්ථානයේ කාවන්තිස්ස රජතුමා විසින් බුදුන්ගේ වම් දළදාව නිධන් කර තිස්සමහා විහාරය ඉදිකර ඇත. පසු කාලයේ මෙම චෛත්‍ය රාජ්‍ය ඉලනාග, වොහාරතිස්ස, මහානාග යන රජවරුන් විසින් ප්‍රතිසංස්කරණය කෙරිණි.

වර්ෂ 1853 දී වෙලිගම සුමන නම් සාමණේරයන් වහන්සේ


# දළදා වරුණ

විසින් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ ලදී. ක්‍රි.ව. 1900 දී වැල්පිට මේධංකර හිමි විසින් මෙහි වැඩ කටයුතු නිමකර එම වර්ෂයේදීම කොත් පළඳවා ඇත.



**9. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ**

මෙයට වර්ෂ 2550 කට පමණ පෙර සම්බෝධියට පත් වූ සිදුහත් තවුසාණන්ට සෙවණ දුන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව සංඝමිත්තා මහ රහතන් වහන්සේ විසින් දෙවන පෑතිස් රජු දවස ලක්දිවට වැඩම කරවන ලදී. එය අද අනුරාධපුරයේ බුදුන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පාරිශුද්ධ වූ මහමෙව්නා උයනේ වැඩ සිටී. මෙය ලොව පැරණිම වෘක්ෂය ලෙස සලකයි.



**10. මිරිසවැටි චෛත්‍යය**

මෙම චෛත්‍යය දුටුගැමුණු මහරජතුමා විසින් කරවන ලද්දකි. සංඝයාට දන් පිරිනමා නැමී ගැනීම රජතුමාගේ සිරිත විය. දිනක් අමතක වීමෙන් මිරිස් මාලුවක් සංඝයාට නොදී අනුභව කළේය. මෙම අපහසුවීම සිහිවීම සඳහා මෙම චෛත්‍යය ඉදි කළේය. එමෙන්ම සම්බුද්ධ පහසින් පවිත්‍ර වූ ස්ථානයේ චෛත්‍යය ගොඩනංවා ඇත. දුටුගැමුණු රජතුමාගේ සාධාතුක කුන්තායුධය මෙහි නිදන් කර ඇති බව කියවේ. පසුකාලයේ වොහාරතිස්ස, පළමුවන කාශ්‍යප යන රජවරු මෙම චෛත්‍යය ප්‍රතිසංස්කරණය කරනු ලැබ ඇත.

**11. ස්වර්ණමාලි චෛත්‍යය**

දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද මෙම චෛත්‍ය සොළොස්මස්ථානවලින් වැදගත් වූ ස්ථානයකි. කකුසඳ, කෝණාගම, කාශ්‍යප, ගෞතම යන සිවු බුදුවරයන්ම මෙම ස්ථානයට වැඩම කළ බව සඳහන් වේ.

පූර්වයෙහි මිහිඳු මහ රහතන් වහන්සේ මෙම ස්ථානයේ සමන් මල් අට මිටක් පුදා අනාගතයේදී දුටුගැමුණු නම් රජතු විසින් මහා ස්තූපයක් මෙහි ගොඩනගන බව දෙවෙනි පෑතිස් රජුට දන්වා ඇත.

ස්වර්ණමාලි චෛත්‍යයෙහි සෝණුත්තර ස්ථවිරයන් විසින් නා ලොවින් ගෙනෙන ලද දෝණයක් පමණ සර්වඥ ධාතු හා අගනා මුතු මැණික් නිදන් කර ඇත.

දුටුගැමුණු රජතුමාට මෙම චෛත්‍යය නිම කිරීමට නොහැකි වුයෙන් සිය මලනුවන් වන සද්ධාතිස්ස රජතුමා විසින් නිම කරන ලදී. රුවන්වැලි සෑයේ නවතම ප්‍රතිසංස්කරණ කටයුතු 1873 දී සුමනසාර නම් හිමිනමක් විසින් ආරම්භ කළ අතර 1938 දී ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර කොත් පළඳවා තිබේ.

**12. ථූපාරාමය**

ලංකාවේ බුදු දහම ස්ථාපිත වුවායින් පසුව සෑදවූ ප්‍රථම චෛත්‍යය වන ථූපාරාමය දෙවන පෑතිස් රජතුමා විසින් කරවන ලද්දකි. බුදුන්ගේ දකුණු අකු ධාතුව මෙහි නිදන් කර ඇත.

සම්බුදු පහසින් පවිත්‍ර වූ මෙම චෛත්‍ය ඇතුළත් ප්‍රදේශයේ ආරාමයක්ද කරවීය. එබැවින් මෙම චෛත්‍යය ථූපාරාමය නම් විය.

මෙම චෛත්‍යය වටා පසු කාලයේදී වසභ රජතුමා විසින් ගෘහයක්ද කරවීය. එය "චේතියඝර" ලෙස හැඳින්විය. අද දක්නට ඇත්තේ එහි කුළුනු පමණි.

**13. අභයගිරි චෛත්‍යය**

මෙම චෛත්‍යය වලගම්බා හෙවත් වට්ටගාමිණීඅභය රජතුමා විසින් අනුරාධපුරයේ මහ මෙව්නා උයනේ සම්බුදු පහසින් පාරිශුද්ධ භාවයට පත්වූ භූමියේ ඉදිකර ඇත. වලගම්බා රජුගේ ප්‍රථම රාජ්‍ය කාලයේදී ඇතිවූ සටනකදී රජතුමා පැරදී පලා යාමේදී ගිරි නම් නිගණ්ඨයකු මහා කළු සිංහලයා පලා යනවා යැයි හඬ නගා කෑගැසීය. පසුව රජතුමා දෙවන වර රජ වූ අවස්ථාවේදී එහි තිබූ නිගණ්ඨ ආශ්‍රමය බිඳ දමා තමාට උදව් කරන ලද මහා තිස්ස ස්ථවිරයන් වහන්සේට මෙම විහාරය කරවා පූජා කර තිබේ.

මෙම චෛත්‍යය ලොව උසම චෛත්‍යවලින් දෙවන තැන ගිම් කර ගනී. උස අඩි 370 ක් පමණ වේ. පසු කාලයේ පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කොට ඇත.

**14. ජේතවනාරාමය**

මහසෙන් රජතුමා විසින් ජෝතිය වන හෙවත් නන්දවන උයනෙහි කරවන ලද බැවින් ජේතවන චෛත්‍ය නමින් හැඳින්වේ.

ලොව ඇති උසම චෛත්‍යය වන මෙය උස අඩි 400 ක් පමණ වේ. බුදුන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිටි ස්ථානයෙහි මෙම චෛත්‍යය ඉදිකර ඇත. බුදුරදුන්ගේ පටි ධාතුවෙන් කොටසක් සහ සර්වඥ ධාතු නිදන් කර චෛත්‍යය ගොඩනංවා ඇත.

පසු කාලයේදී කිත්සිරි මෙවන්, මහානාග ආදී රජවරු චෛත්‍ය ප්‍රතිසංස්කරණය කිරීමට දායක වී තිබේ.

**15. සේල චෛත්‍යය (සෙලු චෛත්‍ය)**

සර්වඥ පාරිභෝගික ශුද්ධ ස්ථානයේ මහාදාඨික මහානාග රජු විසින් මෙම චෛත්‍යය ගොඩනංවා ඇත.

මෙය කළු ගල් තලාවක් මත ගොඩනංවා ඇති බැවින් මෙම නම යොදා ඇත. මිහින්තලාවේ ඇති ප්‍රධාන චෛත්‍යයක් බැවින් මහාසෑය යන නමින්ද හැඳින්වෙයි. බුදුන් වහන්සේ මෙම ස්ථානයේ සමවත් සුවයෙන් වැඩ සිටි සේක. එමෙන්ම බුදුන්ගේ ඌර්ණ රෝම ධාතුව නිදන් කර චෛත්‍ය ගොඩනංවා ඇත. මෙහි වැඩ අවසන් වූ පසු ලංකාව පුරා ගිරිභාණ්ඩ මහා පූජාවක් කළ බව මහාවංශයෙහි සඳහන් වේ.

**16. කතරගම කිරි වෙහෙර**

බුදුන් වහන්සේ මෙහි පැමිණ මෙම ප්‍රදේශයට අධිපතිව සිටි මහසේන රජුගේ මඟුල් උයන වන කිහිරි වනයෙහි හිඳ දහම් දෙසූ සේක.

බුදුන්ගේ කේශධාතු සහ මෙහිදී බුදුන් වැඩ හිඳී ස්වර්ණමය ආසනය සහ සිදුහත් කුමරු පැවිදි වෙද්දී කේශ ඡේදනය කරන ලද කඩුවද නිදන් කර දෙවන පෑතිස් රජුගේ සොහුරු මහානාග යුව රජු විසින් කිරි වෙහෙර චෛත්‍ය කළ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ. තවද දෙවන පෑතිස් රජතුමා විසින් දෙතිස් ඵල රුහ බෝධීන් වහන්සේ නමක්ද රෝපණය කරන ලදී. එය කතරගම මහ දේවාලය සමීපයේ පිහිටා ඇත.

මංගල මහා සෑය ලෙසද හඳුන්වන මෙම චෛත්‍යයට කිරිවෙහෙර යන නම ලැබුණේ කිරි පැස්වලින් පුන් උපනත කරවූ බැවින් යයිද මතයක් පවතී.

ඉහත සඳහන් කරන ලද සොළොස්මස්ථාන සියල්ල බුදුන් වහන්සේ තෙවන වර ලංකා ගමනයේදී රහතුන් වහන්සේලා පන්සිය නමක්ද සමඟ සර්වඥ පාරිභෝගික ශුද්ධ භූමි බවට පත්වූ ස්ථාන බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ.

එච්. ජේ. ප්‍රියන්ත කුමාර - ගම්පොල

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස වන දරුවෝත් නැත. පියවරුයෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."


# සිංහල අවුරුදු උළෙල හා

## මහනුවර නාථ දේවාලය අතර ඇති සම්බන්ධතාවය

බක් මාසයේ එළඹෙන සිංහල, හින්දු අලුත් අවුරුදු උළෙල ගොවිතැන හා සශ්‍රීකත්වය පදනම් කරගත් පැරණි රාජ්‍ය උළෙලකින් ආරම්භ වූ බව පෙනෙයි. බුදු දහම පැමිණි පසු එම රාජ්‍ය ලක්ෂණ ක්‍රමයෙන් නැතිවෙන්නට විය. මහනුවර නාථ දේවාලය සිංහල අවුරුදු උළෙලේදී ඉතා වැදගත් ස්ථානයක් ගනී. ඒ පිළිබඳ කෙටි සටහනක් මේ ලිපියේ එයි.

ටිබෙට්, චීනය, ජපානය වැනි මහායාන රටවල අවලෝකිතේශ්වර නාථ ඉතා බලගතු බෝධිසත්ත්වවරයෙකි. අනුරාධපුර මුල අවධියේ සිටම අවලෝකිතේශ්වර නාථ බෝධිසත්ත්වයන් හා එතුමන්ගේ බිසව වූ තාරා දෙවඟන ලංකාවේ පුද පූජා ලබා ඇත. විශේෂයෙන් නැව්, කොටු හා වරාය ආශ්‍රිතව අවලෝකිතේශ්වර නාථ වන්දනාව පැතිර තිබුණි.





වැලිගම කුෂ්ඨරාජගල බෝධිසත්ව ප්‍රතිමාව ලෙඩ රෝග සුව කිරීමේ හැකියාව නිරූපණය කරන අවලෝකිතේශ්වර නාථ දෙවිඳුගේ ප්‍රතිමාවක් ලෙස හඳුනාගෙන ඇත. මෙය අටවැනි සියවසේදී පමණ තනලා ඇත. අවලෝකිතේශ්වර නාථ දෙවියන්ට රෝග සුව කිරීමේ බලයක් ඇති බව අභයගිරිය හා ජේතවනාරාමය මහායාන ආයතන මගින් මහායාන අදහස් ලංකාවේ පැතිර ගියේය.

කෝට්ටේ යුගය පමණ වන විට ශ්‍රී රාහුල හිමි වැඩ සිටි තොටගමු විහාරය, දොරවක විහාරය ඇතුළු ස්ථාන ගණනාවක අවලෝකිතේශ්වර නාථ හා තාරා බිසව වන්දනා කර ඇත. මහනුවර යුගයේ ලියවුණු "වදන් කවි පොත" නාථ දෙවිඳුගේ නුවණ, ආරක්ෂාව, පිහිට ඉල්ලයි.

මහනුවර යුගය වන විට අවලෝකිතේශ්වර නාථ දෙවිඳුගේ මහායාන ස්වරූපය යටපත් වී "නාථ" යන කෙටි නමින් හා බෞද්ධ ලක්ෂණවලින් ඉස්මතු වන්නට විය. මහනුවර දුම්බර අවධියේ නාථ දෙවි මුලින්ම වැඩ සිටියේ ලේවැල්ල නුදුරු යක්ගහපිටිය ගමේය. දුම්බරට බලය පෑ පිටියේ දෙවි අතින් නාථ දෙවි පැරදී මහනුවර ධර්මරාජ කන්දට පසු බැස දැන් මහනුවර නාථ දේවාලය පිහිටි ස්ථානයට නාථ දෙවි පසුව පැමිණ ඇත.

අනුරාධපුර අග අවධිය තුළ සිටම මහායාන බෞද්ධයන්ගේ පුද පූජා ලැබූ කුඩා නාථ දේවාලයක් මහනුවර නගරයේ තිබී ඇත. මෙම ස්ථානය බොහෝ විට මහනුවර නාථ දේවාලයේ පසෙක දකුණට පිහිටා ඇති ගම්භාර හෙවත් භූනියන් දේවාල ගොඩනැගිල්ල විය හැක. මෙම කුඩා ගම්භාර දේවාලය අනුරාධපුර අග කල පමණ මහනුවර ඉදිවූ මුල්ම කුඩා නාථ දේවාලයයි.

දැනට මහනුවර ඇති නාථ දේවාල ගෙඩිගේ ගම්පොළ යුගයේ වික්‍රමබාහු රජු කල ක්‍රි.ව. 1362 ඉදිකළ ගොඩනැගිල්ලකි. ගල් හා ගඩොලින් කළ බෝකුටු වහලක් සහිත ගොඩනැගිලි "ගෙඩිගේ" යනුවෙන් හඳුන්වයි. මෙම නාථ දේවාල ගෙඩිගේ ගම්පොළ අගකල ඉදිවූ අතර විජයනගර් ශෛලිය අනුව ඉදිකර ඇත. 1362 නාථ දේවාල ගෙඩිගෙය ඉදිවූ පසු ඒ වනතුරු කුඩා ගොඩනැගිල්ලක වැඩ සිටි නාථ දෙවි රුව අලුත් විශාල ගෙඩිගේ ගොඩනැගිල්ලට වැඩම්මවා ඇත. ඉන්පසු හිස්වූ පැරණි කුඩා නාථ දේවාල ගොඩනැගිල්ල ගම්භාර හෙවත් භූනියම් දෙවිඳුට වෙන්කර දී ඇත.

පිටියේ දෙවි අතින් නාථ දෙවි පැරදුණු පසු එතුමාගේ මහායාන ලක්ෂණ යටපත්ව ගොස් නාථ නමින් බෞද්ධ ලක්ෂණ ඉස්මතු විය. එමෙන්ම නාථ යනු මතු බුදුවන මෛත්‍රී බෝධිසත්වයන් ලෙස වැඳීම පිළිගැනීමක්ද රටේ පොදු ජනයා අතර පැතිර ගියේය.

උඩරට රජවරුන් ඔටුනු පැළඳීම, රජ නාමය තෝරා ගැනීම, හිසතෙල් ගෑම කළේ නාථ දේවාලයේදීය. එදා රජවරුන්ගේ අභිෂේකය සිදු කළ මෙහි වූ වෘත්තාකාර මණ්ඩප පෘතුගීසීන් විසින් විනාශ කර ඇත.

අවුරුදු කාලය ග්‍රීෂ්ම කාලයයි. සමකය අවට පිහිටි ලංකාවට මාර්තු 21 වනවිට හිරු මුදුන් වෙයි. ග්‍රීෂ්මය දැඩි වෙයි. ලෙඩ රෝග පැතිර යයි. ගත සිත වියළයි. අවුරුද්දට නැකතට හිස තෙල් නානු ගැල්වීමෙන් ගත සිත සිසිල් වෙයි. ග්‍රීෂ්මයෙන් තැවෙන සිරුර ඉන් මුදවයි. නැකතට හිසතෙල් ඖෂධීය නානු ගෑමෙන් ලෙඩ රෝග දුරලයි. රාජකීයයන් හිසතෙල් නානු ගෑවේද නාථ දේවාලයේදීය.


අලුත් අවුරුදු උදාවට පෙර ඔසු රැස් කොට හිසතෙල් නානු පිළියෙළ කොට මැටි මුට්ටි බහා රටපුරා විහාර දේවාලවලට යවන ලද්දේ මහනුවර නාථ දේවාලයේ සිටය. ඊට හේතුව නාථ දෙවි ලෙඩ රෝග සුව කිරීමේ බලයක් ඇති බව පිළිගත් බැවිනි. ඒ නිසා මහනුවර පිහිටි ශ්‍රී නාථ දේවාලය අලුත් අවුරුදු උළෙලේදී ඉතා වැදගත් ස්ථානයක් උසුලයි.

**එස්. ජේ. ජයවර්ධන**

දළදා වරුණ

30

# මොකක්ද මේ හිඳගල ශිලා බන්ධ ලිපිය



මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගරයේ සිට සැතපුම් 5 ක් පමණ පේරාදෙණිය හරහා ගලහ මාර්ගයේ පිහිටි හඳුවන හිඳගල ප්‍රදේශයේ මහා මාර්ගයේ සිට අඩි 150 ක් පමණ කන්ද දෙසට වන්නට පිහිටා ඇති හිඳගල රජමහා විහාරයේ පිහිටුවා ඇති ලිපියකි හිඳගල ශිලා බන්ධ ලිපිය. මෙම විහාරයේ ශිලා ලිපි දෙකක් දක්නට ලැබේ. ඉන් එක් ලිපියක ගර්භ චෛත්‍යයට දකුණින් පිහිටා ඇති නමුත් දැන් මෙම ලිපියේ අක්ෂර බොහෝ සෙයින් ඇඹී ගොස්ය. අනෙක් ලිපිය විහාරයේ ගල මුදුනේ එක් කෙළවරක පිහිටා ඇත. මෙම ලිපියේද ඇති අක්ෂර මැකී ගොස්ය. මෙම ලිපියේ "වටකවිහර" යන වචනය පමණක් දක්නට ලැබේ.

ගර්භ චෛත්‍යයට දකුණින් පිහිටා ඇති ශිලා ලිපිය හිඳගල ශිලා බන්ධ ලිපිය ලෙස සැලකේ. අඩි 7 ක් පමණ වූ ගලක කොටා ඇත. මෙය පේළි 5 කින් යුක්තය. එක් අක්ෂරයක උස අඟල් 2-7 දක්වා වූ ප්‍රමාණයෙන් යුක්තය. මෙය තරමක් දුරට ආරක්ෂා වීම නිසා කියවා ගැනීම පහසුය. ක්‍රි.ව. 1938 වර්ෂයේදී ඩී. ජේ. ජයසුන්දර මහතා විසින් ස්පර්ශ ලාංඡන (Stampage) කරනු ලැබූ මෙම ලිපිය දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇත. මෙම ශිලා ලිපිය පිළිබඳව එච්. සී. පී. බෙල් හා එස්. පරණවිතාන අධ්‍යයනය කර, ඒ හා සම්බන්ධ බොහෝ තොරතුරු ගෙනහැර දක්වා ඇත.

**හිඳගල ශිලා බන්ධ ලිපිය :**

1. පටසල අබිල අරක තන ලද
2. ලකජය මහමති සමන ගණ
3. අණන තන යලක විදි කනමුදු මජ
4. ගෙටයන පනවලිසි පිලියත ව පත
5. සයක කනවණ ඉව මරණඳි කෙරි බෝයගෙ

එනම්: පටසල අම්බලමේ ආරක්ෂක තනතුර ලද ලංකාජය මහ ඇමැති වන සමන ගන ආඥාවෙන් තුන්යාල්ක වීදි කනමුදු ගමේ මජ නම් ගෝෂ්ඨිකයා වස්තු 45 ක්ද, පන්සියක කහවණුද මෙම කියන දේ බෝධිඝරයක් කළා...

මෙහි විශේෂ වූ වචනාර්ථ ගණනාවක් ඇත. පළමු පේළියේ පටසල ලෙසට ප්‍රදේශයෙන් අදහස් වන බව සෙනරත් පරණවිතාන මහතා අදහස් කරනු ලබයි. පටසල අබිල යන පද දෙකෙහිම ස්ථාන නාමයක් අදහස් වන බව සී. ඩබ්ලිව්. නිකලස් මහතාද වචනයක් ඉදිරිපත් කරයි. මෙහි එන අබිල යන්න සිංහලයේ අම්බලම් යන්නත්, ද්‍රවිඩ භාෂාවේ අම්බලම් යන්නත්, සංස්කෘත භාෂාවේ අම්බර යන්නත් සමාන පදයකින් බිඳී ආවා වන්නට පුළුවන.

"අරක තන ලද" යන පදයේ අර්ථය ඉතාමත් පැහැදිලිය. අරක යන්න සංස්කෘතයෙන් අරක්‍ෂා ලෙසට යන්න පදයක් බවට පරණවිතාන මහතා පෙන්වා දෙයි. මෙයින් ආරක්ෂකයකු ගැන අදහස් වන බවට නිකලස් මහතාද කියා සිටී. "තන" යන්න තනතුරක් අදහස් වන බව කිව හැකිය. එවිට තන ලද යන්න සමාන කළ හැකි පද ලෙස 9, 10 වන ශත වර්ෂවලට අයත් ශිලා ලිපිවල එයි. උදා: පත්ලද්, රටිලද්, ගම්ලද් ලෙසයි. ඒ අනුව ආරක්ෂක තනතුරක් ලද අයකු ගැන මෙයින් අදහස් වන බව කිව හැකිය.

"යලක, වි ද, කෙරි, ගෙ" යන වචනද ඉතා වැදගත්ය. මෙහි යලක යන්න සංස්කෘත භාෂාවෙන් "යකට" යන්නෙහිද, "වි" යන සංස්කෘත වචනවලින් "විශ්‍රී" යන්නෙන්ද, "ද" යනු "දා" යන්නෙන්ද, "කෙරි" යනු "කා" යන්නෙන්ද, "ගෙ" යනු "ගෙහ" යන්නෙන්ද බිඳී ආ බව සිතිය හැකියි. තවද මෙහි "කන" යන්න "කින" ලෙසද හිඳුරේගල සෙල් ලිපියෙන් අදහස් වේ. සංස්කෘත භාෂාවෙන් "ත්‍රිනි" ලෙසද නූතන සිංහලයෙන් "තුන" ලෙසද හැඳින්වේ.

"ලකජයමහමති සමන ගන" ලෙසට මහ ඇමැතියකු හා ඔහුගේ නම සඳහන් වන්නට යොදා ඇතැයි පෙන්වා දීමට පුළුවන. මෙහි ගන යන්න අර්ථකථනයක් දීමට අසීරු බව පරණවිතාන මහතා අදහස් කරයි. "ගන" යන්නට සමූහයා මෙන්ම නමුදාවද අර්ථවත් වන බව ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ (293 වන පිටුවේ) සඳහන් වේ. මේ අනුව මෙම පදයද ආරක්ෂක අර්ථයකින් යොදන්නට හැකි බවත්, මෙය ඉහත සඳහන් කරන ලද තනතුරට යටි අයුරකින් සම්බන්ධ වන පදයක් වන්නට ඇති බවත් මම පෙන්වා දෙමි. "සමන ගන" යන පද දෙකෙන් "ගන" සමූහයා ලෙසත්, "සමන" යන්න සංසිඳවීම අර්ථයක් ගෙන දෙයි. මෙම අර්ථ පදනම් කරගෙන මා මෙහි අර්ථය ලෙස සමූහය සංසිඳවීම අර්ථයක් ගෙන දීමට උත්සාහ කරමි. එමෙන්ම මෙම පදය විශේෂණ පදයක් වීමට හැකි බව පෙන්වා දීමටද උත්සාහ කරමි.

"කනමුදු මජ" යන්නෙහි කනමුදු ස්ථාන නාමයක් ලෙසද, මජ යනු පුද්ගල නාමයක් විය හැකි බවද අනුමාන කළ හැකිය. "ගෙයග" යනු සංස්කෘත භාෂාවෙන් "ගෝෂ්ඨික" යන්නයි. "පනවලිසි" යනු පන්සාලිස් ලෙසද, පනසයක යන්න පන්සියයක් වේ. "මතෙක" යන්න සිංහලයෙන් මෙතෙක යන්න වේ. "කෙරි" යනු "කෙළේය" යන්න අර්ථයක් ගෙන දෙයි.

මෙම ශිලා ලිපිය තරමක් දුරට අනුරාධපුර වෙස්සගිරි ලිපියට සමාන බව පෙනේ. මෙම ශිලා ලිපිය හා හිඳගල ශිලා ලිපියේ ඇති අක්ෂරවල හැඩයන් එකින් එකට සමානකම් දැකිය හැකි බව පෙනේ. (Inscriptions of Ceylon, vol. ii, Pt. i, pp. 48-51) උදා: ඔ = ම = ක වැනි අක්ෂර එකින් එකට සමාන වන බව පෙනේ. හිඳගල ශිලා ලිපියේ එන අක්ෂර වූ ල, ස, ක, න, ආ විකාශනය වීමේ ලක්ෂණ මෙම ශිලා ලිපියෙන් පිළිබිඹු වී ඇත. මෙලෙසින් සලකා බලන විට මෙම සෙල් ලිපියේ අක්ෂර ක්‍රි.ව. 6 හෝ 7 ශත වර්ෂවලට අයත් වන බව හඳුනා ගත හැකි වේ. ඒ අනුව මෙම සෙල් ලිපියේ කාල නිර්ණය ලෙසද ක්‍රි.ව. 6 හෝ 7 ලෙස සැලකිය හැකි බවයි.

මෙම සෙල් ලිපිය මගින් පෙනී යන්නේ යම් ඇමැති කෙනෙකුගේ හෝ ඔහුගේ අතින් හෝ කරනු ලැබූ කටයුත්තක් ගැනය. නමුත් මෙම සෙල් ලිපියෙන් නියම අර්ථය ලබාගැනීම ගැටලු සහගතය. මෙම සෙල් ලිපියෙන් රජ කෙනෙකුගේ පාලන මධ්‍යස්ථානයක් නොව සිටි ඇමැතිවරයකුගේ පාලන ප්‍රදේශයක් වූ බව සිතිය හැකිය. "පටසල අම්බලමේ ආරක්ෂක තනතුර ලද ලකජය මහමති" ලෙස දැක්වීමෙන් පෙනී යයි. මේ අනුව පෙනී යන්නේ එකල මෙම ප්‍රදේශය යම් ප්‍රාදේශීය පාලකයකුගේ හෝ ඇමැති කෙනෙක් යටතේ හෝ පාලනය වූ ප්‍රදේශයක් බවයි. මෙලෙසින් සලකා බැලීමේදී අනුරාධපුර යුගයට සමකාලීන මෙම ප්‍රදේශය ප්‍රාදේශීය පාලකයකුගේ හෝ ඇමැතිවරයකුගේ යටතේ පාලනය වූ ප්‍රාදේශීය පාලන ප්‍රදේශයක් ලෙසය. ඒ අනුව දේශපාලන වශයෙන් යම් තොරතුරු කිහිපයක් හෝ මෙම සෙල් ලිපියෙන් ලබාගත හැකි වෙයි.

ඒ. ජේ. බී. පායින්ගමුව - මහනුවර


"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇලුණේද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැමදම මනාව පිබිදී පුබුදිත්."

# සදහම් ප්‍රහේලිකා අංක - 84

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 78, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය අප්‍රේල් මස 20 වෙනිද බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.




### ▶ හරහට

1. සතරමග සතරරල්ලවලින් එකකි.
4. සිව්බඹ විහරණවලට අයත්ය.
7. අධික ශීත දේශගුණය පවතින කාලවලදී මේවා ලුවුව හැකිය.
8. දේශීය වෛද්‍යවරු රෝග පරීක්ෂාවේදී මේවා අල්ලා බලති.
10. නුවරඑළිය දිස්ත්‍රික්කයේ මේවා වැඩිපුර දක්නට ඇත.
11. චන්ද්‍රයාට සමාන පදයකි.
12. එද ඉන්දීය සමාජයේ මෙබඳු සිටුවරුද සිටියහ.
13. මේ කියන දෙය අත්තල පුතු බව බුද්ධ දේශනාවයි.
15. ගංගාවල මෙබඳු තැන්ද ලුවුව හැකිය.
16. බුදුරජුන් කිසාගෝතමියට අබ මිටක් රැගෙන එන්නට කීවේ මෙබඳු ගෙදරකිනි.
17. මේවා පළදින්නට කාන්තාවෝ බෙහෙවින් කැමතිය.
18. මුහුදට සම්බන්ධයි.
19. සම්භාර පවුකාරයන් මේවාද භාවිත කොට සතුන් දඩයම් කරති.
20. මහා ප්‍රඥාලාභී අග තෙරණිය.

### ▼ පහළට

2. මෙබඳු දේවාලයක්ද දළඳා මාලිගා පරිශ්‍රය තුළ තිබේ.
3. පොසොන් පොහෝද වන්දනා කරන අනුබුදු හිමියාණෝ.
5. සූර්යයාට සමාන පදයකි.
6. ගීතයකට මෙය තිබිය යුතුමය.
9. දිව්‍යලෝක හයෙන් එකකි.
10. "අඳුරු" යන අර්ථය ගෙන දෙයි.
11. මැදින් පොහොයට බොහෝ දෙනා වන්දනා කරන පුද බිමකි.
14. ගස්වල සිපේ.
17. ගාලු දිස්ත්‍රික්කයේ පිහිටි කුඩා ගංගාවකි.
18. බෞද්ධ කොඩියට අයත් වර්ණයකි.

### ප්‍රහේලිකා අංක 83 ජයග්‍රාහී වාසනාවන්තයෝ

- අනුෂ්කා හරින්දි, 29/26-එල්, අම්පිටියපාර, මහනුවර.
- යූ.ආර්.එන්. රත්නායක, 16/2, වැලිගල්ල, පුවක්පිටිය
- වයි.කේ. රංජිත්, 13/14, සිරිමල් උයනපාර, අංගොඩවල, මහනුවර

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ හැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දහයකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සම්භාවිත් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ ප්‍රවෘත්තියේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් තිස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගාව, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# සමස්ත ලංකා මට්ටමින් බොදු ගී තරඟාවලියක්

## අයදුම්පත් දැන් භාර ගනී

**මෙවර** වෙසක් පූජෝත්සවය නිමිති කරගෙන "සමස්ත ලංකා බොදු ගී රසික සංසදය" තෙවන වරටත් සංවිධානය කරනු ලබන "බුද්ධාභිවන්දනා" බොදු ගී තරඟාවලිය සඳහා දැන් අයදුම්පත් භාරගනී. වාණිජත්වයට බරවූ වත්මන් සමාජය තුළ වේගයෙන් බිඳැර වෙමින් පවතින සුභාවිත බොදු ගීතය යළි සම්පන්නගත කිරීමේ සහ ගීත ගායනයේ දක්ෂතා ඇති ආධුනික ගායක ශිල්පීන්ව රටට හඳුන්වා දීමේ යන අරමුණ ඇතිව සමස්ත ලංකා මට්ටමින් සංවිධානය කරනු ලබන මෙම "බොදු ගීතාවලී තරඟයෙන්" ජය ලබන අයට මුදලින් වටිනා ත්‍යාග, සංගීත භාණ්ඩ, සම්මාන වලංක හා වටිනා සහතික පත් පිරිනැමීමට කටයුතු යොදා තිබේ.

ළමා සහ විවෘත යන අංශ දෙක යටතේ පවත්වනු ලබන මෙම බොදු ගී ගායනා තරඟාවලිය ප්‍රවීණ විනිසුරු මඬුල්ලක් හමුවේ ඉදිරිපත් කෙරෙන අතර අවසන් මහා තරඟය උත්සවාකාරයෙන් කොළඹදී පැවැත්වේ. බුද්ධාලම්භන ප්‍රීතිය දනවන මෙම බොදු ගී තරඟය සඳහා ඉදිරිපත් වීමට ඔබත් කැමති නම් විස්තර හා අයදුම් පත් ඉල්ලා තම ලිපිනය ලියූ දිග මුද්දර කවරයක්ද සමග පහත සඳහන් ලිපිනයට එවන්න. ජාතික සංවිධායක, "සමස්ත ලංකා බොදු ගී රසික සංසදය", රුවන් පෙදෙස, සිංහාරාවත්ත, ගම්පහ. 071-4961390 දුරකථන අංකය අමතාද වැඩි විස්තර ලබාගත හැකිය.

# බෞද්ධ පුවත්

## ගිරිමානන්ද සූත්‍රයෙන් හිස තෙල් පිරිත් කිරීම අස්ගිරිය මහා විහාරයේදී

**සිංහල** අලුත් අවුරුද්දේ හිස තෙල් ගෑමේ චාරිත්‍රය අනුව යොදාගනු ලබන ඖෂධීය තෙල් ගිරිමානන්ද සූත්‍රයෙන් 108 වතාවක් පිරිත් කිරීම මෙම වසරේත් 2015 දහසය වැනි වතාවටත් ආගමානුකූලව මහනුවර අස්ගිරිය ශ්‍රී විජයසුන්දරාරාම පුරාණ විහාරයේදී අස්ගිරිය සංඝ සභාවේ මහෝපාධ්‍යාය ශාස්ත්‍රවේදී, පණ්ඩිත, අම්බන්පුර පියරතන නාහිමිගේ මූලිකත්වයෙන් සිදුකෙරේ.


හිස තෙල් ගෑමේ නැකැත් චාරිත්‍රය 15 වෙනි බදාදා පූර්වභාග 09.06 ට යෙදෙන සුබ මොහොතින් දකුණු දිශාව බලා හිසට කොළොංගි පත්‍ර, පයට කොළොන් පත්‍ර තබා ලා කොළ පාට වස්ත්‍රයෙන් සැරසී සිදු කෙරේ. හිස තෙල් පිරිත් කිරීම දින කුනකට කලින් විශේෂ පිරිත් මණ්ඩපයක් තුළදී අම්බන්පුර පියරතන හිමි විසින් ආරම්භ කරනු ඇත.

හිස තෙල් බෙදා දීම අප්‍රේල් 14 වැනිදා සවස සිදුකෙරේ.

## අම්පිටියේ සිරි විමල නාහිමිපාණන්ගේ තුන් මාසයේ ගුණසමරු පින්කම

**අපවත්** වී වදාළ අම්පිටිය ශ්‍රී ජෙමිසන් ජාත්‍යන්තර බෞද්ධ භාවනා මධ්‍යස්ථානාධිපති, මහනුවර දිසාවේ ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ ප්‍රධාන සංඝනායක, ශාස්ත්‍රපති අම්පිටියේ සිරි විමල නාහිමිපාණන්ගේ තුන් මාසයේ ගුණ සමරු පින්කම අප්‍රේල් 4, 5 දිනයන්හි ජෙමිසන් භාවනා මධ්‍යස්ථානයේදී පැවැත්වේ. 4 වෙනිදා රාත්‍රී කැටවල ශ්‍රී විද්‍යාලෝක මහා පරිවේණාධිපති කපුලියද්දේ ගෙලහලාරාමාධිපති කපුලියද්දේ ජිනසිරි නාහිමි විසින් පවත්වනු ලබන ධර්ම දේශනාවකි. පසුදින (5) මහා සංඝරත්නය විසිපස් නමක් විෂයෙහි පිරිනමනු ලබන සපිරිකර සංඝගත දක්ෂිණාවකි. මෙම ගුණ සමරුවට සමගාමීව මාර්තු 30 සිට සතියක් ගුණසමරු පින්කම් මාලාවක් කුඹියන්ගොඩ විද්‍යාශේඛර පිරිවෙන් විහාරයේදී පරිවේණාධිපති තලාතුඔයේ සමිද්ධි හිමි අනුශාසකත්වයෙන් පැවැත්වේ.

## වෛද්‍ය බෝගමුව ඉන්ද්‍රරතන හිමි වෛද්‍ය මණ්ඩලයේ සභාපති ධුරයට නිතරගයෙන් පත්වේ



**මහනුවර** අස්ගිරිය මහා විහාරයීය කර්මාචාර්ය, වෛද්‍යාචාර්ය බෝගමුවේ ඉන්ද්‍රරතන හිමි හයවෙනි වතාවටත් මහනුවර ගම්පළ කෝරළයේ ආයුර්වේද සංරක්ෂණ සභාවේ සභාපති වශයෙන් නිතරගයෙන් පත්ව ඇත.

අස්ගිරිය මහා විහාරයීය සමාජ සත්කාර පදනමේ නිර්මාතෘවර සද්ධර්ම කීර්ති, සාමවිනිසුරු බෝගමුවේ ඉන්ද්‍රරතන හිමි, මධ්‍යම පළාත් දේශීය වෛද්‍ය සංගමයේ සහ වෛද්‍ය බෝගමුවේ ඉන්ද්‍රරතන වෛද්‍ය සේවා පදනමේ සභාපති වශයෙන්ද, ගෙඩිගේ රජමහ විහාරයේ ධම්මකිත්ති දහම් පාසලේ ධර්මාචාර්ය වශයෙන්ද කටයුතු කරයි.

ශ්‍රී දළදා මාලිගාවේ ශ්‍රී දළදා සමිඳු තේවාව තුන් වතාවක් සිදුකර ඇති ඉන්ද්‍රරතන හිමි "දළදා වහන්සේ සහ පූජා විධි", "පසළොස්වක පෝය දිනයන්හි සුවිශේෂ හා වන්දනා ගාථා" මැයින් පොත් දෙකක්ද සංස්කරණය කර ඇති අතර සෑම වසරකම සුභාශී විපසින් නියයිය අය වෙනුවෙන් ශ්‍රී දළදා සමිඳු උදෙසා ආගමික වැඩසටහනක් දෙසැම්බර් මාසයේදී මල්වතු අස්ගිරි මහා විහාර සම්බන්ධතාවයෙන් සිදුකරනු ලබන්නේය.

## ගන්නෝරුව රජමහා විහාර චෛත්‍ය රාජයාණන්ගේ ධාතු නිදානෝත්සවය අප්‍රේල් 3 බක් පෝදා

**මහනුවර** මල්වතු මහා විහාරවංශයේ යටිනුවර, උඩ ප්‍රධාන අධිකරණ සංඝනායක වෙනිකාසික ගන්නෝරුව රජමහා විහාරාධිපති විචිත්‍රභාණී අම්බන්පොල ධර්මරක්ඛිත ශ්‍රී සරණපාල සුමංගල නාහිමි අනුශාසනා පරිදි විහාරස්ථ කාර්යසාධක දායක සභාවේ මූලිකත්වයෙන් ඉදිකරනු ලබන චෛත්‍ය රාජයාණන්ගේ ධාතු නිධානෝත්සවය අප්‍රේල් මස තුන්වැනිදාට යෙදෙන බක් පුර පසළොස්වක පෝය දින උදේ 9 ට සිදුකෙරේ. මෙදින දවස පුරා ආගමික වැඩසටහන් මාලාවක්ද පැවැත්වේ.

## කොත්මලේ සුධර්මා සිල් මෑණියන්ගේ ශාසනික මෙහෙවර අගයා අස්ගිරි විහාර පාර්ශ්වයෙන් "සද්ධා ප්‍රසාදනී ධර්මචාරී" ගෞරව නාමය පිරිනැමේ

**මහනුවර** ශ්‍රී දළදා මාලිගාව ප්‍රධාන කොටගෙන රුවන්වැලි මහ සෑ රදුන්, ශ්‍රී පාදය, කතරගම කිරි වෙහෙර, සෝමාවතිය රජමහ විහාරය, මහියංගන චෛත්‍යය වැනි සිද්ධස්ථාන මුල්කරගෙන අඩසිය වසරකට අධික කාලයක් තිස්සේ මහනුවර කටුකැලේ ලේඩි මිලෙන් ආරාමාධිපතිනී, කොත්මලේ සුධර්මා මෑණියන් විසින් සිදුකරන ලද ශාසනික මෙහෙවර උසස් ලෙස සලකා මෑණියන් වෙත අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිගරු මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මාහිමි, සංඝනායක කාරක මහා සංඝ සභාව විසින් "සද්ධා ප්‍රසාදනී ධර්මචාරී" යන ගෞරව සම්මුතිය පසුගියදා පිරිනමනු ලැබීය.



කොත්මලේ සුධර්මා සිල් මෑණියන් ආගමික කටයුත්තකට සහභාගී වී සිටි අවස්ථාවක්.

අස්ගිරිය මහා විහාරයීය ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී අස්ගිරි පාර්ශ්වයේ අනුනායක, මහියංගන රජමහ විහාරාධිපති ගලගම ශ්‍රී අත්ථදස්සි නාහිමි ප්‍රධානත්වයෙන් පවත්වන ලද සංඝ සභා රැස්වීමේදී සුධර්මා සිල් මෑණියන් වෙත සිය සන්නස් පත්‍රය අස්ගිරි අනුනායක හිමි විසින් පිරිනමා සංඝ සභාවේ ආශිර්වාදය පිරිනමන ලදී.

මෙම අවස්ථාවට විශේෂයෙන් වැඩම කළ අග්ගමහා පණ්ඩිත මල්වතු මහා විහාර සංඝ සභා මහෝපාධ්‍යාය අලුත්ගම ධම්මානන්ද අස්ගිරි කාරක සභා ලේඛකාධිකාරී, ශාස්ත්‍රපති, ආණමඩුවේ ධම්මදස්සි හිමිවරුද, විශ්‍රාමික ග්‍රාමසේවා නිලධාරී උපාලි එදිරිසූරිය මහතාද, පොළොන්නරුව සිල්මාතා සංගමයේ සභාපතිනී සිල් මෑණියන්ද සහා කළහ. සුධර්මා සිල් මෑණියන් සිය ප්‍රණාමානුමෝදනාව සිදුකළ අතර ශ්‍රී සන්නස් පත්‍රය ලේඛකාධිකාරී ආණමඩුවේ ධම්මදස්සි හිමි කියවීමෙන් අනතුරුව සන්නස් පත්‍රය සිහි-පැවිදි සාධුකාර හඬ මධ්‍යයේ මෑණියන් වෙත පිරිනමන ලදී. සිල් මෑණියන් විසින් සංඝ සභාව වෙත ප්‍රසාද පූජාවක්ද පවත්වන ලද අතර සිල් මෑණියන් පිළිගැනීමේ උත්සවයක් දායක සභාව විසින් මාර්තු 29 දා සංවිධානය කර තිබුණි.

කේ. බණ්ඩාරනායක

[illegible]



# පවුලේ ප්‍රීතිය ඇත්තේ ඔබ ළඟමය

ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීමේ මූලධර්ම බුද්ධිමත්ව හා ඥානවන්තව යොදා ගැනීම මගින් ගැහැනියකට සැමියා ඉණිමගේ පහළ රඳවා තබන්නට හේතුවන බාධක ඉවත් කර දිය හැකිය. ස්වකීය හැකියාවන්ගෙන් උපරිම ඵල නෙළා දෙනු පිණිස ඔහුගේ ස්වාභාවික ආවේග හා හැකියාවන් පුබුදුවාලීමටත්, ඔහු වඩා තෘප්තිමත් කිරීමටත් ඇයට හැකියාව තිබේ.

ඕනෑම කෙනෙකුට ජීවිතය සාර්ථක කරගැනීමට නම් ඔහු හෝ ඇයට නිශ්චිත අරමුණක් තිබිය යුතුය යන්න පිළිගත් මූලධර්මයකි. නිශ්චිත අරමුණක් නැති ජීවිතය හරියට හුල කැඩුණු සරුංගලයකට සමාන කළ හැකිය. එවිට සිදුවන්නේ ජීවිතය ඔහේ සුළං ඇති දිශාවට පාවී යාමය. ජීවිතය යනපත් අතට හැරේවා යන අරමුණ එසේ අවිනිශ්චිත ලෙස පාවී යන තම්බූ පැහැදිලි නිශ්චිත අභිලාෂයක් එබඳු පුද්ගලයන් තුළ පිහිටන්නේ නැත.

සැමියාගේ ජීවිතයට සාර්ථක ආරම්භයක් ලබාදීමට බොහෝ බිරින්දෑවරු දන්නේ නැත. එම අනවබෝධය නිසා බොහෝ පවුල් අසාර්ථක වී ඇත. සැමියාගේ ජීවන මග සාර්ථක කර දෙන්නට ඇය බුද්ධිමත් ලෙස සිය සහාය ලබාදීම ඉතා වැදගත්ය. දෙදෙනා තුළ ජීවන මග කෙරෙහි පොදු එල්ලයක් තිබීම ඉතා වැදගත් බව The Marriage පොත ලියූ සැමුවෙල් නම් කතුවරයා විශ්වාස කරයි.

ඔහුගේ අරමුණ කුමක් වුවත් කම් නැත. වඩාත් වැදගත් වන්නේ එකී අරමුණට ඇය හවුල් වීම පමණි. ජීවිතය දිනිය හැක්කේ එකට එක්ව සිහින දකිමින් හා ජය පරාජය එකසේ භාර ගැනීමෙන් යැයි මෙම ලේඛකයා වැඩිදුරටත් සඳහන් කරයි.

සාර්ථකත්වයට පත්වීමේ අධිෂ්ඨානයක්, වෙහෙස මහන්සි වී වැඩ කිරීමේ උනන්දුවක් ඇති ඕනෑම කෙනෙකුට නම් ජීවිතය ජයග්‍රහණය කරා මෙහෙයවිය හැකිය. ඒ සඳහා වෙනත් සම්පත් අවශ්‍ය නොවේ. සාර්ථක දිවි ගමනකට විශාල බාධාවක් ගෙන දෙන්නේ 'කනස්සල්ල' බව කොලොම්බියා විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වන හර්බර්ට් හොක්ස් පවසයි. මෙහිදී සාර්ථකත්වය විවිධ අයට විවිධාකාරයෙන් බලපවත්වන බවද අප වටහා ගත යුතුවේ. සැමියාගේ සැලසුම් හා ක්‍රියාමාර්ග ගැන බිරිඳ තුළ නිසි අවබෝධයක් තිබීමද වැදගත්ය. දෙදෙනාටම එකම ගමන් මාර්ගයක් නිශ්චිත අරමුණක් ඔස්සේ ගමන් කළ හැක්කේ එවිටය.

ජීවිතය සාර්ථක කරගැනීමට ඉවහල් වන තවත් ප්‍රබල සාධකයක් නම් උද්‍යෝගයයි. එය සාර්ථකත්වයේ රහස බව බොහෝ දෙනෙක් හොඳකිති. උද්‍යෝගයෙන් තොරව ශ්‍රේෂ්ඨ කිසිවක් කවරදක හෝ මුදුන් පමුණුවාගෙන නැතැයි යන ප්‍රකාශය කළේ ප්‍රකට බටහිර ලේඛකයකු වන ඉමර්සන්ය.

උද්‍යෝගය යන අරුත දෙන Enthosiasm යන ඉංග්‍රීසි වචනය ග්‍රීක භාෂාවෙන් බිඳී ආවකි. එහි යටි තේරුම දෙවියන් විසින් පොලඹවන ලද යන්නයි. වැඩ කිරීමට ඇති දෛනික උනන්දුව තමන් තුළ නිධන්ගතව පිහිටුවන ලබන්නකි. මේ සඳහා බිරිඳ විසින් කළ යුතුව ඇත්තේ සැමියා තුළ උද්‍යෝගිමත් වීමේ වුවමනාවක් ජනිත කරවීමයි. එය ඔබට පහසුවෙන් කළ හැකි දෙයකි.

අපි බොහෝ දෙනකු ජීවත් වන්නේ අඩක් අවදිව බව කිවමනාය. මෙසේ අඩක් ජීවත් වෙමින් ඔහේ ඒ මේ අත පාවෙන්නේ ඔවුන්ට ජීවිතයේ සැබෑ අරමුණක් නැති බැවිනි. එවැන්නෝ ජීවත් වන්නේ අර්ධ වශයෙනි. උදා වූ අවස්ථාවෙන් ඵල නෙළා ගන්ට සමත් වන්නේ නිශ්චිත අරමුණක් ඇතිව තීක්ෂණ බුද්ධියකින් යුතුව කඩිසරව ක්‍රියාකරන්නෝ පමණි. මෙහිදී තමන් අවධාරණය කළ යුත්තක් නිසා එකම එක් අරමුණක් මුදුන්පත් කරගත් වහා අලුත් අරමුණක් සිත්හි දරා ගැනීම සාර්ථක පුද්ගලයන්ගේ සැබෑ ලක්ෂණයයි. එබැවින් බිරින්දෑවරුන්ට මෙහිදී කිව යුත්තේ එක් අරමුණක් සාක්ෂාත් කරගත් ඔබේ සැමියා තවත් අභිමතාර්ථයක් ඉෂ්ට සිද්ධ කරගන්නට සූදානම් වන වහා සිය සහයෝගය ඔහුට ලබාදිය යුතු බවයි.

බුද්ධිමත්, දයාබර බිරිඳක් නම් මෙහිදී කළ යුත්තේ කුමක්ද? ඔහු තවත් අපහසුවට පත් කිරීමද? නැත. උදේ හෝ මේසයේදී හෝ රාත්‍රී නිදි යහනේදී-ඔබ කළ යුත්තේ සාර්ථකත්වය කරා පිය නැගිය හැකිය යන මතය ඔහුගේ හද ගැබ තුළ රෝපණය කිරීමයි.

"ඔයා ගත් පියවර ඉදිරියට තබන්න. එය ජයගන්නට ඔයාට ශක්තිය තිබෙන බව මයා හොඳකාරට දන්නවා. මගේ මගේ උපරිම සහයෝගය ඔයාට ලබාදෙන්නම්."

සැමියා අලුතින් පටන් ගත් ව්‍යාපාරය ගැන ඔබට මෙබඳු ප්‍රකාශයක් කළ හැකි නම් කොපමණ වටිනවාද? මෙබඳු දිරිය සම්පන්න ප්‍රිය වචනවලින් සැමියා ලබන ආත්ම තෘප්තිය හා දිරිය අති විශාලය. ඔහුගේ කටයුත්ත සාර්ථක කරගන්නට මහඟු ශක්තියක් වනු නියතය. සාර්ථක බිරින්දෑවරු තම සැමියන්ව දකින්නේ ආදරයේ හා විනිවිද දකිමේ ඇස්වලින් බව මෙහිදී අප අමතක නොකළ යුතුය. තම සැමියා කෙරෙහි බිරියක තමා ඇති අචල විශ්වාසය ආදරණීය ලෙස ප්‍රකාශ විය යුතුය. දිරිගැන්වෙන හා ඇගයීමට ලක්වන ප්‍රිය වචන වට යොදා ගැනීම අත්‍යවශ්‍යය. එපමණක් ප්‍රමාණවත් නැත. ඒ වචන තුළ ආදරය හා සෙනෙහස නොමඳව ගැබ්විය යුතුමය. එය වචනවලට සීමා නොකර ක්‍රියාවෙන්ද ඉටුකර පෙන්විය හැකි නම් ඊට වඩා උත්තේජනයක් තවත් නැත. සැමියාගේ සාර්ථකත්වය පිටුපස සිටින දෙවැන්නා පෙවණැල්ල සිය දයාබර බිරිඳය. ඒ බව ඔහුට දනෙන්නට ඉඩ හරින්න.

එබඳු පසුබිමක් ඔබ නිවසේ ඇත්නම් එය සිව්කත වෙසෙන නිවසක් වනු ඇත. බුදු දහමට නැඹුරු ජීවිතයක් ගත කළ හැකි නම් එය සිව්කත තවත් දීප්තිමත්ව බැබළෙනු නියතය.

නිව්ටන් ගුණසේකර



"කෝපයෙන් මත් වූ පැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"



# කුසිනාරාවෙන් හිස් අහසට මුසුවූ බුදුන් වහන්සේගේ අවසන් වදන් කීපය

අප ගෞතම සම්බුදුරජාණන් වහන්සේ කුසිනාරා නුවර මල්ල රජුන්ගේ සල් උයනේදී පිරිනිවන් මංචකයේ වැඩ සිටිද්දී ආනන්ද ස්ථවිරයන් අමතා,

"ආනන්දයෙනි, එවිට ඔබ සමහරවිට කියයි: ශාස්තෘශාසනය අතීතයට ගියේය, බුදුන් වදාළ ධර්මය තිබුණත්, බුදුන් වහන්සේ පිරිනිවන් පෑවා නොවේද. අපේ ගුරු පියාණෝ අප සමඟ දැන් නැත, පිරිනිවන් පා ඇතැයි.

"ආනන්දය, එමෙන් ඔබේ නොසිතිය යුතුය. මා දේශනා කළ යම් දෙයක් වේද එම ධර්මය හා විනය මා ඇතුළත් වීම පසු කාලයන් ශාස්තෘවරයා වන්නේය.

"ආනන්දය, දැන් භික්ෂූන් පරස්පරයෙන් ඇමතීමේදී 'ආවුසෝ' යනුවෙන් කතා කරනවා. මා නොමැති විට (පිරිනිවන් පෑමෙන් පසු) එසේ නොකළ යුතුයි.

"කිසියම් ජ්‍යෙෂ්ඨ භික්ෂුවක් ආනන්දයෙනි, තමාට වඩා කනිෂ්ඨ භික්ෂුවකට උන්වහන්සේගේ පෞද්ගලික නමින් හෝ පවුලේ නාමයෙන් හෝ එසේත් නැතිනම් 'ආවුසෝ' යනුවෙන් ඇමතිය හැකිය. එහෙත් කනිෂ්ඨ භික්ෂූන් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමකට 'භන්තේ' හෝ 'ආයුෂ්මා' යනුවෙන් ඇමතිය යුතුය.

"රුචිනම් සංඝයා මා පිරිනිවන් පෑමෙන් පසු අවශ්‍ය යැයි සිතනවා නම් කුඩා කුඩා විනය නීති අවශ්‍ය නම් වෙනස් කළාට වරදක් නැහැ.

"ඡන්න භික්ෂූන් වහන්සේට මා ඉකුත්ව ගිය පසු දිය හැකි උපරිම දඬුවම දිය යුතුයි. මෙය 'බ්‍රහ්මදණ්ඩනය' යැයි සඳහන් වේ."

එවිට බුදුරජාණන් වහන්සේගෙන් කුමක්ද මේ උපරිම දඬුවම් යැයි ආනන්ද ස්ථවිරයෝ ඇසූහ.

"ඡන්න භික්ෂූන් වහන්සේට කිනම් දෙයක් කියනවා ඇසූ හරින්න. සංඝයා වහන්සේ උන්වහන්සේ (ඡන්න) සමඟ කතාබහ කිරීම, උපදෙස් දීමට යෑම, අනුශාසනා කිරීමට යෑම් නැවැත්විය යුතුයි."

ගෞතම බුදුන් වහන්සේ පළමුව භික්ෂූන් වහන්සේ අමතමින් මෙහි සිටින කිසියම් එක් භික්ෂුවකට හෝ මගේ ධර්මය, සංඝයා, මා විස්තර කරදුන් ගමන් මාර්ගය, ප්‍රායෝගික පුහුණුව යනාදී කිසිවක් කෙරෙහි සැක සංකාවක් මතුවීමට පුළුවනි. එවැනි අයේ මුහුණට මුහුණ බලාගෙන සිටි බුදුන් වහන්සේගෙන් අසා කිසියම් කරුණක් විසඳා ගැනීමට බැරිවුණා. මෙමලෙස සංඝයා වහන්සේ සිතන්නට වූහ. සංඝයා වහන්සේ එලෙස බුදුන් වදාළ කල්හිද නිශ්ශබ්දව සිටියහ. පළමුවැනි වරටත්, දෙවැනි වරටත් බුදුන් වහන්සේ එපරිද්දෙන් භික්ෂූන් වහන්සේගෙන් කරුණු විමසා සිටියහ. තුන්වැනි වරටද විමසුහ. එහෙත් භික්ෂූහු නිශ්ශබ්දව සිටියහ.

නැවතත් සංඝයා වහන්සේ අමතන අප බුදුන් වහන්සේ ගුරු ගෞරවය හේතුකොට භික්ෂූන් මගෙන් ප්‍රශ්න නොවිචාරන බව පෙනේ. එසේ නම් එවැනි සැක සංකා දෙයක් වේ නම් එය තමා ලඟම සිටින මිතු භික්ෂූන් වහන්සේට පැවැසිය යුතුය. මෙලෙස වදාරද්දී භික්ෂූන් වහන්සේලා නිශ්ශබ්දව සිටියහ.

විලගට ආනන්ද ස්ථවිරයන් වහන්සේ බුදුන් වහන්සේ අමතමින්, "එය මහා පුදුමයක්, ආශ්චර්යයක්... ස්වාමීනි, මෙහි සිටින කිසිම භික්ෂූන් වහන්සේ නමකට භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ගැන කිසිම සැකයක්, සංකාවක් තිබියේම නැහැ. බුදුන් වහන්සේ ගැනවත්, ධර්මය ගැනවත් භික්ෂූන්ට කිසිම සැකයක් නැහැ ස්වාමීනි."

"ආනන්දයෙනි, ඔබ බොහොම භක්තියෙන්ම මා සමඟ කතා කරන බව පෙනෙනවා. මේ භික්ෂූන් අතර කිසිම කෙනෙකුට මා දෙසූ දහම ගැන, සංඝයා ගැන, යා යුතු ගමන් මාර්ගය ගැන, ප්‍රායෝගික පුහුණුව ගැන කිසිම සැකයක් නොමැති බව මා දන්නවා. මෙහි රැස්ව සිටින පන්සියයකට ආසන්න භික්ෂූන් අතර පහළ පන්තියේ වැජඹෙන භික්ෂුවකට වුවද තමා සිටින තත්ත්වයෙන් පහළට යෑමට සිදුවන්නේ නැහැ. උන්වහන්සේටද විමුක්ති මාර්ගය උදාවෙනවා."

ගෞතම බුදුන් වහන්සේ විලගට පිරිනිවන් මංචකයේ සිටම භික්ෂූන් වහන්සේ අමතමින්, "භික්ෂූණි, මා දැන් පවසන දෙය අසන්න. සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යයි. ඔබ ඔබේම විමුක්ති මාර්ගය උත්සාහයෙන්, උනන්දුවෙන් සලසා ගන්න." මේ අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ අවසාන වචන කීපයයි. ආනන්ද ස්ථවිරයෝ රහත් බව ලබා නොසිටියෙන් එවිට මහත් සේ කම්පාවට පත්ව හඬන්නට වූහ.

(දීඝ නිකායෙහි එන මහා පරිනිබ්බාන සූත්‍රය ඇසුරිනි.)

**පූජ්‍ය යටමිලගල සුමනසාර හිමි - කැලණිය**